# සිංහල

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## මූලික පිරිවෙණ

## 2 ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය
සිංහල
ගුරු මාර්ගෝපදේශය

සිංහල - 2 ශ්‍රේණිය, මූලික පිරිවෙණ
ගුරු මාර්ගෝපදේශය
2019/S/02/පිරි/TG/5-2/1700

ISBN 978-955-25-0494-5
P01
2010393
TG PIRI: SINHALA - GR 2
Rs. 175.00

# සිංහල

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

**2 ශ්‍රේණිය**

**(2019 සිට ක්‍රියාත්මක වේ)**


**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකාව**

**පිරිවෙන් අධ්‍යාපන ඒකකය**
**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

**වෙබ් අඩවිය :** www.nie.lk
**විද්‍යුත් ලිපිනය :** info@nie.lk

**වෙබ් අඩවිය :** www.pirivena.sch.lk
**විද්‍යුත් ලිපිනය :** pirivenaemoe.gov.lk



මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිංහල
මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය
2 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2020

© ජාතික අධ්‍යාපන ආයතනය
© පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0494-5

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivenasch.lk
විද්‍යුත් ලිපිනය : pirivenaemoe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සාමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

මුද්‍රණය: එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

# අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්ප හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේද අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු  කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගෙන වඩාත් උචිත ක්‍රමශිල්ප යොදා ගනිමින් ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එන්. එච්. එම්. චිත්‍රානන්ද**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටු වන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තූතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහයකි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තත් ක්‍රියාකාරකම් පදනම් කරගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තූතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලයෙහි ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍යපරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ සහ ගිහි ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක වන විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ශ්‍රී ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධයාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබුණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමාත්‍යතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදුතාව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පංති කාමරයෙහි අවධිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පංති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මක ව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.


**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඤාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඤාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඤාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදු කරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරයෙහි වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවෙණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය |
| | විජිත වෙලගෙදර, අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **අධීක්ෂණය** | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය |
| | එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම, අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය |
| | පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | මංගල ගුණරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| | රුවනි සිසිජා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය විශේෂඥ උපදේශනය** | මහාචාර්ය නිමල් මල්ලවආරච්චි, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය |
| **ලේඛක මණ්ඩලය** | පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය |
| | මංගල ගුණරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| | රුවනි සිසිජා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| | පූජ්‍ය තුඹේ උපනන්ද හිමි, දිස්ත්‍රික් ගුරු උපදේශක, ගා/ශ්‍රී විද්‍යාරාජ මහ පිරිවෙණ, ගල්වඩුගොඩ, ගාල්ල |

| | |
|---|---|
| | එච්. එම්. ඩී. බී, හෙල්අරාවේ, දිස්ත්‍රික් ගුරු උපදේශක<br>නු/ ශ්‍රී ධර්මෝදය මහ පිරිවෙණ, මාදන්වල, හඟුරන්කෙත<br>නිශ්ශංක බණ්ඩාර, ගුරු සේවය 1, බප/ගම්/දොම්පේ මහා විද්‍යාලය, දොම්පේ |
| **භාෂා සංස්කරණය** | පූජ්‍ය මීගල්ලේ මහින්දසිරි හිමි, කෘත්‍යාධිකාරී, සුගිලෝදය පිරිවෙණ, කඳුබොඩ, දෙල්ගොඩ. |
| සෝදුපත් බැලීම | යූ. කේ. රත්නායක, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) |
| **පරිගණක වදන්** | මොනිකා විජේකෝන්, කළමනාකරණ සහකාර I,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **පිටකවර නිර්මාණය** | ජේ. එම්. තරිඳු හසංග, (සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ), පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය. |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මූලික පිරිවෙන් විෂයමාලාවේ සිංහල විෂයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කර ගැනීමට මග පෙන්වීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සකස් කර තිබූ සිංහල විෂය නිර්දේශය හා පෙළපොත මේ සඳහා පදනමක් ලෙස යොදා ගැනිණි. විෂය නිර්දේශයේ ඇතුළත් වූ නිපුණතා හා නිපුණතා මට්ටම් දැඩි වෙනසකට ලක් නොකොට ගුරු මාර්ගෝපදේශය සඳහා ක්‍රියාකාරකම් සකස් කෙරිණි. නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් පල අලුතින් සකස් කිරීමට සිදු විය. මෙහි දැක්වෙන ක්‍රියාකාකරම්වලින් මූලික පිරිවෙන් පන්තිවලට ඉගැන්වීම් සඳහා පාඩම් සැලසුම් සකස් කර ගැනීමට උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව සිංහල විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී ව සිදු කර ගැනීම සඳහා එම උපදෙස් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මීට පෙර පිරිවෙන් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ නො තිබූ අතර පිරිවෙන් ගුරුවරු තම අභිමතය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කළහ. එසේ වූ විට එක් එක් පිරිවෙන්වල විෂය ඉගැන්වීම එකිනෙකින් වෙනස් වීමත්, සාමාන ඉගෙනුම් අවස්ථා ශිෂ්‍යයන්ට නොලැබීයාමත් අනිවාර්යයෙන් ම සිදු වේ. එය විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට මෙන් ම විධිමත් ඇගයීම් ක්‍රියාවලියට ද බාධාකාරී තත්ත්වයකි. එනිසා පිරිවෙන් විෂයමාලාවට ගුරු මාර්ගෝපදේශ සකස් කර දීමෙන් මෙකී තත්ත්වය අවම කිරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පිරිවෙන්වල මෙතෙක් පැවති සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද වෙනස් කිරීමට මෙමගින් උපදෙස් දෙනු නොලැබේ. පැරණි දේ සුරකිමින් නව ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කිරීම බලාපොරොත්තු වේ. ඒ සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා කණ්ඩායම් ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම ආදී උපදෙස් මෙමගින් ලබා දී ඇත.

විධිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ගැනීමට එක් එක් නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සන්තතියක් මෙහි ඇතුළත් වේ. එක් නිපුණතාවක් ඉටුකර ගැනීම සඳහා නිපුණතා මට්ටම් දෙකක් හෝ කිහිපයක් විෂය නිර්දේශයෙහි දක්වා ඇත. එම ක්‍රියාකාරකම් සකස් කර ඇත්තේ එහි සඳහන් ඉගෙනුම් පල ඉටු කර ගැනීමට හැකි වන පරිදි ය. ඔබ පාඩම් සැලසුම් සකස් කිරීමේ දී එම ඉගෙනුම් පලවලින් සුවිශේෂ ඉගෙනුම් පල කාලච්ඡේදයට හා ශිෂ්‍ය පිරිසට ගැළපෙන පරිදි සකස් කර ගත යුතු ය. ඔබ විසින් සකස් කර ගත් ඉගෙනුම් පල ඉටුවන පරිදි පියවර කිහිපයකින් යුත් පාඩම් සැලසුමක් මේ අනුව සකස් කර ගත යුතු ය. ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඔබ සතු නිර්මාණශීලීත්වයට එමගින් ඉඩ සලසා ඇත.

ඉගෙනුම් පල මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම අවධාරණය කෙරේ. ඒ සඳහා නිර්ණායක ද මෙහි දක්වා ඇත. ඔබ සකස් කරන ඉගෙනුම් පල මැනීම සඳහා ද ගැළපෙන නිර්ණායක සකස් කර ගත යුතු වේ. සෑම ඉගෙනුම් අවස්ථාවක් ම **ඉගෙනුම් පල, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා ඉගෙනුම් පල ඇගයීමේ නිර්ණායක** යන සංරචක තුනකින් සමන්විත වේ. ඔබේ පාඩම් සැලසුම් ද එම සංරචක තුනෙන් යුක්ත වීම අනිවාර්ය වන අතර එම සංරචක තුනේ අන්‍යෝන්‍ය සම්බන්ධය තිබීම ද අත්‍යවශ්‍ය වේ. විෂය කරුණු පහදා දීම පමණක් ප්‍රමාණවත් නැත. ඉගෙනුම මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් තිබීම ද ඒ සඳහා නිර්ණායක තිබීම ද අත්‍යවශ්‍ය වේ.

ඉගෙනුම් පල, ක්‍රියාකාරකම් හා තක්සේරුකරණ නිර්ණායක යන සංරචක තුනට අනුව ඔබේ නිර්මාණශීලී ඉගැන්වීම් රටාව සංවිධානය කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට අත්වැලක් වනු ඇත. එය මැනවින් භාවිත කර ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යන්න අපගේ ප්‍රාර්ථනය යි.

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
2019.03.28

**පටුන**


පිටු අංක

| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | iv |
| පෙරවදන | v |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vi |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | vii |
| ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | viii-ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | x |
| 2 ශ්‍රේණිය වාර නියමය | xii-xiv |
| ජාතික අරමුණු | xv |
| මූලික නිපුණතා | xvi-xvii |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xviii |
| 2 ශ්‍රේණිය විෂය නිර්දේශය | xix-xxxviii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xxxlx |

| | | |
|---|---|---|
| 1. | අක්ෂර මාලාව | 01 |
| 2. | අල්පප්‍රාණ, මහාප්‍රාණ, රේඵය, රකාරාංශය සහ යංශය | 05 |
| 3. | අකාරාදි පිළිවෙළ | 09 |
| 4. | නාම පද | 12 |
| 5. | නාම විභක්ති | 15 |
| 6. | නිපාත | 17 |
| 7. | උපසර්ග | 19 |
| 8. | ආඛ්‍යාත | 21 |
| 9. | නෛපාතික කෘදන්ත | 24 |
| 10. | විවිධාර්ථවත් පද | 27 |
| 11. | වාක්‍ය නිර්මාණය | 29 |
| 12. | රචනය | 33 |
| 13. | සාරාංශකරණය | 36 |
| 14. | ප්‍රායෝගික ලේඛන | 41 |
| 15. | නිශ්ශබ්ද කියවීම | 44 |
| 16. | විවිධ ශෛලි අනුව කියවීම | 47 |
| 17. | විරාම ලක්ෂණ | 50 |
| 18. | කාරක | 55 |
| 19. | ශබ්ද නඟා කියවීම | 58 |
| 20. | වණපොත් කිරීම | 62 |
| 21. | රසවින්දනය | 64 |
| 22. | පද්‍ය නිර්මාණය | 68 |
| 23. | නිර්මාණාත්මක කතා රචනය | 70 |
| 24. | නිර්මාණවලට සවන්දීම | 73 |
| 25. | ආචාරශීලී ව සවන්දීම | 75 |
| 26. | විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම | 77 |
| 27. | කථනය | 79 |
| 28. | දේශාභිමානී කලා නිර්මාණ පරිශීලනය | 81 |

# සිංහල 2 ශ්‍රේණිය
# වාර නියමය

| | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය, පෙළ පොත සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා මාර්ගෝපදේශය | | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | | | | පෙළ පොතේ පාඩම සහ නිර්දිෂ්ට ග්‍රන්ථවල අදාළ කොටස් | පෙළ පොතේ පාඩම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා ක්‍රියාකාරකම් | |
| 01 වාරය | 01 | 01 | 1.1 | අක්ෂර මාලාව | 01, 02, 03, 04, 05 | 05 |
| | | 02 | 1.2 | අල්පප්‍රාණ, මහාප්‍රාණ, රේඵය, රකාරාංශය සහ යංශය | 06, 08 | 04 |
| | | 03 | 1.3 | අකාරාදි පිළිවෙළ | 07 | 02 |
| | 02 | 04 | 2.1 | නාම පද | 2.1, 2.2 | 05 |
| | | 05 | 2.3 | නාම විභක්ති | 2.3, 2.4 | 05 |
| | 03 | 06 | 2.4 | නිපාත | 3.1 | 05 |
| | 04 | 07 | 2.4 | උපසර්ග | 4.1 | 05 |
| | 05 | 08 | 2.2 | ආඛ්‍යාත | 5.1, 5.2, 5.3, 5.4 | 05 |
| | සුභාෂිතය | 19 | 6.1<br>10.3 | (1-10) සුභාෂිතය කවි<br>ශබ්ද නඟා කියවීම | විවිධ විරිත් අනුව ගායනය/වණපොත් කිරීම | 02<br>01 |
| | ගණදෙවි හැල්ල සහ වදන් කවි පොත | 20 | 7.1 | ගණදෙවි හැල්ල මුල සිට අවසානයට (1 සිට 49 දක්වා) | විවිධ විරිත් අනුව ගායනය/වණපොත් කිරීම | 06 |
| | අඹ යහළුවෝ | 21 | 8.1 | අඹ යහළුවෝ (1-16 පරිච්ඡේද) | නිශ්ශබ්ද ව කියවීම<br>රසවින්දනය හා විචාරය | 04 |
| | විෂය සමගාමී | 22 | 9.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>පද්‍ය නිර්මාණය | පද්‍ය නිර්මාණය | 02 |
| | විෂය සමගාමී | 23 | 9.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>නිර්මාණාත්මක කතා රචනය | කතා රචනා කිරීම | 02 |
| | විෂය සමගාමී | 24 | 10.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | නිර්මාණවලට සවන් දීම | 03 |
| | විෂය සමගාමී | 25 | 10.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | ආචාරශීලී ව සවන් දීම | 01 |
| | විෂය සමගාමී | 26 | 10.4<br>10.5<br>10.6 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>,, ,, ,,<br>,, ,, ,, | විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්<br>,, ,, ,,<br>,, ,, ,, | 01<br>01<br>01 |
| | විෂය සමගාමී | 27 | 11.1<br>11.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | කථනය | 02<br>01 |
| | විෂය සමගාමී | 28 | 12.1<br>12.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | දේශාභිමානී නිර්මාණ පරිශීලනය | 03<br>02 |
| | එකතුව | | | | | 68 |

# සිංහල 2 ශ්‍රේණිය
## වාර නියමය

| | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය, පෙළ පොත සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා මාර්ගෝපදේශය | | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | | | | පෙළ පොතේ පාඩම සහ නිර්දිෂ්ට ග්‍රන්ථවල අදාළ කොටස් | පෙළ පොතේ පාඩම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා ක්‍රියාකාරකම් | |
| 02 වාරය | 06 | 09 | 2.5 | නෛපාතික කෘදන්ත | 6.1, 6.2 | 05 |
| | 07 | 10 | 3.1 | විවිධාර්ථවත් පද | 7.1, 7.2, 7.3 | 03 |
| | 08 | 11 | 4.1 | වාක්‍ය නිර්මාණය | 8.1, 8.2, 8.3 | 03 |
| | 09 | 12 | 4.2 | රචනය | 9.1, 9.2 | 03 |
| | 10 | 13 | 4.3<br>6.4 | සාරාංශකරණය | 10.1, 10.2 | 05<br>05 |
| | සුභාෂිතය | 19 | 6.1<br>10.3 | (11-25) සුභාෂිතය කවි | විවිධ විරිත් අනුව ගායනය/වණපොත් කිරීම | 02<br>01 |
| | ගණදෙවි හැල්ල සහ වදන් කවි පොත | 20 | 7.1 | වදන් කවි පොත (1-40) කවි | විවිධ විරිත් අනුව ගායනය/වණපොත් කිරීම | 06 |
| | අඹ යහළුවෝ | 21 | 8.1 | අඹ යහළුවෝ (17-32 පරිච්ඡේදය) | නිශ්ශබ්ද ව කියවීම රසවින්දනය හා විචාරය | 04 |
| | විෂය සමගාමී | 22 | 9.1 | විෂය සාමගාමී ක්‍රියාකාරකම් පද්‍ය නිර්මාණය | පද්‍ය නිර්මාණය | 02 |
| | විෂය සමගාමී | 23 | 9.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් නිර්මාණාත්මක කතා රචනය | කතා රචනා කිරීම | 02 |
| | විෂය සමගාමී | 24 | 10.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | නිර්මාණවලට සවන් දීම | 02 |
| | විෂය සමගාමී | 25 | 10.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | ආචාරශීලී ව සවන් දීම | 01 |
| | විෂය සමගාමී | 26 | 10.4<br>10.5<br>10.6 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>,, ,, ,,<br>,, ,, ,, | විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්<br>,, ,, ,,<br>,, ,, ,, | 01<br>01<br>01 |
| | විෂය සමගාමී | 27 | 11.1<br>11.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | කථනය | 02<br>01 |
| | විෂය සමගාමී | 28 | 12.1<br>12.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | දේශාභිමානී නිර්මාණ පරිශීලනය | 03<br>02 |
| | එකතුව | | | | | 55 |

# සිංහල 2 ශ්‍රේණිය
## වාර නියමය

| වාරය | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය, පෙළ පොත සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා මාර්ගෝපදේශය — පෙළ පොතේ පාඩම සහ නිර්දිෂ්ට ග්‍රන්ථවල අදාළ කොටස් | පෙළ පොතේ පාඩම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා ක්‍රියාකාරකම් | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| 03 වාරය | 11 | 14 | 5.1 | ප්‍රායෝගික ලේඛන | 11.1, 11.2 | 06 |
| | 12 | 15 | 6.2<br>6.5 | අර්ථාවබෝධය සඳහා<br>නිශ්ශබ්ද ව කියවීම | 12.1, 12.2 | 05<br>04 |
| | 12 | 16 | 6.3 | (විවිධ ශෛලී අනුව කියවීම)<br>අර්ථාවබෝධය | 12.1 | 03 |
| | 13 | 17 | 4.2 | විරාම ලක්ෂණ | 13.1, 13.2, 13.3 | 06 |
| | 14 | 18 | 2.6 | කාරක | 01, 02 | 05 |
| | සුභාෂිතය | 19 | 6.1<br>10.3 | සුභාෂිතය (26-40 කවි)<br>ශබ්ද නගා කියවීම | විවිධ විරිත් අනුව<br>ගායනය/වණපොත් කිරීම | 02<br>01 |
| | ගණදෙවි හැල්ල සහ වදන් කවි පොත | 20 | 7.1 | වදන් කවි පොත (41-74 කවි)<br>වණපොත් කිරීම | විවිධ විරිත් අනුව<br>ගායනය/වණපොත් කිරීම | 06 |
| | අඹ යහළුවෝ | 21 | 8.1 | අඹ යහළුවෝ (33-50 පරිච්ඡේද)<br>රසවින්දනය | නිශ්ශබ්ද ව කියවීම<br>රසවින්දනය හා විචාරය | 04 |
| | විෂය සමගාමී | 22 | 9.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>පද්‍ය නිර්මාණය | පද්‍ය නිර්මාණය | 02 |
| | විෂය සමගාමී | 23 | 9.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>නිර්මාණාත්මක කතා රචනය | කතා රචනා කිරීම | 02 |
| | විෂය සමගාමී | 24 | 10.1 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | නිර්මාණවලට සවන් දීම | 02 |
| | විෂය සමගාමී | 25 | 10.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | ආචාරශීලී ව සවන් දීම | 01 |
| | විෂය සමගාමී | 26 | 10.4<br>10.5<br>10.6 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>,, ,, ,,<br>,, ,, ,, | විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්<br>,, ,, ,,<br>,, ,, ,, | 01<br>01<br>01 |
| | විෂය සමගාමී | 27 | 11.1<br>11.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම්<br>,, ,, ,, | කථනය<br>,, ,, ,, | 02<br>01 |
| | විෂය සමගාමී | 28 | 12.1<br>12.2 | විෂය සමගාමී ක්‍රියාකාරකම් | දේශාභිමානී නිර්මාණ<br>පරිශීලනය | 03<br>02 |
| | එකතුව | | | | | 60 |

# ජාතික අරමුණු

සාමාන්‍ය අධ්‍යාපනය අත්‍යවශ්‍යයෙන් ම පහත දී ඇති ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමට යොමු විය යුතුයි.

i. ජාතික ඒකාබද්ධතාව, ජාතික ඒකාග්‍රතාව සහ ජාතික සමගිය මුදුන් පත් කර ගැනීම.

ii. සමාජ සාධාරණත්වයේ පැතිරෙන රටාව තහවුරු කිරීම.

iii. තිරසාර ජීවන රටාවක පරිණාමය . මානව වර්ගයාගේ ඉතිහාසයේ ප්‍රථම වතාවට වාතය සහ ජලය පවා එසේම යැයි පිළිගත නොහැකි විටක වසර 2000 සහ ඉන් ඔබ්බට අවශ්‍ය වන තිරසාර ජීවන ශෛලියක්.

iv. රැකියා අවස්ථා උත්පාදනය . ඒ සමග ම ඒවා අභිමානවත්, අපේක්ෂා සපුරාලන, ස්වාර්ථ සාධන වීම.

v. ඉහත සැකිල්ල තුළ ජාතිය උදෙසා සිදු කෙරෙන වර්ධනය පිළිබඳ සමුච්චිත ව්‍යුහය වෙත යොමු වන මානව සම්පත් සංවර්ධනයේ දී සැමට ම සහභාගී වීම සඳහා විවිධ හැකියාවන් ස්ථාපිත කිරීම.

vi. එකිනෙකා වෙනුවෙන් දැඩි සහ නොවෙනස් සැලකිල්ල පිළිබඳ අඛණ්ඩ හැඟීමක් ඇති කර ආරක්ෂා කිරීම ජාතිය ගොඩනැගීමේ කටයුතුවල සක්‍රිය සහභාගීත්ව තහවුරු කළ යුතු වේ.

vii. මෙකල අප ජීවත් වන වේගයෙන් වෙනස් වන ආකාරයේ ලෝකයක් තුළ වෙනස් වීමට අනුවර්තන හැකියාව ඇති මූලික දේවල් වැඩිදියුණු කර සකස් කර ගැනීම අත්‍යවශ්‍යවේ. . වෙනස් වන අවස්ථාවන්ට අනුවර්තනය වීමට ඉගෙනීම . මෙය තමාගේ සහ අන් අයගේ අභිවෘද්ධිය සඳහා වෙනස් වීම මෙහෙය වීමට නිපුණතා සමග සම්බන්ධ කළ යුතුය.

viii. ආරක්ෂාව සහ ස්ථාවරත්වය පිළිබඳ හැඟීමක් ඇති කර ගනිමින් සංකීර්ණ සහ අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමට ඇති හැකියාව වැඩිදියුණු කර ගැනීම.

ix. ජාත්‍යන්තර ප්‍රජාව තුළ ගෞරවනීය ස්ථානයක් අත්පත් කර ගැනීමට සම්බන්ධ වන්නා වූ නිපුණතාවන් වර්ධනය කර ගැනීම.

**(ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා යෝජනා - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2016)**

# මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම: භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

. නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය.

. කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා

. ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

. චිත්තවේගී බුද්ධිය

iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය . ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව.

iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ.
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මළල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

vii. ''ඉගෙනීමට ඉගෙනුම්'' පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම.

02. සිංහල භාෂාවේ ව්‍යාකරණය සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

03. භාෂාවේ වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ වටහා ගැනීම.

04. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථ ග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම.

05. අවබෝධය, විශ්ලේෂණය, සංස්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.

06. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලී හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම.

07. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

08. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීමෙන් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.

09. විශ්වවිශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක ව පරිශීලනයට යොමු කිරීම.

10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම.

11 සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

12. සන්නිවේදන කාර්යය පහසු කරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරිම.

# 2 ශ්‍රේණිය
# විෂය නිර්දේශය

## ක්‍රියාකාරකම 1
## අක්ෂර මාලාව

**නිපුණතාව** : 1.0 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 අක්ෂර මාලාව නිවැරදි ලෙස උච්චාරණය කරයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල** :
- අක්ෂර මාලාව නිවැරදි ව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ශබ්දය නිවැරදි ව හඳුනා ගෙන අක්ෂර උච්චාරණය කරයි.
- නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි.
- සාම්ප්‍රදායික හා නූතන අක්ෂර මාලාව හඳුනා ගෙන වෙනස්කම් ඉදිරිපත් කරයි.
- අක්ෂර මාලාවේ ප්‍රභේද හඳුනා ගෙන වර්ගීකරණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

**පෙර සූදානම**

- පහත සඳහන් විෂය අන්තර්ගතය මැනවින් අධ්‍යයනය කරන්න. කාලච්ඡේද 4කට ගැළපෙන ලෙස පාඩම් සැලසුම් සකස් කර ගන්න. (පෙළපොතේ අංක 01 අක්ෂර මාලාව පාඩම මේ සඳහා යොදා ගන්න.)

  1 කාලච්ඡේදය - සාම්ප්‍රදායික අක්ෂර මාලාව
  2 කාලච්ඡේදය - නූතන සිංහල අක්ෂර මාලාව
  3 කාලච්ඡේදය - ස්වර (හ්‍රස්ව, දීර්ඝ)
  4 කාලච්ඡේදය - ව්‍යංජන (වර්ගාක්ෂර, වර්ගාන්ත, අල්පප්‍රාණ, මහාප්‍රාණ)

- සුදුසු ඉගෙනුම් ආධාරක සකස් කර ගන්න.

  උදාහරණ : - * සාම්ප්‍රදායික හා නූතන අක්ෂර මාලා ඇතුළත් ප්‍රදර්ශක දෙකක්
  - * ස්වර වර්ගීකරණය සහ ව්‍යංජන වර්ගීකරණය ඇතුළත් ප්‍රදර්ශක 2ක්
  - * පැවරුම් පත්‍රිකා (ඇමුණුම 2)

**ප්‍රවේශය**

- පහත සඳහන් ප්‍රවේශ හෝ වෙනත් සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට ප්‍රවේශ වන්න.

  උදාහරණ : - * වදන් කව් පොතේ තෝරා ගත් පද්‍ය ගායනා කිරීම (ඇමුණුම 1)
  - * අක්ෂර මාලාව පිළිබඳ පෙර මතකය විමසීම

**පාඩම සංවර්ධනය**

- සාම්ප්‍රදායික හා නූතන අක්ෂර මාලා ඇතුළත් (කලින් සකස් කර ගත්) ප්‍රදර්ශකයක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඒ අක්ෂර මාලාවට අයත් අකුරු වෙන වෙන ම නිවැරදි ව හඳුනා ගෙන උච්චාරණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

- මෙම අක්ෂර මාලා දෙකෙහි සමාන අසමානතා පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- නූතන අක්ෂර මාලාවේ ස්වර සහ ව්‍යංජන වශයෙන් ප්‍රභේද දෙකක් පවතින බව පැහැදිලි කරන්න.
- ඒ සඳහා කලින් සකස් කර ගත් ප්‍රදර්ශක ඉවහල් කර ගන්න.
- ස්වර ප්‍රභේද උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
- ව්‍යංජන ප්‍රභේද පැහැදිලි කරමින් ඒ සඳහා උදාහරණ ලබා දෙන්න.
- (අ)ං, (අ)ඃ අක්ෂර සාම්ප්‍රදායික හා නූතන අක්ෂර මාලාවේ යෙදෙන ස්ථාන හේතු දක්වමින් පැහැදිලි කරන්න.
- ඇමුණුම 1හි සඳහන් වදන් කවි පොතේ නියමිත පද්‍ය වණපොත් කර නිවැරදි උච්චාරණයෙන් යුතු ව ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් මතකයෙන් පැවසීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- සාම්ප්‍රදායික සිංහල අක්ෂර මාලාව සහ නූතන සිංහල අක්ෂර මාලාව නිවැරදි අනුපිළිවෙළින් ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පෙළ පොතෙහි සඳහන් අභ්‍යාස නිම කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පාඩම ඇසුරෙන් සකස් කර ගත් ඇමුණුම 2හි සඳහන් කෙටි ප්‍රශ්න ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- ලබා දී ඇති නිර්ණායක කෙරෙහි අවධානය යොමු කරමින් ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- **ස්වර**

  ''තමා ම හැඬවිය හැකි අකුරු ස්වරයි. සිංහල අක්ෂර මාලාවේ 'අ' කාරයේ සිට 'ඖ' කාරය දක්වා ඇති අකුරු 18 ස්වරයි''

  පෙරේරා, පී. රූපසිංහ, පද්මා ලංකා රූපසිංහ, සිංහල ව්‍යාකරණ අකාරාදිය 2000, 419 පි.

- **ව්‍යංජන**

  ස්වරයකට පූර්වයෙන් සිට හෝ ස්වරයකට පසුව සිට හෝ ස්වරයක උපකාරයෙන් උච්චාරණය වන තනි ව උච්චාරණය කළ නොහැකි හෙයින් ප්‍රවෘත්ති ශක්තියෙන් තොර අක්ෂර ව්‍යාඤ්ජනාක්ෂර නම්; ප්‍රාණය වැනි අක්ෂරයේ (ස්වරයේ) ශරීරය වැනිනුයි ගාත්‍රාක්ෂර (ගතකුරු) යනු ද කියති.

  (එම 368, 369 පිටු)

- ***අල්පප්‍රාණ***

  එක් එක් වර්ගයට අයත් වර්ග අක්ෂරවල පළමු වන අකුරු පහ හා තුන් වන අකුරු පහ අල්ප ප්‍රාණාක්ෂර නම්

  ක, ච, ට,ත, ප

  ග, ජ, ඩ, ද, බ යන අකුරුයි

  (එම 120 පිටුව)

- **මහාප්‍රාණ**

  වර්ග අක්ෂරවල දෙවැනි හතර වැනි අකුරු වන ඛ, ඡ, ඨ, ථ, ඵ, ඝ, ඣ, ඪ, ධ, භ යන අකුරු මහාප්‍රාණාක්ෂරයි. ඛ, ඡ, ඨ, ථ, ඵ යනු අඝෝෂ මහාප්‍රාණාක්ෂරයි. ඝ, ඣ, ඪ, ධ, භ යනු ඝෝෂ මහාප්‍රාණාක්ෂරයි. අල්පප්‍රාණාක්ෂරවලට ඌෂ්ම මිශ්‍රවීමෙන් මහාප්‍රාණ අක්ෂර තැනී ඇති බව ශබ්ද ධර්මයට අනුව ප්‍රකට වේ.

  ක් - හ් - ඛ් (එම 327, 328 පිටු)
- වර්ගාන්තාක්ෂර/අනුනාසික

  වර්ගවල අන්ත අකුරු වර්ගාන්ත අකුරුයි. ඞ, ඤ, ණ, න, ම යන අකුරුයි.
- සඤ්ඤකාක්ෂර - ඟ ඦ ඬ ඳ ඹ
- අන්තඃස්ථාක්ෂර - ය ර ල ව ළ
- ඌෂ්මාක්ෂර - ශ ෂ ස හ ෆ

  තීක්ෂණ ප්‍රශ්වාසයන් නිකුත් කෙරෙමින් උච්චාරණය කරන අකුරු ඌෂ්ම අක්ෂරයි. (එම 182 පිටුව)

**ගුණාත්මක යෙදවුම් :**

- අක්ෂර මාලා සටහන් කරන ලද ප්‍රදර්ශක දෙක
- වදන් කවි පොතේ තෝරා ගත් කවි (ඇමුණුම 1)
- සකසා ගත් ප්‍රශ්නාවලිය (ඇමුණුම 2)
- පෙළ පොතේ පාඩම (01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නූතන සිංහල අක්ෂර මාලාව නිවැරදි ව හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- අක්ෂරවල නිවැරදි ශබ්දය හඳුනා ගෙන උච්චාරණය කිරීම
- සාම්ප්‍රදායික හා නූතන අක්ෂර මාලා හඳුනා ගැනීම
- අක්ෂර මාලාවේ ප්‍රභේද හඳුනා ගෙන වර්ගීකරණය කිරීම
- නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ප්‍රකාශ කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල අක්ෂර ලිවීමේ මාර්ගෝපදේශය - ජාතික අධ්‍යාපන කොමිසම
- සිංහල හෝඩිය - බසක මහිම 1 - ජේ. බී. දිසානායක
- සිදත් සඟරා විමසුම - ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි
- සිංහල ව්‍යාකරණ අකාරදිය - පී. රූපසිංහ පෙරේරා, පද්මා ලංකා රූපසිංහ
- ව්‍යාකරණ විවරණය - කුමාරතුංග මුණිදාස

-

**ඇමුණුම් :**

ඇමුණුම 1

'අ' වන පටන් 'අඃ' වන්නට     වදනින්
දූනෙන සොළස සොරකුරු පෙළ  වදනින්
කයන එ පස් වග යානව     වදනින්
මෙ වන සූතිස් දනු හසකුරු    වදනින්

- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, - වදන් කවි පොත, 2001, 13 වන කවිය

ඇමුණුම 2 - කෙටි ප්‍රශ්න මාලාව

සාම්ප්‍රදායික අක්ෂර මාලාව

- * සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ අක්ෂර ගණන කීය ද?
- * සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ ස්වර අක්ෂර ගණන කීය ද?
- * සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ ව්‍යංජන අක්ෂර ගණන කීය ද?

නූතන සිංහල අක්ෂර මාලාව

- * නූතන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන කීය ද?
- * නූතන සිංහල අක්ෂර මාලාවේ ප්‍රධාන අක්ෂර ප්‍රභේද දෙක නම් කරන්න.
- * නූතන සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර ගණන කීය ද?
- * නූතන සිංහල අක්ෂර මාලාවේ ව්‍යංජනාක්ෂර ගණන කීය ද?

ස්වර

- * ස්වර ඒ නමින් හඳුන්වන්නේ ඇයි?
- * ස්වරවල ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.
- * එම ප්‍රභේදවලට අයත් අක්ෂර වෙන වෙන ම ලියන්න.

ව්‍යංජන

- * ව්‍යංජනාක්ෂර එනමින් හඳුන්වන්නේ ඇයි?
- * වර්ගාක්ෂර ලියන්න.
- * අල්පප්‍රාණාක්ෂර ලියන්න.
- * මහාප්‍රාණාක්ෂර ලියන්න.
- * සඤ්ඤකාක්ෂර ලියන්න.
- * ඌෂ්මාක්ෂර ලියන්න.

## ක්‍රියාකාරකම 2
## අල්පප්‍රාණ, මහාප්‍රාණ
## රේඵය, රකාරාංශය සහ යංශය

**නිපුණතාව** : 1.0 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 04යි

**ඉගෙනුම් පල** :
- අක්ෂර මාලාවේ අල්පප්‍රාණ අක්ෂර හඳුනා ගෙන වර්ග කරයි.
- අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර හඳුනා ගෙන වර්ග කරයි.
- අල්පප්‍රාණ මහාප්‍රාණ අක්ෂර නිවැරදි උච්චාරණයෙන් යුතු ව මතකයෙන් කියයි.
- අල්පප්‍රාණ අක්ෂර යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- මහාප්‍රාණ අක්ෂර යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- රේඵය, රකාරාංශය, යංශය නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

**පෙර සූදානම**

- • අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර පිළිබඳ ව (පෙළපොතේ 1 වන පාඩම) අධ්‍යයනය කරන්න.
- • වර්ගාක්ෂර ලියන ලද ප්‍රදර්ශකයක් සකස් කර ගන්න.
- • අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර සහිත වචන ඇතුළත් ලැයිස්තුවක් සකස් කර ගන්න. (ඇමුණුම 4)
- • වදන් කවි පොතේ අල්පප්‍රාණ සහ මහාප්‍රාණ පිළිබඳ ව සඳහන් කවිය අධ්‍යයනය කරන්න. (ඇමුණුම 01)
- • රේඵය, රකාරාංශය සහ යංශය සහිත වචන ලියන ලද පැවරුම් පත් කිහිපයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

• පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරමින් පාඩමට පිවිසෙන්න.

උදාහරණ: * ගද්‍ය හෝ පද්‍ය පාඨයක් ලබා දී එහි ඇති අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර වෙන ම තෝරා ලිවීමට දීම (ඇමුණුම 02)

* වර්ගාක්ෂර ලියන ලද (එහි අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර පාට දෙකකින් දක්වන්න) පුවරුව ප්‍රදර්ශනය කොට ඒ පිළිබඳ විමසීම
* වදන් කවි පොතේ සඳහන් අල්පප්‍රාණ සහ මහාප්‍රාණ පිළිබඳ සඳහන් කවිය (ඇමුණුම 01) ගායනා කොට එහි අර්ථය විමසීම හෝ පැහැදිලි කරදීම
* අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර වෙන වෙන ම ලියන ලද පත්‍රිකා ශිෂ්‍යයන් අතර බෙදා දී එම අකුරු පිළිබඳ විමසීම

- * රේඵය, රකාරාංශය සහ යංශය සහිත වචන ලියන ලද පැවරුම් පත්‍රිකා ශිෂ්‍යයන් අතර බෙදා දී එහි ඇති අකුරු පිළිබඳ ව විමසීම

**පාඩම සංවර්ධනය**

- • වර්ගාක්ෂර ලියන ලද පුවරු ප්‍රදර්ශනය කරන්න.
- • එම පුවරුව සහ ප්‍රවේශයේ දී මතු වූ කරුණු ඇසුරෙන් ව්‍යංජනාක්ෂරවල අල්පප්‍රාණ සහ මහාප්‍රාණ භේදය පැහැදිලි කරන්න.
- • අල්පප්‍රාණ සහ මහාප්‍රාණ යනු කුමක් දැයි නිර්වචනය කරන්න.
- • අල්පප්‍රාණාක්ෂර 10ක් සහ මහාප්‍රාණාක්ෂර 10ක් ඇති බව පෙන්වා දෙන්න. (ඇමුණුම 02)

• වර්ගාක්ෂරවල පළමු වන සහ තෙවන පේළිවල යෙදී ඇති අකුරු අල්පප්‍රාණ බව ද, දෙවන සහ සිව්වන පේළිවල යෙදී ඇති අකුරු මහාප්‍රාණ බව ද ප්‍රදර්ශක පුවරුව භාවිත කරමින් පහදන්න.

• වදන් කවි පොතේ සඳහන් කවිය (ඇමුණුම 01) ඇසුරින් අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂරවලට යෙදෙන වෙනත් නම් පැහැදිලි කරන්න.

• භාෂා ව්‍යවහාරයේ දී අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර වැදගත් වන ආකාරය සහ යෙදෙන අකුර අනුව අර්ථය වෙනස් වන ආකාරය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (ඇමුණුම 03)

• අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර සහිත වචන ලැයිස්තුව ඉදිරිපත් කරමින් ඒවායේ වැරදි නිවැරදි බව සාකච්ඡා කරන්න. (ඇමුණුම 5)

- • අල්පප්‍රාණාක්ෂරවල උච්චාරණයේ ස්වභාවය සහ මහාප්‍රාණාක්ෂර උච්චාරණයේ ස්වභාවය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

• රේඵය, රකාරාංශය සහ යංශය පිළිබඳව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.

- • රේඵය, රකාරාංශය සහ යංශය යෙදෙන ස්ථාන හා නිවැරදි උච්චාරණය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- • අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර නිවැරදි ව මතකයෙන් ලිවීමට අවස්ථාව දෙන්න.
- • පෙළ පොතේ 1 වන පාඩමේ ක්‍රියාකාරකම 08 අභ්‍යාසය නිම කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- • වදන් කවි පොතේ සඳහන් ඇමුණුම 01 දැක්වෙන කවිය වණපොත් කිරීමට ශිෂ්‍යයන්ට යොමු කරන්න.
- • එක ම වචනයක අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය පිළිබඳව සැලකිලිමත් වෙමින් අර්ථවත් වාක්‍ය ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න. (ඇමුණුම 04)
- • රේඵය, රකාරාංශය සහ යංශය සහිත වචන 05 බැගින් වෙන වෙන ම ලිවීමට අවස්ථාව දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- අල්ප වූ ප්‍රාණයෙන් හෙවත් මඳ වූ හුස්මෙන් යුතු ව උච්චාරණය වන ශබ්ද අල්පප්‍රාණ නම් වේ.

  සිංහල වියරණ විදි, තිලකසිරි, සිරි - කොළඹ, 2007, 31 පිටුව
- මහත් වූ ප්‍රාණයෙන් හෙවත් වැඩි ශ්වාසයකින්, හුස්මකින් යුතු ව උච්චාරණය වන්නේ මහාප්‍රාණයි.

  සිංහල වියරණ විදි, තිලකසිරි, සිරි - කොළඹ, 2007, 31 පිටුව

**ගුණාත්මක යෙදවුම් :**

- • අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර පාට දෙකකින් ලියන ලද පුවරුව
- • වදන් කවි පොතේ සඳහන් ඇමුණුම 01 කවිය
- • අල්පප්‍රාණාක්ෂර හා මහාප්‍රාණාක්ෂර සහිත වචන ඇතුළත් වගුව

**ඇගයීම සහ තක්සේරුකරණ නිර්ණායක :**

- අක්ෂර මාලාවේ අල්පප්‍රාණ අක්ෂර හඳුනා ගෙන වර්ග කිරීම
- අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර හඳුනා ගෙන වර්ග කිරීම
- අල්පප්‍රාණ මහාප්‍රාණ අක්ෂර නිවැරදි උච්චාරණයෙන් යුතු ව මතකයෙන් කීම
- අල්පප්‍රාණ අක්ෂර යොදා වාක්‍ය නිර්මාණය කිරීම
- මහාප්‍රාණ අක්ෂර යොදා වාක්‍ය නිර්මාණය කිරීම
- රේඵය, රකාරාංශය, යංශය නිවැරදි ව භාවිත කිරීම

**පරිශීලනිය ග්‍රන්ථ :**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

  සිංහල හෝඩිය (සිංහල රීතිය) - ජේ.බී. දිසානායක

**ඇමුණුම 01**

පස්වග යුග සිව් දනිතය දන්නේ
එම වගවල එක තුන පවසන්නේ
නොවලග සිතිලය දූන කියමින්නේ
මෙම වග කුරු පෙළ තෝරා දෙන්නේ
වදන් කවි පොත, 24 කවිය

''අක්ෂර පස් වර්ගයන්ගේ දෙවෙනි සහ සතරවෙනි අක්ෂරය දනිතය (මහාප්‍රාණ) නම් වේ. පළමුවෙනි සහ තුන්වෙනි අකුරු සිතිලය (අල්පප්‍රාණ) නම් වේ. මේ ආකාරයෙන් අක්ෂර තෝරා දෙන්නේ වේ.''

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, වදන් කවිපොත, 2001, 24 වන කවිය

**ඇමුණුම 02**

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | ග | අල්පප්‍රාණාක්ෂර | ඛ | ඝ | මහාප්‍රාණාක්ෂර |
| ච | ජ | | ඡ | ඣ | |
| ට | ඩ | | ඨ | ඪ | |
| ත | ද | | ථ | ධ | |
| ප | බ | | ඵ | භ | |

**ඇමුණුම 03**

යෙදෙන අකුර අනුව වචනයේ අර්ථය වෙනස් වන ආකාරය

| **වචනය** | **අර්ථය** |
|---|---|
| දන | ජනයා, දනහිස, දානය |
| ධන | ධනය |
| | |
| ප්‍රදාන | දීම, ප්‍රදානය කිරීම |
| ප්‍රධාන | ප්‍රධානියා |
| | |
| ඡන්ද | කැමැත්ත |
| චන්ද | සඳ |

**ඇමුණුම 04**

අල්පප්‍රාණ හා මහාප්‍රාණ යෙදුණු නිදර්ශක වාක්‍යය

''දනට පිනට ළැදි සුප්‍රකට ධනපතියකු වූ මහා දානපති ධනපාල මහතා සිය ධනය නොමසුරුව දුගී දනට දන් දුන්නේය.''

**ඇමුණුම 05**

අල්පප්‍රාණ මහාප්‍රාණ අක්ෂර සහිත වචන ලැයිස්තුව. (වැරදි නිවැරදි) බව සාකච්ඡා කිරීම සඳහා

මජ්ජිම/මජ්ඣිම, කනිජ/ඛනිජ, උච්චාරණය/උච්ඡාරණය, චේදය/ඡේදය, කතකය/කථකය, ස්ථූප/ස්තූප, බන්ධනාගාරය/බන්දනාගාරය, පළිබෝද/පළිබෝධ, පාරිභෝගික/පාරිබෝගික, අනර්ඝ/අනර්ග, පරිඝණක/පරිගණක, පාරිභාෂික/පාරිබාෂික, දෘෂ්ටි/දෘෂ්ඨි, ප්‍රතිඵල/ප්‍රතිපල

## ක්‍රියාකාරකම 3
## අකාරාදි පිළිවෙළ

**නිපුණතාව** : 1.0 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.3 ලේඛන කාර්යයේ දී අකාරාදී පිළිවෙළ භාවිත කරයි.

**කාලච්ඡේද** : 02 යි

**ඉගෙනුම් පල** :
- සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළට ලියයි.
- අකාරාදි පිළිවෙළ හඳුනා ගෙන පැහැදිලි කරයි.
- අකාරාදී පිළිවෙළට පද පෙළ ගස්වයි.
- අකාරාදී පිළිවෙළට පද පෙළගැස්වීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අකාරාදී පිළිවෙළ හඳුනා ගනිමින් ශබ්දකෝෂ පරිහරණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- • නූතන සිංහල අක්ෂර මාලාවෙ අනුපිළිවෙළ පිළිබඳ ව නිවැරදි ව අධ්‍යයනය කරන්න. (පෙළ පොතේ 1 වන පාඩම)
- • අකාරාදි පිළිවෙළට ලිය වී ඇති ග්‍රන්ථ පරිශීලනය කරමින් අකාරාදි පිළිවෙළ පිළිබඳ මනා අවබෝධයක් ලබා ගන්න.
- • අකාරාදි පිළිවෙළ පිළිබඳ ව මනා පුහුණුවක් ලබා ගන්න.
- • ශබ්දකෝෂ කිහිපයක් සූදානම් කර ගන්න.
- • අකාරාදි පිළිවෙළට සකසා ඇති නිදර්ශක කිහිපයක් සකස් කර ගන්න.

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරන්න.

උදාහරණ: * ශබ්දකෝෂයක් භාවිත කර වචන කිහිපයක අර්ථ සෙවීම (ඇමුණුම 01)
* පන්තියේ ශිෂ්‍යයන් පස්දෙනෙකුගේ නම් අකාරාදි පිළිවෙළට ලිවීම
* ග්‍රන්ථ කිහිපයක නම් ලබා දී අකාරාදි පිළිවෙළට සකස් කිරීමට අවස්ථාව ලබා දීම

**පාඩම සංවර්ධනය**

- • අකාරාදි පිළිවෙළට නාම ලේඛනයක් සකස් කිරීමේ දී අක්ෂර මාලාවේ අනුපිළිවෙළ අනුව වචන පෙළ ගැස්විය යුතු බව කියන්න.
- • අකාරාදි පිළිවෙළ වැදගත් වන අවස්ථා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- • අකාරාදි පිළිවෙළට සකස් කර ඇති ලේඛන පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- • ශබ්දකෝෂ පරිහරණය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- • ශබ්දකෝෂ භාවිත කර වචනාර්ථය සොයා ගන්නා අයුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

- • තෝරා ගත් වචන කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දී සුදුසු ශබ්දකෝෂයක් භාවිත කර, එම වචනවල අර්ථය සෙවීමට උපදෙස් දෙන්න.
- • පන්තියේ ඉගෙනුම ලබන සියලු ම ශිෂ්‍යයන්ගේ නම් අකාරාදි පිළිවෙළට ලිවීමට අවස්ථාව දෙන්න.
- • කාල සටහනේ ඇති විෂයයන් අකාරාදි පිළිවෙළට ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- • පෙළ පොතේ ඇති ක්‍රියාකාරකම 07 නිම කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නූතන සිංහල අක්ෂර මාලාව (ඇමුණුම 01)
- අකාරාදි පිළිවෙළට සකසා ගත් නිදර්ශන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළට ලිවීම
- අකාරාදි පිළිවෙළ හඳුනා ගෙන පැහැදිලි කිරීම
- අකාරාදී පිළිවෙළට පද පෙළ ගැස්වීම
- අකාරාදී පිළිවෙළෙහි වැදගත්කම පැහැදිලි කිරීම
- අකාරාදී පිළිවෙළ හඳුනා ගනිමින් ශබ්ද කෝෂ භාවිතය

**පරිශීලනීය ග්‍රන්ථ :**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය -
- මහා සිංහල ශබ්දකෝෂය - හරිස්චන්ද්‍ර විජේතුංග
- සිංහල අකුරු අකාරාදි කිරීම සහ ප්‍රමිත කිරීම - හරිස්චන්ද්‍ර විජේතුංග,
- ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - වැලිවිටියේ, සෝරත හිමි

**ඇමුණුම 01**

නූතන සිංහල අක්ෂර මාලාව (උපුටා ගැනීම - සිංහල ලේඛන රීතිය, නව සංස්කරණය, ජාතික අධ්‍යාපන ආයතනය)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ 1 | ආ 2 | ඇ 3 | ඈ 4 | ඉ 5 | ඊ 6 |
| උ 7 | ඌ 8 | ඍ 9 | ඎ 10 | ඏ 11 | ඐ 12 |
| එ 13 | ඒ 14 | ඓ 15 | ඔ 16 | ඕ 17 | ඖ 18 |
| (අ)ං 19 | (අ)ඃ 20 | | | | |
| ක 21 | ඛ 22 | ග 23 | ඝ 24 | ඞ 25 | ඟ 26 |
| ච 27 | ඡ 28 | ජ 29 | ඣ 30 | ඤ 31 | ඦ 33 |
| ට 33 | ඨ 34 | ඩ 35 | ඪ 36 | ණ 37 | ඬ 38 |
| ත 39 | ථ 40 | ද 41 | ධ 42 | න 43 | ඳ 44 |
| ප 45 | ඵ 46 | බ 47 | භ 48 | ම 49 | ඹ 50 |
| ය 51 | ර 52 | ල 53 | ව 54 | | |
| ශ 55 | ෂ 56 | ස 57 | හ 58 | ළ 59 | ෆ 60 |

## ක්‍රියාකාරකම 4
## නාම පද

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.1 නාම පද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල** :
- නාම පද හඳුනා ගෙන නම් කරයි.
- නාම පද හා නාම ප්‍රභේද හඳුනා ගෙන විස්තර කරයි.
- නාම පද වර්ග කර දක්වයි.
- නාම පදයක ප්‍රකෘතිය හඳුනා ගෙන විස්තර කරයි.
- සර්ව නාම පද හඳුනා ගෙන භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- නියමිත විෂය අන්තර්ගය මැනවින් අධ්‍යයනය කරන්න. මේ සඳහා පෙළ පොතේ 2 පාඩම යොදා ගන්න.
- ක්‍රියාකාරකම කාලච්ඡේද 4කට වෙන් කර ගන්න.
  1 හා 2 කාලච්ඡේද - නාම පද පිළිබඳ මූලික හැඳින්වීම
  3 හා 4 කාලච්ඡේද - සර්ව නාම
- නාම පදය පිළිබඳ ව නිර්වචන සොයා ගන්න. (මූලික වදන්/සංකල්ප)
- නාම පදයක ප්‍රකෘතිය සොයා ගන්නා ආකාරය පිළිබඳ ව අධ්‍යයනය කරන්න.
- නාම පදවල ලක්ෂණ පිළිබඳ ව මූලික අවබෝධය ලබා ගන්න.
- නාම පදවල ප්‍රභේද පිළිබඳ ව මූලික අවබෝධය ලබා ගන්න.
- නාම පද වර්ගීකරණය පිළිබඳ ව සංකල්ප සිතියමක් සකස් කරගන්න. (ඇමුණුම 01)
- නාම පද ලියන ලද ප්‍රදර්ශනාත්මක පුවරුවක් සකස් කරගන්න.
- සර්ව නාම යනු කුමක් ද? යන්න අධ්‍යයනය කර දැනුම යාවත්කාලීන කර ගන්න.
- සර්ව නාම සහිත ප්‍රදර්ශනාත්මක පුවරුවක් සාදා ගන්න.
- සර්ව නාම සඳහා පැවරුම් පතක් නිර්මාණය කරන්න.

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරන්න.

උදාහරණ * නාම පද පිළිබඳ ව සිසුන්ගේ පෙර දැනුම පිරික්සීම
- * ගද්‍ය ඡේදයක් ලබා දී ඉන් නාම පද තෝරා ලිවීමට යොමු කිරීම
- * ගද්‍ය ඡේදයක් ලබා දී ඉන් සර්ව නාම තෝරා ලිවීමට අවස්ථාව ලබා දීම

**පාඩම සංවර්ධනය**

- නාම පද යනු කුමක් දැයි හඳුන්වා දෙන්න.

- • නාම පද වර්ග නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ඇමුණුම 01)
- • නාම පදයක ප්‍රකෘතිය සොයා ගන්නා ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- • සර්ව නාම පිළිබඳ ව හඳුන්වා දෙන්න.
- • ගද්‍ය ඡේදයක් ලබා දී ඉන් නාම පද උපුටා ලිවීමට අවස්ථාව දෙන්න.
- • ගද්‍ය ඡේදයක් ලබා දී ඉන් සර්ව නාම උපුටා ලිවීමට අවස්ථාව දෙන්න.
- • එසේ උපුටා ගත් නාම පද සිසුන් සමඟ සාකච්ඡා කරමින් වර්ගීකරණය කරන්න.

- • නාම පද ගොනුවක් ලබා දී ඒවා වර්ග කර ලිවීමට අභ්‍යාසයක් ලබා දෙන්න. (ඇමුණුම 2)
- • වාක්‍ය කිහිපයක් ලියා එහි ඇති හිස්තැන් සුදුසු සර්ව නාම පද යොදා ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න. (ඇමුණුම 3)
- • ඡේදයක් ලබා දී ඉන් නාම පද තෝරා ඒවා වර්ග කර දැක්වීමට උපදෙස් ලබා දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

''නමනුයේ නාම යි''

ව්‍යාකරණ විවරණය, කුමාරතුංග, මුනිදාස, කොළඹ, 2008, 74 පිටුව

''නාම යනු ශබ්ද ප්‍රකෘතියයි. විභක්ති ප්‍රත්‍යය තද්ධිත ප්‍රත්‍යය ආදියට පෙරටුව යෙදී නාම පද, තද්ධිත නාම ආදිය නිර්මාණයට මුල් වන්නේ නාමයි'' සිංහල ව්‍යාකරණ අකාරාදිය පෙරේරා, රූපසිංහ. පී. පද්මා ලංකා රූපසිංහ, කොළඹ 2000, 267 පිටුව

''වර නැගෙන ආකාරය අනුව ජාති නාම, ද්‍රව්‍ය නාම, ගුණ නාම, ක්‍රියා නාම හා සංඥා නාම යනුවෙන් නාම පංච විධ වේ.''

පෙරේරා, රූපසිංහ පී. පද්මා ලංකා රූපසිංහ -

සිංහල ව්‍යාකරණ අකාරාදිය, කොළඹ 2000, 267 පිටුව

පුද්ගල භේදයකින් තොර ව කිසියම් සමූහයක්, ජාතියක් හඟවන නාම ජාති නාම නම් වේ.

තිලකසිරි, සිරි, සිංහල වියරණ විදි, කොළඹ, 2007, 87 පිටුව

ද්‍රව්‍ය හෙවත් අචේතනික වස්තු හඳුන්වන නාම පද නාම නම් වේ.

(එම 87 පිටුව)

නාමයක පවතින කිසියම් ස්වභාවයක්, විශේෂයක් හෙවත් ගුණයක් හඟවන නාම ගුණ නාම යි.

(එම 88 පිටුව)

නාම ස්වභාවය මෙන් ම ක්‍රියා ස්වභාවය ද දක්වන්නේ ක්‍රියා නාමයි. (එම 89 පිටුව)

සංඥා නාම නම් කිසියම් පුද්ගලයකු, සතකු හෝ ද්‍රව්‍යයක් හෝ හඳුනා ගැනීම සඳහා තබා ඇති නාමයි. (එම 90 පිටුව)

''විබතැනට ඇසුරු සද පියෙවි නම්''

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ,සිදත් සඟරා විමසුම, කොළඹ, 2004, 4 පිටුව

''ද දුව් ගුණ කිරිය සන් වී සදන් පස් බේ''

(එම 19 පිටුව)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නාම පද හඳුනා ගෙන නම් කිරීම
- නාම පද හා නාම ප්‍රභේද හඳුනා ගෙන විස්තර කිරීම
- නාම පද වර්ග කර දැක්වීම
- නාම පදයක ප්‍රකෘතිය හඳුනා ගෙන විස්තර කිරීම


**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1, 2, 3

**පරිශීලනීය ග්‍රන්ථ**

සිංහල වියරණ විදි තිලකසිරි, සිරි

ඇමුණුම 1




**ඇමුණුම 2 - නාම පද වර්ගීකරණය සඳහා පැවරුම**

පහත දී ඇති පද නිවැරදි ව වගු ගත කරන්න.

සිංහ, පිටි, සුදු, නටන්නා, මහරගම, අසේල, දුවන, කාරුණික, පස්, හිවල්, ඔටු, පුටු, උස, බලන්නී, අසේල, ඉසුරුමුණිය, නැටුම, මිටි, වැලි, කුරුලු

| ජාති නාම | ද්‍රව්‍ය නාම | ගුණ නාම | ක්‍රියා නාම | සංඥා නාම |
|---|---|---|---|---|
| | | | | |

**ඇමුණුම 3 සර්ව නාම සඳහා පැවරුම**

පහත සඳහන් උදාහරණයට අනුව සුදුසු සර්ව නාම පද යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

* <u>සෝරත පොඩි හාමුදුරුවෝ</u> දක්ෂ ශිෂ්‍යයෙකි. <u>උන්වහන්සේ</u> දිනපතා පිරිවෙනට වැඩම කරති.

1. කමල් දිනපතා පාඩම් කරයි. ........................ දක්ෂ ශිෂ්‍යයෙකි.
2. බල්ලා බුරයි. ............................ කඩිසරයි.
3. දුම්රිය පොදු දේපලකි. ................ සුරැකීම අපෙගේ යුතුකමයි.
4. තිළිණි දක්ෂ ශිෂ්‍යාවකි. .................. ක්‍රීඩාවට ද දක්ෂ ය.
5. මිනිස්සු දිනපතා වැඩ කරති. ................... උදෑසනින් ම වැඩට යති.

## ක්‍රියාකාරකම 5
## නාම විභක්ති

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.3 නාම විභක්ති පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල** :
- විභක්ති නාමය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නාමයක් විභක්ති නවයෙහි වරනගා පැහැදිලි කරයි.
- විභක්ති නවය කටපාඩමින් ප්‍රකාශ කරයි.
- විභක්ති, වචන, ලිංග අනුව නාම පද වර්ගීකරණය කරයි.
- සර්ව නාම විභක්තිවල වරනගයි.
- නාමයක් විභක්තිවල වරනැගීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සිදත් සඟරාවේ, පාලි සහ සංස්කෘත භාෂාවල නාම හඳුන්වා ඇති පාඨ පිළිබඳ ව අවබෝධයක් ලබා ගන්න. ඒවා ශිෂ්‍යයන්ට ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න.
- නාමයක් වරනැගෙන ආකාරය පිළිබඳව පෙළපොතේ 2 වන පාඩම අධ්‍යයනය කරන්න.
- විෂය කරුණු කාලච්ඡේද 4කට ගැළපෙන ලෙස සංවිධානය කර ගන්න.
- නාමයක් වරනැගීමේ දී වචන, ලිංග භේද අනුව වෙනස් වන ආකාරය අධ්‍යයනය කරන්න.
- සර්ව නාම පද විභක්තිවල වරනැගෙන ආකාරය පිළිබඳ ව අධ්‍යයනය කරන්න.
- විභක්ති නවය ලියන ලද ප්‍රදර්ශනාත්මක පුවරුවක් සකස් කර ගන්න.
- විභක්ති නවයේ නාම පදයක් වරනගන ලද ප්‍රදර්ශනාත්මක පුවරුවක් සකස් කර ගන්න.

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරන්න

උදාහරණ * විභක්ති නවය කටපාඩමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී එහි වැදගත්කම සාකච්ඡා කිරීම.

- * විවිධ විභක්ති සහිත නාම පද ඇතුළත් ගද්‍ය ඡේදයක් දී ඉන් විභක්ති නමය හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම.

**පාඩම සංවර්ධනය :**

- විභක්ති නාම දැක්වෙන පුවරුව භාවිත කරමින් විභක්ති පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නගන්න.
- නාම පදයක් වරනගන ලද පුවරුව ද මේ සඳහා ඉවහල් කර ගන්න.
- නාමයක් වරනැගීම යනු කුමක් ද? යන්න පැහැදිලි කරන්න.

- නාමයක විවිධ රූප (විභක්ති) ඇති බව සාකච්ඡා කරන්න.
- සර්ව නාම ආලපන විභක්තිය හැර අන් සියලු විභක්තිවල වරනැගෙන බව සාකච්ඡා කරන්න.
- විභක්ති නමය කටපාඩම් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පෙළ පොතේ 2 පාඩමේ ඇති ක්‍රියාකාරකම 2.1 සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නාමයක් ලබා දී එය සියලු විභක්තිවල වරනැගීමට අවස්ථාව ලබා දෙන්න.
- විවිධ විභක්තිවලට අයත් නාම පද දහයක් ලබා දී එම නාමපදවල විභක්ති නම් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන් සංකල්ප**

'නමින් පරව බෙදනු ලබනුයේ විබත් නම්'

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ, සිදත් සඟරා විමසුම, කොළඹ, 2004, 87 පි.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- විභක්ති නමය හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- නාමයක් විභක්ති නමයෙහි වරනගා පැහැදිලි කිරීම
- විභක්ති නමය කටපාඩමින් ප්‍රකාශ කිරීම
- නාමයක් විභක්ති වචන ලිංග අනුව වර්ග කර දැක්වීම
- සර්ව නාමයක් විභක්තිවල යොදා වරනැගීම
- නාමයක් විභක්තිවල වරනැගීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

ඇමුණුම 01

**පරිශීලනීය ග්‍රන්ථ :**

සිදත් සඟරා විමසුම - ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි, -

**ඇමුණුම 01**

විභක්ති නමය

1. ප්‍රථමා විභක්ති - පෙර විබත්
2. කර්ම විභක්ති - කම් විබත්
3. කර්තෘ විභක්ති - කතු විබත්
4. කරණ විභක්ති - කරණ විබත්
5. සම්ප්‍රදාන විභක්ති - සපදන් විබත්
6. අවධි විභක්ති - අවදි විබත්
7. සම්බන්ධ විභක්ති - සබඳ විබත්
8. ආධාර විභක්ති - අදර විබත්
9. ආලපන විභක්ති - අලප් විබත්

# ක්‍රියාකාරකම 6
# නිපාත

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.4 නිපාත, උපසර්ග පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල** :
- නිපාත පද හඳුනා ගනිමින් විස්තර කරයි.
- නිපාත පදවල ප්‍රයෝජන නිවැරදි අවබෝධයෙන් සාකච්ඡා කරයි.
- නිපාත පද හඳුනා ගනිමින් එකි ප්‍රභේද විස්තර කරයි.
- නිපාත පද කටපාඩමින් ප්‍රකාශ කරයි.
- නිපාත පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- නිපාත පිළිබඳ ව පෙළ පොතේ සඳහන් 3 වන පාඩම හොඳින් අධ්‍යයනය කරන්න.
- කාලච්ඡේද 3කට ගැළපෙන ලෙස විෂය කරුණු සංවිධානය කර ගන්න.
- පොත පත කියවා දැනුම යාවත්කාලීන කර ගන්න.
- අවශ්‍ය නිදර්ශන සහ ඉගෙනුම් ආධාරක සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරමින් පාඩමට පිවිසෙන්න.
  - * ගද්‍ය පාඨයක් ලබා දී එහි ඇති නිපාත පද තෝරා ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම. (ඇමුණුම 01)
  - * නිපාත සහ උපසර්ග ගොනුවක් ලබා දී නිපාත, උපසර්ග වෙන් කිරීමට අවස්ථාව ලබා දීම.
  - * ශිෂ්‍යයන් දන්නා නිපාත පද පිළිබඳ විමසීම.

**පාඩම සංවර්ධනය :**

- නිපාත පද පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසන්න.
- නිපාත පද යනු කුමක් ද? යන්න නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- නිපාත පදවල භාවිතය සාකච්ඡා කරන්න.
- නිපාත පදවල ප්‍රභේද උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- පෙළ පොතේ අභ්‍යාසය (3.1 ක්‍රියාකාරකම) පන්ති කාමරයේ දී නිම කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමේ දී ඉගෙන ගත් නිපාත ඇතුළත් කරමින් නිපාත සහිත වාක්‍ය ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- නිපාත ඇතුළත් කතන්දරයක් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- සුදුසු ඇගයීම් නිර්ණායක ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01
- පැවරුම් පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- නිපාත පද හඳුනා ගනිමින් විස්තර කිරීම
- නිපාත පදවල ප්‍රයෝජන නිවැරදි අවබෝධයෙන් සාකච්ඡා කිරීම
- නිපාත පද හඳුනා ගෙන එහි ප්‍රභේද විස්තර කිරීම
- නිපාත පද කිහිපයක් කටපාඩමින් ප්‍රකාශ කිරීම
- නිපාත පද යොදා වාක්‍ය ලිවීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස් කරුණාතිලක

සිදත් සඟරා විමසුම - ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි

සිංහල ව්‍යාකරණ අකාරාදිය - රූපසිංහ පී, පෙරේරා, පද්මා ලංකා රූපසිංහ

**ඇමුණුම 01**

විශාල අට පට්ටම් කුඩුවක් සෑදීමේ අදහස පළමුවෙන් ඇති වූයේ අයියාගේ සිතෙහි ය. එවැනි වෙසක් පහනක් සෑදීමට අම්මා අනුබල නුදුන් නමුත් නංගීත් මමත් අයියාත් ඊට මෙහෙයු වෙමු. අයියා උණ කැබැල්ලක් ගෙනවුත් පහනෙහි මැද කුඩුව සාදන්නට වූයේය. ඔහු ගෙයි කෑම කන සාලයේ මේසය අසල බිම කඩදාසියක් එලා හිඳගෙන උණ කැබැල්ල පළා සිහින් පතුරුවලට ඉරන්නට විය. එකල අයියා වයසින් අවුරුදු දාහතරක් පමණ ද නංගී හයක් පමණ ද මම හතක් පමණ ද වීමු. උණ කැබලි එක්කොට අට පට්ටම් කුඩුවක් සාදන සැටි නංගී හෝ මම හෝ නොදැන සිටියෙමි. එහෙයින් අයියා උණ කැබැල්ල පතුරුවලට ඉරන සැටි අප බලා සිටියේ ඔහු විස්මය උපදවන දෙයක් කරනු බලා සිටින්නාක් මෙනි.

දුප්පතුන් නැති කෝලය - ජී. බී. සේනානායක

## ක්‍රියාකාරකම 7
## උපසර්ග

| | | |
|---|---|---|
| **නිපුණතාව** | : 2.0 | ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි. |
| **නිපුණතා මට්ටම** | : 2.4 | නිපාත, උපසර්ග පද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි. |
| **කාලච්ඡේද** | : 05යි | |
| **ඉගෙනුම් පල** | : | • උපසර්ග පද හඳුනා ගෙන විස්තර කරයි.<br>• සිදත් සඟරාවේ උපසර්ග පද 20 කටපාඩමින් ප්‍රකාශ කරයි.<br>• නාමයට හා ක්‍රියාවට උපසර්ග පද එක් වීමේ දී අර්ථයට සිදු වන බලපෑම හඳුනා ගෙන විස්තර කරයි.<br>• දෙන ලද අභ්‍යාසවල උපසර්ග පද නිවැරදි කර ලියා දක්වයි.<br>• උපසර්ග පද 10ක් යොදා වාක්‍ය ලියයි. |

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- උපසර්ග පිළිබඳ ව පෙළ පොතේ සඳහන් 4 පාඩම හොඳින් අධ්‍යයනය කරන්න.
- පාලි, සංස්කෘත භාෂාවල උපසර්ග පද පිළිබඳ ව දැනුම සහ අවබෝධය ලබා ගන්න.
- කාලච්ඡේද 3කට ගැළපෙන පරිදි විෂය කරුණු සංවිධානය කර ගන්න.
- අවශ්‍ය ඉගෙනුම් ආධාරක සකස් කර ගන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරමින් පාඩමට පිවිසෙන්න.

උදා: *උපසර්ග පද සහිත වාක්‍ය කිහිපයක් ලබා දී එහි ඇති උපසර්ග පද තෝරා ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම. (ඇමුණුම 01)

* උපසර්ග පද කිහිපයක් මතකයෙන් පැවසීමට අවස්ථාව ලබා දීම.

**පාඩම සංවර්ධනය**

- උපසර්ග පද පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසන්න.
- උපසර්ග පද යනු කුමක් ද? යන්න නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- උපසර්ග පද එකතු වූ විට නාම පදවල සහ ක්‍රියා පදවල අර්ථයට සිදු වන බලපෑම උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- සිදත් සඟරාවේ ඇති උපසර්ග 20 හඳුන්වා දෙන්න. (ඇමුණුම 2)
- පෙළපොත ඇසුරෙන් පාලි, සංස්කෘත භාෂාවල උපසර්ග පද පිළිබඳ ව උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.

- පෙළපොතේ 4 පාඩමේ 4.1 ක්‍රියාකාරකම පන්ති කාමරයේ දී නිම කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- උපසර්ග පද සහිත වචන මාලාවක් ලබා දී ඉන් උපසර්ග පද වෙන් කර ලිවීමට උපදෙස් දෙන්න.
- නිපාත සහ උපසර්ග පද සහිත වගුවක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ ඇති අනෙකුත් ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්ණායක ඉවහල් කර ගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01, 02

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- උපසර්ග පද හඳුනා ගනිමින් විස්තර කිරීම
- සිදත් සඟරාවේ උපසර්ග පද 20 කටපාඩමින් ප්‍රකාශ කිරීම
- නාමයකට හා ක්‍රියාවකට උපසර්ග පද එක් වීමේ දී අර්ථයට වන බලපෑම හඳුනා ගෙන විස්තර කිරීම
- දෙන ලද අභ්‍යාසවල උපසර්ග පද නිවැරදි ව වෙන් කර ලියා දැක්වීම
- උපසර්ග පද නිවැරදි ව යොදා වාක්‍ය 10ක් ලිවීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස් කරුණාතිලක

උපසර්ග (බසක මහිම 7) - ජේ. බී. දිසානායක

සිදත් සඟරා විමසුම - ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි

සිංහල ව්‍යාකරණ අකාරාදිය - රූපසිංහ පී පෙරේරා සහ පද්මා ලංකා රූපසිංහ

**ඇමුණුම 01**

සූත්‍ර, විනය සහ අභිධර්මය යන ත්‍රිපිටකය සියලු ම භික්ෂූන් අධ්‍යයනය කළ යුතු ය.
අනුනාහිමියෝ පැමිණි ගිහි පින්වත් සැම තිසරණ සහිත පංචශීලයෙහි පිහිටවූහ.
සුදන ගුණ සහ දුදන ගුණ ඇති මිනිස්සු සමාජයේ සිටිති.
ආරාධිත අමුත්තන් පිළිගැනීම සඳහා සියල්ල සූදානම් ව ඇත.
නාහිමියෝ සුමධුර ධර්ම දේශනාවක් පැවැත්වූහ.

**ඇමුණුම 02**

සිදත් සඟරාවේ දක්වා ඇති උපසර්ග පද 20

ප, පර, අව, ස, අනු, නි, දු, වි, අ, අදි, සු, උ, අබි, පිරි, උප, අප, පස්, පිළි, අති, පි

## ක්‍රියාකාරකම 8
## ආඛ්‍යාත

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.2 ආඛ්‍යාත පද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල** :
- ආඛ්‍යාත පද හඳුනා ගෙන පැහැදිලි කරයි.
- ආඛ්‍යාත පද වර්ග හඳුනා ගෙන නම් කරයි.
- ආඛ්‍යාත පද සකසන අන්දම නිදසුන් මගින් පැහැදිලි කරයි.
- ආඛ්‍යාත පද කාල, පුරුෂ, වචන භේදවල යෙදෙන අයුරු විස්තර කරයි.
- විධි ක්‍රියා පද හඳුනා ගනිමින් වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- ආඛ්‍යාත පද පිළිබඳ පෙළ පොත කියවා පාඩම් සටහනක් සකස් කර ගන්න. (පෙළ පොතේ 5 වන පාඩම)
- ආඛ්‍යාත පදයක මූලික ස්වභාවය හඳුනා ගන්න.
- ආඛ්‍යාත පදයක් සැකසෙන අයුරු අවබෝධ කර ගන්න.
- ආඛ්‍යාත පදවල කාල, පුරුෂ, වචන භේද හඳුනා ගන්න.
- විධි ක්‍රියාව පිළිබඳ ව පෙළ පොත කියවා දැනුම යාවත්කාලීන කර ගන්න.
- විවිධ ක්‍රියා පද කිහිපයක් ලියන ලද ප්‍රදර්ශනාත්මක පුවරුවක් සකස් කර ගන්න.
- ආඛ්‍යාත පද කාල, වචන, පුරුෂ අනුව වරනගන ලද පත්‍රිකාවක් සකස් කර ගන්න.
- විවිධ වර්ගවලට අයත් විධි ක්‍රියා ලියන ලද පත්‍රිකා කිහිපයක් සකස් කර ගන්න.

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරන්න.
  - * විවිධ පද ලියන ලද ප්‍රදර්ශනාත්මක පුවරුව ඇසුරෙන් ආඛ්‍යාත පද හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම.
  - * ආඛ්‍යාත පද කුමක්ද? යන්න පිළිබඳ පෙර දැනුම විමසීම
  - * ඇමුණුම 01හි සඳහන් ඡේදය ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කර එහි ඇතුළත් ආඛ්‍යාත පද යටින් ඉරි ඇඳීමට අවස්ථාව ලබා දීම.

**පාඩම සංවර්ධනය :**

- ආඛ්‍යාත පදයක් යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න.
- ආඛ්‍යාත පද සෑදෙන ආකාරය පැහැදිලි කරන්න.
- ආඛ්‍යාත පදවල කාල, පුරුෂ, වචන භේද උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- ආඛ්‍යාත පද පුරුෂත්‍රයෙහි සහ කාලත්‍රයෙහි වරනැගෙන අයුරු උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

- ආඛ්‍යාත පදවල ප්‍රභේදයක් ලෙස විධි ක්‍රියාව නිදසුන් මඟින් පැහැදිලි කරන්න.
- විධි ක්‍රියාව භාවිත වන විවිධ ස්වරූප පිළිබඳ ව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- විධි ක්‍රියා සහිත වාක්‍ය පහක් ලිවීමට අවස්ථාව දෙන්න.
- පෙළ පොතේ ඇති අභ්‍යාස නිම කිරීමට උපදෙස් දෙන්න.
- ආඛ්‍යාත පද කිහිපයක් ලිවීමට අවස්ථාව දෙන්න.
- එසේ ලියන ලද ආඛ්‍යාත පදවල මූලය (ධාතු ප්‍රකෘතිය) සෙවීමට උපදෙස් දෙන්න.
- විධි ක්‍රියා සහිත වාක්‍ය දහයක් ලිවීමට අවස්ථාව දෙන්න.
- පෙළ පොතේ ඇති අභ්‍යාස පන්ති කාමරයේ දී නිම කිරීමට උපදෙස් දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- ''ක්‍රියා අර්ථයක් පළ කරන පද ක්‍රියා පදයි. මේ අනුව ක්‍රියා පදයකින් කිරීමක්, වීමක් හෝ විඳීමක් පළ විය හැකියි.''

  තිලකසිරි, සිරි - සිංහල වියරණ විදි, කොළඹ, 2007, 208 පිටුව
- ''විධානයක්, නියෝගයක් පළ කරන ක්‍රියා විධි ක්‍රියායි.''

  තිලකසිරි, සිරි - සිංහල වියරණ විදි, කොළඹ, 2007, 229 පිටුව
- 'වත්මන් අනා රූ - නො වෙන් වැ හොත අනදරින්

  අදරින් හොත ත - අන් සබඳහට විදහන් විදි'

  පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ, සිදත් සඟරා විමසුම, කොළඹ, 2004, 173 පිටුව

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ආඛ්‍යාත පද හඳුනා ගෙන පැහැදිලි කිරීම
- ආඛ්‍යාත පද වර්ග හඳුනා ගනිමින් නම් කිරීම
- ආඛ්‍යාත පද සැකසෙන ආකාරය විස්තර කිරීම
- ආඛ්‍යාත පද කාල, පුරුෂ, වචන භේදවල යෙදෙන අයුරු විස්තර කිරීම
- විධි ක්‍රියා පද හඳුනා ගනිමින් වාක්‍ය නිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ ක්‍රියා පද කිහිපයක් යොදා ලියන ලද ප්‍රදර්ශන පුවරුවක්
- ඇමුණුම 01 හි ඡේදය

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල භාෂාවේ ව්‍යාකරණය, - ඩබ්ලිව්. එස් කරුණාතිලක
- බසක මහිම 11, ක්‍රියා පදය, - ජේ. බී. දිසානායක

**ඇමුණුම 01**

මට හැඬෙයි. මම නැගිට්ටෙමි. මිදුලට බැස්සෙමි. ගේට්ටුවෙන් පිට වූයෙමි. නිවස ඉදිරියේ පටු මගට පැමිණියෙමි. මේ නිවස පිහිටා ඇත්තේ විශ්වවිද්‍යාල භූමියේ වූ ඔගස්ටා කන්ද නමින් හැඳින්වෙන කුඩා කඳුගැටයක ය. තවත් නිවාස දාහතරක් පමණ මේ කඳුගැටය මත පිහිටා ඇත. මම බැවුම අද්දර ම සිට ගත්තෙමි. පහළ ඉතා ඈතට විහිදුණු මිටියාවතකි. මෙහි සිට අවට බලන්නකුගේ ඇස ගැටෙන දර්ශනය ඉතා ම රමණීය ය. දවසකට වරක්වත් මෙතැන සිට සොබාසිරිය නැරඹීම මගේ පුරුද්දක් විය. අද ද මගේ සුපුරුදු ස්ථානයේ සිට ගෙන සිත සන්සුන් කරන පියකරු දර්ශනයක් සොයා නෙත් හැරවීමි. හාත්පස ලස්සනයි. මම මට ම කියා ගතිමි. මම මට ම යම් යම් දර්ශන පෙන්වූයෙමි.

'අපේක්ෂා,'  - පියසීලි විජේමාන්න, උපුටා, ගැනීම කෙටිකතා සංග්‍රහය, - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)

## ක්‍රියාකාරකම 9
## නෛපාතික කෘදන්ත

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.5 නෛපාතික කෘදන්ත පද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල** :
- නෛපාතික ක්‍රියා හඳුනා ගෙන විස්තර කරයි.
- පූර්ව ක්‍රියා හඳුනා ගෙන නිදසුන් මගින් පැහැදිලි කරයි.
- මිශ්‍ර ක්‍රියා නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.
- පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා සෑදෙන ආකාරය පැහැදිලි කරමින් විස්තර කරයි.
- මිශ්‍ර ක්‍රියා හා පූර්ව ක්‍රියා වාක්‍යවල යොදයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

**පෙර සූදානම**

- පෙළ පොතේ සඳහන් 'නෛපාතික කෘදන්ත' 6 වන පාඩම කියවා දැනුම යාවත්කාලීන කර ගන්න.

  කාලච්ඡේද 4 පහත පරිදි වෙන් කර ගන්න

  1 සහ 2 කාලච්ඡේද - පූර්ව ක්‍රියා

  3 සහ 4 කාලච්ඡේද - මිශ්‍ර ක්‍රියා
- පූර්ව ක්‍රියා පද සහිත වාක්‍ය ලියන ලද පුවරුවක් සකස් කර ගන්න.
- මිශ්‍ර ක්‍රියා පද සහිත වාක්‍ය ලියන ලද පුවරුවක් සකස් කර ගන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරමින් පාඩමට පිවිසෙන්න.
  - * පූර්ව ක්‍රියා පද සහිත වාක්‍ය ලියන පද පුවරුව ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ විමසීම (පූර්ව ක්‍රියා පද පාඩම සඳහා)
  - * මිශ්‍ර ක්‍රියා පද සහිත වාක්‍ය ලියන පද පුවරුව ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ විමසීම (මිශ්‍ර ක්‍රියා පද පාඩම සඳහා)

**පාඩම සංවර්ධනය**

- පූර්ව ක්‍රියාව නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- එක ම වාක්‍යයක පූර්ව ක්‍රියා පද කිහිපයක් තිබිය හැකි බව උදාහරණ සහිත ව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- පූර්ව ක්‍රියා පද සහිත වාක්‍ය පහක් ලිවීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- වාක්‍ය පහක් දී එහි ඇති පූර්ව ක්‍රියා පද උපුටා ලිවීමට උපදෙස් දෙන්න.
- පෙළපොතේ 6 පාඩමේ අභ්‍යාස (6.1 ක්‍රියාකාරකම) පන්ති කාමරයේ දී නිම කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- මිශ්‍ර ක්‍රියාව නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- මිශ්‍ර ක්‍රියා ප්‍රත්‍ය පිළිබඳ නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
- පූර්ව ක්‍රියාව ද්විත්ව කිරීමෙන් මිශ්‍ර ක්‍රියා සෑදෙන ආකාරය පැහැදිලි කරන්න.
- වාක්‍ය පහක් දී එහි ඇති මිශ්‍ර ක්‍රියා පද උපුටා ලිවීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- පෙළ පොතේ 6 පාඩමේ අභ්‍යාස (6.2 ක්‍රියාකාරකම) පන්ති කාමරයේ දී නිම කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පූර්ව ක්‍රියා සහිත වාක්‍ය පහක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මිශ්‍ර ක්‍රියා සහිත වාක්‍ය පහක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගද්‍ය ඡේද කිහිපයක් ලබා දී ඒවායේ ඇති පූර්ව ක්‍රියා සහ මිශ්‍ර ක්‍රියා පද තෝරා වෙන වෙන ම ලිවීමට උපදෙස් දෙන්න. (ඇමුණුම 1)
- පෙළ පොතේ ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

පූර්ව ක්‍රියා - 'අනෙක් ක්‍රියාවන්ට පෙරටුව සිදු වන ක්‍රියාව පූර්ව ක්‍රියාවයි'
පෙරේරා, රූපසිංහ පී, පද්මා ලංකා රූපසිංහ, සිංහල ව්‍යාකරණ අකාරාදිය, කොළඹ, 2000, 295 පිටුව

මිශ්‍ර ක්‍රියාව - 'අනෙක් ක්‍රියාවක් සිදු වන විට සිදු වන ක්‍රියාව මිශ්‍ර ක්‍රියාවයි'
පෙරේරා, රූපසිංහ පී, පද්මා ලංකා රූපසිංහ, සිංහල ව්‍යාකරණ අකාරාදිය - කොළඹ, 2000, 329 පිටුව

**ගුණාත්මක යෙදවුම් :**

- පූර්ව ක්‍රියා පද සහිත වාක්‍ය ලියන පද පුවරුව
- මිශ්‍ර ක්‍රියා පද සහිත වාක්‍ය ලියන ලද පුවරුව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- නෛපාතික ක්‍රියා හඳුනා ගෙන විස්තර කිරීම
- පූර්ව ක්‍රියා හඳුනා ගෙන නිදසුන් මගින් පැහැදිලි කිරීම
- මිශ්‍ර ක්‍රියා නිදසුන් සහිත ව ඉදිරිපත් කිරීම
- පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා සෑදෙන ආකාරය පැහැදිලි කිරීම
- මිශ්‍ර ක්‍රියා හා පූර්ව ක්‍රියා යොදා වාක්‍ය ලිවීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල භාෂා ව්‍යාකරණය, -- ඩබ්ලිව්. එස්. කරුණාතිලක,
- සිංහල ව්‍යාකරණ අකාරාදිය, -- රූපසිංහ පී. පෙරේරා, පද්මා ලංකා රූපසිංහ, -

**ඇමුණුම 1**

(i) ගුණානන්ද පොඩි හාමුදුරුවෝ ඉගෙනුමට ඉතා දක්ෂ ය. ගුණයහපත් ය. සෑම දිනයක ම උදෑසන පහට අවදි වන උන්වහන්සේ දත් මැද මුහුණ සෝදා බුද්ධ වන්දනාව කරති. ඉන්පසු මිදුල අතු ගා හීල් දානය වළඳති. පාඩම් වැඩ අවසන් කර දහවල් දානය වළඳා පිරිවෙනට වැඩම කරති. සවස බුද්ධ වන්දනාව කර ගිලන්පස වළඳා පාඩම් වැඩ කර සැතපෙති.

(ii) සමන් උඩ පනිමින් පාරේ යයි. ඔහු කතා කර කර බත් කයි. ගුරුවරු සමන්ට අවවාද දෙමින් හොඳ මඟ කියා දෙති. ඒ අනුව සමන් හොඳ ළමයෙකු බවට පත් වනු ඇත.

# ක්‍රියාකාරකම 10
# විවිධාර්ථවත් පද

**නිපුණතාව** : 3.0 භාෂා ක්‍රියාකාරකම් මගින් වාග්මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි.

**නිපුණතා මට්ටම** : 3.1 විවිධාර්ථවත් පද භාෂා කාර්යයන්හි දී අර්ථවත් ලෙස යොදා ගනියි.

**කාලච්ඡේද** : 03යි

**ඉගෙනුම් පල** :
- විරුද්ධාර්ථ පද හඳුනා ගෙන පැහැදිලි කරයි.
- සමානාර්ථ පද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- බහ්වර්ථ පද හඳුනා ගනිමින් පැහැදිලි කරයි.
- විවිධාර්ථවත් පද භාෂා කාර්යයේ දී වැදගත් බව ප්‍රකාශ කරයි.
- සමානාර්ථ, විරුද්ධාර්ථ, බහ්වර්ථ පද පිළිබඳ ව නිවැරදි අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**
- පෙළ පොතේ සඳහන් අංක 7 විවිධාර්ථවත් පද පාඩම කියවා විෂය අන්තර්ගතය පිළිබඳ ව අවබෝධය ලබා ගන්න.
- විවිධාර්ථ පද ලියන ලද පත්‍රිකා කිහිපයක් වෙන වෙන ම සකස් කර ගන්න.
- කාලච්ඡේද 3කට ගැළපෙන ලෙස විෂය කරුණු සංවිධානය කර ගන්න.

  1 පරිච්ඡේදය - විවිධාර්ථ පද හැඳින්වීම සහ සමානාර්ථ පද අධ්‍යයනය

  2 පරිච්ඡේදය - විරුද්ධාර්ථ පද

  3 පරිච්ඡේදය - බහ්වර්ථ පද

**ප්‍රවේශය** :
- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරන්න.

උදාහරණ ''උඩින් උඩින් වර පෙත්තප්පු - බිමින් බිමින් වර පෙත්තප්පු''

''උඩ පල ගත්තත් වට්ටක්කා - බිම පල ගත්තත් වට්ටක්කා''

මෙවැනි කවියක් ලබා දී එහි ඇති ඉරි ඇඳි පද පිළිබඳ ව විමසීම

- සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද හා බහ්වර්ථ පද ඇතුළත් ගද්‍ය ඡේදයක් ලබා දී එම පද වෙන වෙන ම හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම

**පාඩම සංවර්ධනය** :
- විවිධාර්ථ පද පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ඒ ඒ පද වර්ගය වෙන වෙන ම හඳුන්වා දී උදාහරණ සපයන්න.
- මේ සඳහා පෙළ පොතේ 7 පාඩම ඉවහල් කර ගන්න.
- ඒ ඒ පද භාවිත වන අවස්ථා සාකච්ඡා කරන්න.

- පද විස්සක් ලබා දී ඒවාට සමාන පද ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- පද විස්සක් ලබා දී විරුද්ධාර්ථ පද ලිවීමට අවස්ථාව දෙන්න.
- පෙළ පොතේ ක්‍රියාකාරකම් නිම කිරීමට උපදෙස් දෙන්න.
- විවිධාර්ථ පද සහිත පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විරුද්ධාර්ථ පද හඳුනා ගෙන පැහැදිලි කිරීම
- සමානාර්ථ පද හඳුනා ගනිමින් ඉදිරිපත් කිරීම
- බහ්වර්ථ පද හඳුනා ගෙන පැහැදිලි කිරීම
- විවිධාර්ථවත් පද භාෂා කාර්යයේ දී වැදගත් වන බව ප්‍රකාශ කිරීම
- සමානාර්ථ, විරුද්ධාර්ථ, බහ්වර්ථ පද පිළිබඳ නිවැරදි අවබෝධයෙන් ලිවීම

**ගුණාත්මක යෙදවුම් :**

- පැවරුම් පත්‍රිකා

**පරිශීලනීය ග්‍රන්ථ**

- සමානාර්ථ පද කෝෂය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- සිංහල රචනය හා රසාස්වාදය - පී. තේනබදු

## ක්‍රියාකාරකම 11
## වාක්‍ය නිර්මාණය

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් නිවැරදි ව අදහස් ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 03යි

**ඉගෙනුම් පල** :
- වාක්‍යයක උක්තාඛ්‍යාත සම්බන්ධය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- අර්ථවත් වාක්‍යයක් ගොඩනගා ගන්නා ආකාරය තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- සරල වාක්‍යයක් යන්න හඳුනා ගෙන එහි අංග විස්තර කරයි.
- සංකීර්ණ වාක්‍යයක් ගොඩ නැංවීමේ දී අවධානය යොමු කළ යුතු මූලිකාංග ප්‍රකාශ කරයි.
- කර්තෘකාරක වාක්‍යයක් හා කර්මකාරක වාක්‍යයක් අතර වෙනස තේරුම් ගෙන වාක්‍ය සකස් කරයි.
- ලේඛන කාර්යයේ දී වාක්‍ය නිර්මාණයේ ඇති අවශ්‍යතාව තේරුම් ගෙන පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ක්‍රියාකාරකමට අදාළ විෂය අන්තර්ගතය හොඳින් අධ්‍යයනය කරන්න. මේ සඳහා පෙළ පොතේ 8 පාඩම යොදා ගන්න.
- කාලච්ඡේද 4කට ගැළපෙන ලෙස පාඩම සැලසුම් කර ගන්න.
  1 කාලච්ඡේදය -- වාක්‍යයක ව්‍යුහය හඳුනා ගැනීම
  2 කාලච්ඡේදය -- සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය
  3 කාලච්ඡේදය -- කර්තෘකාරක වාක්‍ය
  4 කාලච්ඡේදය -- කර්මකාරක වාක්‍ය
- වාක්‍ය යනු කුමක් ද? වාක්‍යයක ප්‍රධාන කොටස් මොනවා ද? යන්න පැහැදිලි කරදීමට ප්‍රදර්ශන පුවරුවක් හෝ පිටු පෙරළනයක් සකස් කර ගන්න.
- උක්තය කර්මය හා අඛ්‍යාත ක්‍රියාව ප්‍රභේද කර දක්වීම සඳහා වගුවක් සකස් කර ගන්න.
- කාල භේදයට හා පුරුෂ භේදයට අනුව අඛ්‍යාත ක්‍රියාව සමාන අසමාන වන විශේෂ අවස්ථා පැහැදිලි කිරීමට නිදර්ශන පිළියෙල කර ගන්න.
- සචේතනික හා අචේතනික වාක්‍ය වෙනස් වන ආකාරය දැක්වීමට නිදර්ශන පිළියෙල කර ගන්න.
- කර්තෘකාරක කර්මකාරක වාක්‍ය අතර වෙනස දැක්වීමට සටහනක් පිළියෙල කර ගන්න. (ඇමුණුම 1)

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

- * 'බැටරි චාජ් කරනු ලැබේ' 'පරණ බඩු මිලට ගනු ලැබේ' වැනි වැකි කිහිපයක් ප්‍රදර්ශනය කිරීම.

  * සර්වනාම පද මුල් කර ගත් වැකියක් ඉදිරිපත් කිරීම.

- * කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය ගොනුවක් ශිෂ්‍යයන්ට ලබා දී ඒවා කර්තෘකාරක, කර්මකාරක ලෙස ප්‍රභේද කිරීමට අවස්ථාව ලබා දීම

**පාඩම සංවර්ධනය**

- වාක්‍ය යනු කුමක් දැයි නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරන්න. (මූලික වදන්/සංකල්ප බලන්න)
- විවිධ ස්වරූපයේ වාක්‍ය පවතින බව පෙන්වා දෙන්න.
- උක්තය හා ආඛ්‍යාත ක්‍රියාව වාක්‍යයක ප්‍රධාන කොටස් බව අවබෝධ කරන්න.
- උක්තයට හා අඛ්‍යාත ක්‍රියාවට යටත් වන පදය කර්ම පදය බව පැහැදිලි කරන්න.
- වාක්‍යයක උක්තය හා අඛ්‍යාත ක්‍රියාව වචනයෙන් ද පුරුෂයෙන් ද සමාන විය යුතු බව පැහැදිලි කරන්න.
- අප්‍රාණවාචී නාම පදයක් වාක්‍යක උක්ත වූ කල එය ඒක වචන වුව ද බහු වචන වුව ද ආඛ්‍යාතය ඒක වචනයෙන් තැබිය යුතු බව පැහැදිලි කරන්න.
- උක්තය කර්මය හා ආඛ්‍යාතයෙන් පමණක් සමන්විත වන වාක්‍ය සරල වාක්‍ය වශයෙන් හඳුනා ගත හැකි බවට නිදසුන් සපයන්න.
- උක්ත විශේෂණ කර්ම විශේෂණ හා ක්‍රියා විශේෂණවලින් යුත් අප්‍රධාන වාක්‍ය ඇතුළත් ප්‍රධාන වාක්‍ය වේ නම් ඒ සංකීර්ණ වාක්‍ය බව පැහැදිලි කරන්න.
- කර්තෘකාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය වෙන වෙන ම හඳුන්වා දෙන්න.
- එම වාක්‍යවල විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. නිදර්ශන සපයන්න.
- පෙළ පොතේ අභ්‍යාස නිම කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වාක්‍යයක උක්තය ප්‍රථමා විභක්තියෙන් ද කර්මය කර්ම විභක්තියෙන් ද තැබිය යුතු බවට සුදුසු පැවරුම් ලබා දෙන්න.
- සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය ගොනුවක් සකස් කිරීමට පැවරුමක් ලබා දෙන්න.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හැරවීම සඳහා පැවරුමක් ලබා දෙන්න.
- එදිනෙදා භාවිතයේ ඇති කර්මකාරක වාක්‍ය හැකිතාක් එක් රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප**

- වාක්‍යය

  වාක්‍යය වනාහි පූර්ණ අර්ථයක් ගෙන දෙන පරිදි එකට ගළපනු ලබන වචන සමූහයකි. වාක්‍යයේ කාර්යය සතර ආකාර වේ.

1. යම් අදහසක් ප්‍රකාශ කිරීම
2. ප්‍රශ්නයක් ඇසීම
3. යම් විධානයක්, අභියාචනයක් වැනි යමක් පැවසීම
4. යම් හැඟීමක් හෝ චිත්ත වේගයක් හෝ ප්‍රකාශ කිරීම ඒ සතරයි.

අංග සම්පූර්ණ වාක්‍යය කර්තෘ, කර්මය, ක්‍රියාව යන කොටස් තුනකින් යුක්ත බව සාමාන්‍ය පිළිගැනීමයි. මේ කොටස් ප්‍රකට ව නො සිට අධ්‍යාහාරයෙන් වුව තිබිය හැකිය.
සුරවීර ඒ. වී, සාහිත්‍ය කලා ප්‍රදීපිකා, කොළඹ 2012, 201 පිටුව

අර්ථ ඒකක වන පද සංඛ්‍යාවක් එහි අර්ථවල අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති වන සේ එක් වී, වඩා පුළුල් අර්ථ ප්‍රකාශ කරන්නේ වාක්‍යයි.
විතාරණ, විනී, පදය, වාක්‍යය සහ ඡේදය කොළඹ, 2008, 25 පිටුව

පද සමග ක්‍රියා පදයක් ගැළපීම ක්‍රියාකාරක පද සම්බන්ධය නම් මේ සම්බන්ධය ඇති පද සමූහය වාක්‍යයයි.
පෙරේරා, පී. රූපසිංහ, පද්මාලංකා රූපසිංහ,- සිංහල ව්‍යාකරණ අකාරාදිය, කොළඹ, 2000, 351 පිටුව

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම
- පැවරුම් පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- වාක්‍යයක උක්තාඛ්‍යාත සම්බන්ධය කුමක් දැයි පැහැදිලි කිරීම
- අර්ථවත් වාක්‍යයක් ගොඩනගන ආකාරය ප්‍රකාශ කිරීම
- සරල වාක්‍යයක් හඳුනා ගෙන එහි කොටස් ප්‍රකාශ කිරීම
- සංකීර්ණ වාක්‍යයක් ගොඩ නැගීමේ දී අවධානය යොමු කළ යුතු මූලිකාංග පැහැදිලි කිරීම
- කර්තෘකාරක කර්මකාරක වාක්‍ය අතර වෙනස හඳුනා ගෙන වාක්‍ය සැකසීම
- ලේඛන කාර්යයේ දී වාක්‍ය නිර්මාණයේ ඇති අවශ්‍යතාව තේරුම් ගෙන පැහැදිලි කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- සිංහල භාෂා ව්‍යාකරණ - ඩබ්ලිව්.එස්. කරුණාතිලක
- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය), - ජාතික අධ්‍යාපන ආයතනය
- පදය වාක්‍යය සහ ඡේදය - විනී විතාරණ

**ඇමුණුම 1 - කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය**

**කර්තෘකාරක වාක්‍ය**

1. කර්තෘ උක්ත වේ
2. උක්ත කර්තෘ ප්‍රථමා විභක්ති ගනියි
3. අනුක්ත කර්මය කර්ම විභක්ති ගනියි
4. කර්මය අනුක්ත වේ
5. අවසාන ක්‍රියාපදය කර්තෘකාරක වේ

**කර්මකාරක වාක්‍ය**

1. කර්මය උක්ත වේ.
2. උක්ත කර්මය ප්‍රථමා විභක්ති ගනියි
3. අනුක්ත කර්තෘ කර්තෘ විභක්ති ගනියි
4. කර්තෘ අනුක්ත වේ
5. අවසාන ක්‍රියාපදය කර්මකාරක වේ
6. අනුක්ත කර්තෘට පර ව 'විසින්' යන නිපාතය යෙදේ

## ක්‍රියාකාරකම 12
## රචනය

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 4.0 | අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. |
| **නිපුණතා මට්ටම** | : | 4.2 | ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. |
| **කාලච්ඡේද** | : | 03යි | |

**ඉගෙනුම් පල** :
- රචනා වර්ග හඳුනා ගෙන නම් කරයි.
- රචනාවක සැකිල්ලක් ගොඩනගා පැහැදිලි කරයි.
- වාක්‍ය රචනයක මූලික කරුණු හඳුනා ගනිමින් රචනාවක් නිර්මාණය කරයි.
- රචනාවක සාම්ප්‍රදායික යෙදුම්, භාෂා ප්‍රයෝග භාවිත කළ යුතු බව පිළිගෙන රචනා කරයි.
- අක්ෂර වින්‍යාසය, නිවැරදි භාෂාව රචනයක තිබිය යුතු බව පිළිගෙන භාවිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- පෙළ පොතේ 9 වන පාඩමට අදාළ විෂය අන්තර්ගතය අධ්‍යයනය කරන්න.
- රචනා සැකිල්ලක් සකස් කරන ආකාරය මැනවින් අධ්‍යයනය කරන්න. (ඇමුණුම 1)
- කාලීන මාතෘකා ඔස්සේ නිර්මාණය කරන ලද රචනා කීපයක් එකතු කර ගන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

උදාහරණ * ආදර්ශ රචනයක් ඉදිරිපත් කිරීම

- * රචනා සැකිල්ලක් ඉදිරිපත් කිරීම

**පාඩම සංවර්ධනය**

- භාෂාව යොදා ගනිමින් අදහස් විසිතුරු ලෙස ගැළපීම වාක්‍ය රචනය යැයි පැහැදිලි කරන්න.
- විසිතුරු අදහස් එක් රැස් කිරීමෙන් ඉතා රසවත් නිර්මාණයක් ගොඩනැගිය හැකි බව සාකච්ඡා කරන්න.
- වාක්‍ය රචනයක් ලිවීමේ දී අවශ්‍ය වන මූලික කරුණු පිළිබඳ ව පැහැදිලි කරන්න.
- නිරවුල් ව අර්ථ ප්‍රකාශනය සඳහා වාක්‍ය එක් තැන් කොට ගොඩනැගීමේ අගය පැහැදිලි කරන්න.
- වාක්‍ය රචනයේ දී භාෂා විලාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය අක්ෂර වින්‍යාසය, ඡේද බෙදා දැක්වීම ආදිය නිවැරදි ව කළ යුතු බව පැහැදිලි කරන්න.
- රචනයේ දී සාම්ප්‍රදායික යෙදුම් හා භාෂා ප්‍රයෝග උචිත පරිදි යොදා ගැනීමට උපදෙස් දෙන්න.

- සරල මාතෘකාවක් ඔස්සේ වාක්‍ය කිහිපයක් එක් තැන් කොට වාක්‍ය රචනයක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමට අදාළ රචනය පන්ති කාමරයේ දී පිටපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දී ඇති මාතෘකාවලට අදාළ ව රචනා සැකිල්ලක් ගොඩනැගීමට අවස්ථාව ලබා දෙන්න.
- රචනයක් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්වීම හා එහි අගය පිළිබඳ ඇගයීමක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ආදර්ශ රචනා
- රචනා සැකිලි
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- රචනා වර්ග හඳුනා ගෙන නම් කිරීම
- රචනාවක සැකිල්ලක් ගොඩනැගීම
- මූලික කරුණු හඳුනා ගෙන රචනාවක් ලිවීම
- සාම්ප්‍රදායික යෙදුම් හා භාෂා ප්‍රයෝග භාවිත කිරීම
- භාෂාව නිවැරදි වීම හා සාම්ප්‍රදායික යෙදුම් භාවිතය

**පරිශීලනීය ග්‍රන්ථ :**

සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු

**ඇමුණුම 1 :** ආදර්ශ රචනා සැකිලි

රචනයේ ඇට සැකිල්ල වනුයේ සැලැස්මයි. ජීවයෙන් යුත් ශරීරය ඇට සැකිල්ල පිහිට කොට ඇත්තා සේ රචනය සැලැස්ම පිහිට කොට නිර්මාණය කළ යුතුය සැලැස්ම තර්කානුකූල රමණීය පිළිවෙළකට සකස් කර ගත යුතු ය. පහත දැක්වෙන ආදර්ශ සැලසුම් පරීක්ෂා කර බලන්න.

1. පුරවැසියකුගේ යුතුකම්
   1. ආදි යුගයේ පටන් ම මනුෂ්‍යයා සාමූහික ව ජීවත් වන්නෙකි. එහෙයින් ජාති, කුල, ආගම්, රාජ්‍ය, සිරිත් විරිත්, ගුණධර්ම ආදිය ඇති විය. පාලන ක්‍රම, රාජ නීති, සමාජ නීති රීති, පහළ විය.
   2. වැසියාගේ නිදහස, ආරක්ෂාව, අයිතිවාසිකම් රැක දීම, රජයේ යුතුකම් ය. රාජ නීති, සමාජ නීති රීති, ආදිය ගරු කොට ඒවා පිළිපැදීම පුරවැසියාගේ යුතුකම ය.
   3. රාජ නීති, සමාජ නීති බිඳින්නා රජයටත් සමාජයටත් බරෙකි. හේ අපකීර්තියටත් විනාශයටත් පත් වෙයි.
   4. සමාජයේ හැම දෙනාගේ නිදහසට හා අයිතිවාසිකම්වලට ගරු කිරීමත් සමාජයේ පොදු යහපතට වැඩ කිරීමත් හොඳ පුරවැසියකුගේ යුතුකම් ය.

5. සාමය රැකීම, තාඩන පීඩනාදියෙන් වැළකීම ඇසුරු කරන්නවුන්ගේ සිත් දිනා ගැනීම, සිරිත් විරිත් රැකීම ගුණ දහම් දියුණු කිරීම, හොඳ පුරවැසියකුගේ යුතුකම් ය.

2. මට අමතක නොවන දර්ශනය
    1. දර්ශනය කුමක් ද යනු කෙටියෙන් හැඳින්වීම
    2. පිහිටීම, එහි ගිය සැටි හෝ එතැනට යා හැකි මග සලකුණු
    3. පරිසරය හෙවත් වටපිටාව
    4. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, භූගෝලීය, ශාස්ත්‍රීය තොරතුරු
    5. දැකුම්කලු දේ පිළිබඳ විස්තර
    6. දැකීමෙන් ලැබූ ප්‍රීතිය, විස්මය, කුතුහලය ආදී මානසික හැඟීම්, ආපසු ගමන ඉතා කෙටියෙන්

## ක්‍රියාකාරකම 13
## සාරාංශකරණය

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 4.3 පාඨයක අන්තර්ගතය නිවැරදි ව සාරාංශ කරයි.

6.4 පොත පත කියවීමෙන් ධාරණය කරගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 10යි

**ඉගෙනුම් පල** :

- ගද්‍ය පාඨ කියවා ප්‍රධාන අදහස ග්‍රහණය කර ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛනයකින් වැදගත් කරුණු උකහා ගැනීමේ පරිචය ප්‍රදර්ශනය කරයි.
- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු ප්‍රකාශ කරයි.
- කරුණු මැනවින් ගළපමින් සාරාංශකරණයේ යෙදෙයි.
- භාෂා ප්‍රයෝග භාවිත කරමින් සාරාංශ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- කියවා ලබා ගත් දැනුම සංක්ෂිප්ත කරමින් ප්‍රායෝගික ව යොදයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- විෂය අන්තර්ගතයේ සඳහන් පරිදි සාරාංශකරණය යනු කුමක් දැයි හොඳින් අධ්‍යයනය කරන්න. මේ සඳහා පෙළ පොතේ 10 පාඩම යොදා ගන්න.
- සාරාංශකරණයේ ක්‍රමශිල්ප හොඳින් අධ්‍යයනය කරන්න.
- පටිගත කරන ලද ප්‍රවෘත්තියක් ඇතුළත් හඬ පටයක් සකස් කර ගන්න.
- ප්‍රවේශය සඳහා යොදා ගැනිමට කතාන්දරයක් සූදානම් කර ගන්න.
- පෙළ පොතේ අන්තර්ගත සාරාංශකරණයේ ක්‍රමශිල්පවලට අමතර තවත් ක්‍රමශිල්ප ඇතුළත් සටහනක් සකස් කර ගන්න. (ඇමුණුම 2)

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

- * කලින් සකස් කර ගත් ප්‍රවෘත්තිය ඇතුළත් හඬ පටය ශ්‍රවණය කිරීමට සලස්වා එහි හරය කෙටියෙන් පැවසීමට අහඹු ලෙස තෝරාගත් ශිෂ්‍යයකුට හෝ දෙදෙනකුට අවස්ථාව ලබා දීම.
- * කතාන්දරයක් ඉදිරිපත් කර එහි වැදගත් සිද්ධි අනුපිළිවෙළින් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.

**පාඩම සංවර්ධනය**

- සාරාංශකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.
- සාරාංශකරණය එදිනෙදා ජීවිතයේ දී වැදගත් වන අවස්ථා පැහැදිලි කරන්න.

- සාරාංශකරණයේ ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
- සාරාංශකරණයේ ක්‍රමශිල්ප හඳුන්වා දෙන්න. මේ සඳහා පෙළ පොතේ ඇති ක්‍රමශිල්ප සහ ඔබ විසින් එක් රැස් කර ගත් ක්‍රමශිල්ප ද හඳුන්වා දෙන්න. (ඇමුණුම 1)
- සාරාංශයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ පැහැදිලි බව, කෙටි බව හා සම්පූර්ණ බව යන්න සාකච්ඡා කරන්න.
- ඇමුණුම 2 ඉවහල් කර ගෙන පන්ති කාමරයේ දී සාරාංශකරණය හුරු වීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ අභ්‍යාස සම්පූර්ණ කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් විසින් ඇසීමෙන්, දැකීමෙන් හා කියවීමෙන් ලත් අත්දැකීමක් කෙටියෙන් ප්‍රකාශ කිරීමටත් එමගින් සාරාංශකරණය හුරුවීමටත් අවස්ථාව ලබා දෙන්න.
- විෂය නිර්දේශයට අදාළ කෘතියක තෝරා ගත් ඡේදයක කොටසක් ලකුණු කර දී එහි සාරාංශකරණය දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙර දින අසන ලද ප්‍රවෘත්තියක් සාරාංශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කියවීමෙන් ලබා ගත් දැනුම සුදුසු අවස්ථාවල දී භාවිත කිරීමට හුරු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පරිශීලනීය ග්‍රන්ථ
- ඇමුණුම 1 හා 2
- ප්‍රවේශය සඳහා පටිගත කරන ලද ප්‍රවෘත්තියක්
- කතාන්දරයක්
- සාරාංශ කිරීමට සුදුසු ඡේද කිහිපයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු විශේෂ කරුණු ප්‍රකාශ කිරීම
- ගද්‍ය පද්‍ය පාඨ කියවා අදහස ග්‍රහණය කර ගැනීම
- ලේඛනයකින් වැදගත් කරුණු උකහා ගැනීමේ පරිචය දැක්වීම
- කරුණු මැනවින් ගළපමින් සාරාංශකරණයේ යෙදීම
- භාෂා ප්‍රයෝග භාවිත කරමින් සාරාංශකරණයේ යෙදීම
- ලබා ගත් දැනුම සංක්ෂිප්ත ව ප්‍රකාශ කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබඳු

**ඇමුණුම 1**

සාරාංශ ලිවීමට උපදෙස්

* පාඨයේ ප්‍රස්තුතය හෙවත් අරමුණ දැන ගැනීමට වරක් හෝ දෙකක් කියවන්න. මුල සිට අග දක්වා සම්පූර්ණයෙන් කියවා අරමුණ සොයා ගෙන කඩදාසියක සටහන් කර ගන්න.

* දෙවැනි ව නැවතත් කියවා පාඨයෙහි යෙදී ඇති වචන හා වාක්‍යවල නිවැරදි අර්ථය පැහැදිලි කර ගන්න.
* පාඨය නැවත නැවත කියවමින් අරමුණ ගැන අදහස් හෝ කරුණු කෙටියෙන් හෝ සටහන් කර ගන්න.
* අනතුරුව සටහන් කර ගත් කරුණු විමසා බලා වැදගත් කරුණු හා නො වැදගත් කරුණු නිශ්චය කරන්න. තෝරා බේරා ගන්නා වැදගත් කරුණු අංක යොදා එකින් එක සටහන් කරන්න.
* සාරාංශයේ භාෂාව ඔබේ ම භාෂාව විය යුතු ය. මුල් පාඨයෙන් ගත් වාක්‍යය හෝ වාක්‍යාංශයන් ඇඳා නො ගත යුතු ය. උවමනා නම් වචන ගත හැකි ය.
* උපමා, අලංකාර, වර්ණනා, විස්තර අනවශ්‍ය විශේෂණ ආදිය සාරාංශයට අවශ්‍ය නැති බව සලකන්න.
* සාරාංශය සම්පූර්ණ එකක් කරන්න. මුල් පාඨයෙහි සාරවත් කොටස පැහැදිලි ලෙස සම්පූර්ණයෙන් සාරාංශයට ඇතුළත් කිරීමට පරෙස්සම් වන්න.
* මුල් පාඨයෙහි ප්‍රකෘති කථන ඇත්නම් ඉතා කෙටි වන සේ විකෘති කථනයට පෙරළා ගන්න.
* ඔබේ සාරාංශය ව්‍යාකරණානුකූල වූ සරල භාෂාවෙන් හා ප්‍රාණවත් ශෛලියකින් යුක්ත ව සකස් කරන්න.
* මුල් පාඨයෙහි කරුණු යෙදී ඇති පිළිවෙළ ම අනුගමනය කිරීම අවශ්‍ය නොවේ. ඒ අදහස් වඩා නිරාකුල වන සේ වඩා රමණීය ව අන් පිළිවෙළකට සකස් කළ හැකි නම් එසේ කරන්න.
* සංක්ෂේප කිරීමේ දී වාක්‍යයක් හා වාක්‍යාංශ සම්පූර්ණයෙන් අත්හැර දැමීමට වඩා ඒවා හැකිතාක් කෙටි කර නිර්මාණශීලී ව දීමට උත්සාහ ගන්න. පාඨයෙහි ඇති වචනවලට ඒ අර්ථය දෙන අනෙක් වචනත් යෙදීම වඩාත් යෝග්‍ය ය. වෙනත් වචන දීමට නො හැකි නම් පාඨයෙහි වචන යොදන්න.
* මෙම උපදෙස් පිළිපදිමින් පහත දෙන ලද පාඨයෙහි සාරාංශකරණය සකස් කරමු.

**ඇමුණුම 2**

සාරාංශකරණය හුරුවීමේ අභ්‍යාසය

මෙම ඡේදය හොඳින් කියවා වචන හැටකට පමණ සාරාංශ කරන්න.

''පැරණි සිංහල ජනයාගේ සමාජය හැඩ ගැසුණේ ගොවිකම මුල් කොට ගෙන බව සැලකිය යුතු ය. පැරණි සිංහලයන් ගොවිකම් කළේ වැව් ඉවහල් කොට ගෙන ය. එහෙයින් වැව් සිංහල සභ්‍යත්වයෙහි හා සංස්කෘතියෙහි ද උපතටත් වැඩීමටත් බෙහෙවින් ඉවහල් විය. මහ වැව් අමතක කොට සිංහල සභ්‍යත්වය හෝ සංස්කෘතිය උගැන්ම සාධාරණ නො වේ. සිංහල සභ්‍යත්වය හෝ සංස්කෘතිය පහළ වූයේත් වැඩුණේත් රජුන් විසින් කරවන ලද මහ වැව්වලින් අලංකාර වුණු මහා නිම්නයෙහි ය.

වැව් තැනීමත් රැකීමත් සඳහා පැරණි සිංහලයෝ තමන්ගේ කාලයෙනුත් වැයමෙනුත් වැඩිහරියක් ගෙවූහ. නිතර පැමිණි සතුරන් විසින් වැව් විනාශ කරන ලදින් ඔවුහු ඒ වැව් ප්‍රකෘතිමත් කිරීමට නැවත නැවතත් වැයම් කළෝ ය. යෝධ වැවේ බැම්ම ප්‍රකෘතිමත් කිරීමට පමණක් මිනිසුන් පන්සීයක් පස් මසක් වැඩ කළ යුතුයැයි වැන් ඉන්ශෝප් නමැති ඕලන්ද ආණ්ඩුකාරයාට ඒ වැව අසල පෙදෙසෙහි විසූ එකල ජනයා සැලකළහයි මැත ඉතිහාසයෙහි සඳහන් වෙයි.

පැරණි සිංහලයන්ගේ අපූර්ව ශූරත්වයටත් සංස්කෘතියටත් නිදසුන් කළ හැකි නිර්මාණයන්ගෙන් පළමුවැන්න වැව් ය. සිංහල සංස්කෘතියේ මුදුන්මල් හටගත් කාලය මෙන් පුරා විද්‍යාඥයන් හඳුන්වන්නේ තුන් වන ශත වර්ෂයටත් අට වන ශත වර්ෂයටත් අතරතුර අවධියකි. ලක්දිව වැව් කර්මාන්තය අග්‍රස්ථානය තෙක් දියුණු වූයේ ඒ අවධියෙහි යයි ඒ. ඇම්. හෝකාර්ට් මහතා කීය.''

මේ පාඨය වරක් අවධානයෙන් කියවා බැලීමෙන් පාඨයේ ප්‍රස්තුතය නිශ්චය කළ හැකි ය. පුරාණ සිංහලයන්ගේ සමෘද්ධිය ද සභ්‍යත්වය ද සංස්කෘතිය ද ඇති වීමට හා වැඩීමට ප්‍රධාන හේතුව වූයේ වැව් කර්මාන්තයයි යන්න මේ පාඨයේ ප්‍රස්තුතයයි.

පියවර 1

කෙටියෙන් සටහන් කිරීම

පාඨයෙහි ප්‍රස්තුතය පිළිබඳ කියැවෙන විස්තර කෙටියෙන් සටහන් කරමු.

1. පැරණි සිංහල සමාජය දියුණු වී හැඩ ගැසුණේ ගොවිකමෙනි. ගොවිකමට වැව් උපකාරී වේ.
2. සිංහල සභ්‍යත්වයේත් සංස්කෘතියේත් උපතට හා වැඩීමට වැව් ඉවහල් විය.
3. මහා වැව් ඇති වූ මහා නිම්නයෙහි ම සභ්‍යත්වය හා සංස්කෘතිය පහළ වී වැඩුණේ ය.
4. පැරණි සිංහලයෝ වැව් කර්මාන්තයට බොහෝ වෙහෙසුණෝ ය.
5. පිටරටවලින් පැමිණි සතුරෝ වැව් බැම් විනාශ කළහ. සිංහලයෝ ඒවා නැවත නැවතත් අලුත් වැඩියා කළහ.
6. යෝධ වැවේ බැම්ම අලුත් වැඩියා කිරීමට මිනිසුන් පන්සීයක් පස් මසක් වැඩ කළ යුතුයි.
7. පැරණි සිංහලයාගේ ශූරත්වයටත් සංස්කෘතියටත් නිදසුන් කළ හැකි පළමු වන නිර්මාණය වැව් ය.
8. වැව් කර්මාන්තය ඉතා දියුණුව පැවැති කාලය සිංහල සංස්කෘතිය ඉතා උසස් ව පැවැති කාලයයි.

මෙම සටහනෙහි 1,2,3,4,5,7,8 අංක යටතේ ඇති වුණු කරුණු සාරවත් ය. එහෙත් යෙදී ඇත්තේ විස්තර සහිත ව බැවින් ඒ විස්තර හැර දමා වැදගත් කරුණු කැටි කොට සාරාංශයේ දළ පිටපතක් සකසා ගත යුතු ය.

පියවර 2

දළ පිටපත සැකසීම

1. පුරාණ- සිංහල- සමාජයේ- සමෘද්ධිය- සභ්‍යත්වය -සංස්කෘතිය- ඇති- වීමට -හා -වැඩීමට- වැව්- බොහෝ උපකාරී- විය.
2. මහ-වැව්- තැනීමටත්- සතුරන්- කඩා- දැමූ- වැව්- බැමි- ප්‍රකෘතිමත්- කිරීමටත්- සිංහලයෝ- බොහෝ- වෙහෙසුණෝ ය.
3. සිංහල -සංස්කෘතිය- උසස්- වූයේ- වැව්- කර්මාන්තය- ඉතා -දියුණු- වූ- කාලයෙහි ය.

මේ දළ පිටපතෙහි ඇත්තේ වචන 36කි. අපට තව වචන 24ක් ඉතිරි ව ඇති හෙයින් තවත් වැදගත් කරුණු එක් කොට වඩාත් හොඳින් සාරාංශය ගොඩ නගමු.

පියවර 3

සාරාංශය ගොඩනැගීම

පුරාණ -සිංහල- සමාජයේ- සමෘද්ධිය- සභ්‍යත්වය- හා- සංස්කෘතිය- ඇති- වීමටත්- වැඩීමටත්- වැව්- බොහෝ- උපකාරී විය.- මහ-වැව්- තැනීමටත්- සතුරන්- විනාශ- කළ- වැව් -ප්‍රකෘතිමත්- කිරීමටත්- එකල- සිංහලයන්ගේ- කාලයත්- වෑයමත්- බෙහෙවින්- යෙදුණේය-. ඔවුන්ගේ- ශූරත්වයටත්- සංස්කෘතියටත්- ප්‍රධාන- නිදර්ශනය- කළ- හැක්කේ- වැව් -කර්මාන්තයයි- සභ්‍යත්වය හෝ- සංස්කෘතිය- ඉතා -උසස්- තැනට -නැංගේ- වැව්- කර්මාන්තය- ඉතා- දියුණු- වී- පැවැති- තුන්-වන- හා අට- වන- ශතවර්ෂය- අතර- කාලයේ යයි- පුරාවිද්‍යාඥයෝ- කියති.

## ක්‍රියාකාරකම 14
## ප්‍රායෝගික ලේඛන

**නිපුණතාව** : 5.0 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.1 නිවැරදි ව හා නිර්මාණශීලී ව ආරාධනා පත්‍ර, දැන්වීම් පත්‍රිකා, සුබපැතුම් පත් සකස් කරයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල** :
- ප්‍රායෝගික ලේඛන හඳුනා ගෙන පැහැදිලි කරයි.
- ප්‍රායෝගික ලේඛනවල අවශ්‍යතාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- විවිධ ලේඛන ආකෘති අධ්‍යයනය කර වර්ග කරයි.
- නිවැරදි ව හා නිරවුල් ව ප්‍රායෝගික ලේඛන මූලිකාංග භාවිත කරයි.
- ප්‍රායෝගික අවශ්‍යතා සඳහා විවිධ ලේඛන නිර්මාණාත්මක ව සකස් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- පෙළ පොතේ 11 වන පාඩමට අදාළ විෂය අන්තර්ගතය අධ්‍යයනය කරන්න. එම විෂය අන්තර්ගතය කාලච්ඡේද 6කට සැලසුම් කර ගන්න.

  1, 2 කාලච්ඡේද - ප්‍රායෝගික ලේඛන හැඳින්වීම හා සුබපැතුම් නිර්මාණය

  3, 4 කාලච්ඡේද - ආරාධනා පත් නිර්මාණය

  5, 6 කාලච්ඡේද - දැන්වීම් නිර්මාණය
- ඉගෙනුම් ආධාරක සකස් කර ගන්න.
- විවිධ ආරාධනා පත්‍ර, දැන්වීම් හා සුබපැතුම් පත් එක් රැස් කර ගන්න.
- සාම්ප්‍රදායික හා නූතන ප්‍රායෝගික ලේඛන වෙන් වෙන් වශයෙන් ප්‍රදර්ශනය කිරීමට සූදානම් ව ගොනුවක් සකස් කර ගන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

  උදාහරණ : * ආකර්ෂණීය දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම

  * විවිධ ආරාධනා පත්‍ර, දැන්වීම්, සුබපැතුම් කීපයක් ශිෂ්‍යයන් අතරේ බෙදා දී ඒවා කවර ලේඛන වර්ගවලට අයත් දැයි විමසීම

**පාඩම සංවර්ධනය**

- ප්‍රායෝගික ලේඛන යනු වාර්තා, ආරාධනා පත්‍ර, අත් පත්‍රිකා, සුබපැතුම් පත්, න්‍යාය පත්‍ර හා දැන්වීම් පත්‍ර ආදිය යන්න හඳුන්වා දෙන්න.
- එදිනෙදා ජීවිතයේ දී අප භාවිත කරන විවිධ ප්‍රායෝගික ලේඛන වර්ග තිබෙන බව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- ඒවායෙහි වෙනස්කම් සහ ඒවාට ම ආවේණික වූ ලක්ෂණ පවතින බව පෙන්වා දෙන්න.

- ප්‍රායෝගික ලේඛන වර්ග වෙන් වශයෙන් වර්ග කරන්න.
- එක් එක් ප්‍රායෝගික ලේඛනවල ලක්ෂණ හා එම ලේඛන භාවිත කරන අවස්ථා ලැයිස්තු ගත කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ප්‍රායෝගික ලේඛන නිවැරදි ව හා නිරවුල් ව සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- සාම්ප්‍රදායික හා නූතන ආකෘති අනුගමනය කරමින් ආකර්ෂණීය ලෙස ප්‍රායෝගික ලේඛන සකස් කළ හැකි බව පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 1හි සඳහන් පැවරුම් පත්‍රිකා ඒ ඒ කාලච්ඡේද අනුව ශිෂ්‍යයන්ට ලබා දී පැවරුමෙහි නිරත කරවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් අවසානයේ ශිෂ්‍යයන් සකස් කර ඇති ප්‍රායෝගික ලේඛන පිළිබඳ ඇගයීමක් සිදු කරන්න. අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- ශිෂ්‍යයන් විසින් සකස් කරන ලද ආරාධනා පත්‍ර දැන්වීම් පත්‍ර හා සුබපැතුම් පත් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- පෙළ පොතේ අභ්‍යාස පන්ති කාමරයේ දී නිම කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇගයීමේ දී හඳුනා ගත් අඩුපාඩු සකසා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ ආරාධනා පත්‍ර
- සුබපැතුම් පත්
- දැන්වීම් පත්‍ර

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ප්‍රායෝගික ලේඛන හඳුනා ගෙන පැහැදිලි කිරීම
- ප්‍රායෝගික ලේඛනවල අවශ්‍යතාව තේරුම් ගැනීම
- විවිධ ප්‍රායෝගික ලේඛන ආකෘති අධ්‍යයනය කිරීම
- ප්‍රායෝගික ලේඛනයක මූලිකාංග හඳුනා ගෙන භාවිත කිරීම
- විවිධ අවශ්‍යතා සඳහා ප්‍රායෝගික ලේඛන නිර්මාණාත්මක ව සකස් කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු

**ඇමුණුම 1 - පැවරුම් පත්‍රිකා**

**පැවරුම 1 - සුබපැතුම් පත් නිර්මාණය**

1 කණ්ඩායම — සමස්ත ලංකා පිරිවෙන් ගද්‍ය රචනා තරගයෙන් ප්‍රථම ස්ථානය ලබා ගත් විහාරස්ථානයේ පොඩි හාමුදුරුවන්ට සුබපැතීම සඳහා සුදුසු සුබපැතුම් පතක් නිර්මාණය කරන්න.

2 කණ්ඩායම නිකායික කාරක සංඝ සභාව මගින් ගමේ පන්සලේ ගරු ලොකු හාමුදුරුවන්ට පළාතේ ප්‍රධාන සංඝනායක ධුරය පිරිනමා ඇත. ඒ නිමිත්තෙන් උන්වහන්සේට සුබපතා සුබපැතුම් පතක් නිර්මාණය කරන්න.

3 කණ්ඩායම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රදේශයේ හොඳ ම සමාජ සේවකයා ලෙස විහාරස්ථ දායක සභාවේ ගරු ලේකම්තුමා තෝරා ගෙන ඇත. එතුමාට යැවීම සඳහා සුදුසු සුබපැතුම් පතක් නිර්මාණය කරන්න.

**පැවරුම 2 - ආරාධනා පත් නිර්මාණය**

1 කණ්ඩායම අභිනවයෙන් උපසම්පදා සීලයෙහි පිහිට වූ ගරු පොඩි හාමුදුරුවන් ගමේ විහාරස්ථානයට වැඩම කරවීමේ හා පිළිගැනීමේ පුණ්‍යෝත්සවයක් පැවැත්වීමට විහාරස්ථ දායක සභාව තීරණය කර ඇත. එකී උත්සවයට වැඩම කරවන ලෙස ස්වාමීන් වහන්සේලාට හා ආරාධිතයන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් පිළියෙල කරන්න.

2 කණ්ඩායම විහාරස්ථ දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය මෙවරත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට සූදානම් වෙයි. එකී උත්සවයට ආරාධනා කිරීමට සුදුසු ආරාධනා පත්‍රයක් පිළියෙල කරන්න.

3 කණ්ඩායම විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත සීමාමාලකයට මුල්ගල් තැබීමේ උත්සවය උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් පිළියෙල කරන්න.

**පැවරුම 3 - දැන්වීම් නිර්මාණය**

1 කණ්ඩායම විහාරස්ථානයේ අභිවෘද්ධිය සඳහා නව දායක සභාවක් පිහිටුවා ගැනීමට ගම්වාසීහු තීරණය කළහ. ඒ සඳහා සහභාගී වන ලෙස සතර පේරුවේ දායක දායිකාවන් වෙත යැවීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

2 කණ්ඩායම විහාරස්ථ 'සිරි සිදුහත්' ළමා සමාජය මගින් මෙවරත් පොසොන් උත්සවය නිමිති කර ගෙන ලේ දන්දීමේ කඳවුරක් පැවැත්වීමට යෝජනා වී ඇත. ඒ සඳහා මහජනතාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

3 කණ්ඩායම පිරිවෙන් ඡායාරූප සංගමය වාර්ෂික ව සංවිධානය කරන ඡායාරූප ප්‍රදර්ශනය මෙවරත් විශේෂ ආරාධිත අමුත්තකුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු සංවිධානය වෙමින් පවතී. ඒ පිළිබඳ පිරිවෙනේ සියලු ශිෂ්‍යයන් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

## ක්‍රියාකාරකම 15
## අර්ථාවබෝධය (නිශ්ශබ්ද කියවීම)

**නිපුණතාව** : 6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.

6.5 ගද්‍ය පද්‍ය පාඨ කියවා අර්ථය වටහා ගත් බව ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 09යි

**ඉගෙනුම් පල** :

- ගද්‍ය පද්‍ය පාඨවල අදහස ග්‍රහණය කරගෙන ඉදිරිපත් කරයි.
- හඳුනා ගත් සුවිශේෂ වචනවල අර්ථ ලියා දක්වයි.
- පද විග්‍රහ කරමින් අර්ථ දක්වයි.
- ගද්‍ය පද්‍ය පාඨවලින් ධ්වනිත වන අදහස් ප්‍රකාශ කරයි.
- ගද්‍ය පද්‍ය පාඨ කියවා වටහාගත් අර්ථ ප්‍රායෝගික ව යොදා ගනියි.
- ගද්‍ය පද්‍ය පාඨ කියවා එහි තේරුම පැහැදිලි කරයි.
- ගද්‍ය පද්‍ය පාඨ කියවා එහි වැදගත්කම ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- පෙළ පොතේ 12 වන පාඩමට අදාළ විෂය අන්තර්ගතය හොඳින් අධ්‍යයනය කරන්න.
- ගද්‍ය පාඨයක් හෝ පද්‍ය පන්තියක් කියවා නිවැරදි ව අර්ථය අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය සාධක හඳුනා ගන්න.
- අර්ථාවබෝධය කර ගැනීමේ අවශ්‍යතා හඳුනා ගන්න.
- අර්ථාවබෝධය පිළිබඳ ප්‍රශ්න විසඳීමේ දී ඊට අදාළ උපදේශ පිළිබඳ අධ්‍යයනය කරන්න.

**ප්‍රවේශයඃ**

- පහත සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  * ගද්‍ය පාඨ හෝ පද්‍ය ඛණ්ඩ හෝ ලියන ලද ප්‍රදර්ශන පුවරුවක් ඉදිරිපත් කර වාචික ප්‍රශ්න විමසීම.
  * අනිර්දිෂ්ට ග්‍රන්ථයකින් තෝරා ගත් ගද්‍ය හෝ පද්‍ය පාඨයක් ශිෂ්‍යයෙකු ලවා කියවීමට සැලැස්වීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.

**පාඩම සංවර්ධනය :**

- ප්‍රවේශයේ දී යොදා ගත් ගද්‍ය හෝ පද්‍ය පාඨයේ පදානුගත අර්ථය පැහැදිලි කරන්න.
- එහි ඇතුළත් භාෂා ප්‍රයෝග පිළිබඳ ව දැනුම පරීක්ෂා කිරීම.
- ශිෂ්‍යයන් ලවා ඒවායේ අර්ථ ලිවීමට සලස්වන්න.
- නිර්දිෂ්ඨ කෘතියක ගද්‍ය පාඨයන් හෝ පද්‍ය ඛණ්ඩයන් ලබා දී ඒ ඇසුරෙන් ගොඩනගන ප්‍රශ්නවලට නිශ්චිත නිවැරදි පිළිතුරු ලබා දීමට හුරු කරවන්න.
- භාෂාත්මක ප්‍රකාශනවල ඇතුළත් අදහස් තේරුම් ගැනීම අර්ථාවබෝධය බව පැහැදිලි කරන්න.
- අර්ථාවබෝධය, උසස් ලෙස භාෂාව හැසිරවීමට අවශ්‍ය කුසලතාවක් බව සාකච්ඡා කරන්න.

- අර්ථාවබෝධය ක්‍රියාකාරකමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරන්න. (ඇමුණුම 1)
- පෙළ පොතේ අන්තර්ගත අභ්‍යාස නිම කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ ඇති පාඩම්වල අභ්‍යාසයන්හි දුරවබෝධ වචන පෙළගස්වන්න.
- ඇමුණුම 2හි සඳහන් ආදර්ශ අභ්‍යාස සහ වෙනත් සුදුසු අභ්‍යාස ශිෂ්‍යයන්ට ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පැවරුම් පත්‍රිකා
- ඇමුණුම 1, 2, 3, 4

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ගද්‍ය පද්‍ය පාඨ කියවා ග්‍රහණය කර ගත් අදහස් ඉදිරිපත් කිරීම
- සුවිශේෂ වචනවල අර්ථ දැක්වීම
- පද විග්‍රහ කරමින් අර්ථ දැක්වීම
- ගද්‍ය පද්‍ය පාඨවල ධ්වනිත වන අදහස් ප්‍රකාශ කිරීම
- වටහා ගත් අර්ථ ප්‍රායෝගික ව යොදා ගැනීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

සිංහල රචනය හා රසාස්වාදය - පි. තේනබන්දු

ඇමුණුම 1

අර්ථාවබෝධය අභ්‍යාසවල දී සැලකිලිමත් විය යුතු කරුණු

i පාඨයෙහි ඇතුළත් අදහස් හෝ කරුණු තේරුම් ගැනීමේ හැකියාව විමසීම

ii වර්තමාන භාෂා ව්‍යවහාරය පිළිබඳ දැනීම පරීක්ෂා කිරීම

iii පාඨයෙහි යෙදී ඇති වචනවල හා වාක්‍යාංශවල අර්ථ පැහැදිලි කිරීම

iv සමානාර්ථ වචන හා විරුද්ධාර්ථ වචන ලබා දීම

v අර්ථ පැහැදිලි වන සේ වචන යොදා වාක්‍යයක් තැනීම

vi උපමාදිය හා ඒවායේ සුදුසු නුසුදුසුකම සෙවීම

vii වචන කිහිපය බැගින් ඇති වාක්‍යාංශවල අදහස් තනි වචනවලින් ප්‍රකාශ කිරීම

**ඇමුණුම 2**

ආදර්ශ අභ්‍යාස (පද්‍ය)

(1) දවසට සිය විටක් මවුපිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිලෙන සිහින පිට මං කළ නො හැක හිසින්

i 'ඉගිලෙන සිහින' 'කුරුලු රසින්' යන ප්‍රකාශවල අර්ථය පැහැදිලි කරන්න.

ii මෙම කවියේ සමස්ත අර්ථය ඔබේ වදනින් ලියන්න.

(2) සටනක් නැති ව සැපතක් ඇති විය නො හැක
මේ රැකවරණ තුළ ඇති සුව සිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

i උවදුරු දිගේ යන දිගු මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක
මේ කවි දෙපදයෙහි ගැබ් වී ඇති අදහස පැහැදිලි කරන්න.

ii මෙම පද්‍යය රචනා වී ඇත්තේ කුමන තේමාවකට අනුව ද?

## ක්‍රියාකාරකම 16
## විවිධ ශෛලි අනුව කියවීම

**නිපුණතාව** : 6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 6.3 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.

**කාලච්ඡේද** : 03යි

**ඉගෙනුම් පල** :
- විවිධ ශෛලියෙන් රචිත පොත පත හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විවිධ ශෛලීන්ට අනුව කියවිය හැකි බව පැහැදිලි කරයි.
- ආවේණික ශෛලීන්ට අනුව කියවීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- කියවීමේ විවිධ ශෛලීන්ට අනුගත ව ගද්‍ය- පද්‍ය පාඨ ඉදිරිපත් කරයි.
- විවිධ ශෛලීන්ට අනුව කියවීමේ දී සතතාභ්‍යාස අත්‍යවශ්‍ය බව පෙන්වා දෙයි.
- උචිත ශෛලියකට අනුව කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- මෙම ක්‍රියාකාරකමට අදාළ විෂය අන්තර්ගතය හොඳින් අධ්‍යයනය කරන්න. මේ සඳහා පෙළ පොතේ 12 පාඩම යොදා ගන්න.
- කාලච්ඡේද 3කට ගැළපෙන ලෙස පාඩම සැලසුම් කර ගන්න.
  1 කාලච්ඡේදය - විවිධ ශෛලි හඳුන්වා දීම
  2 කාලච්ඡේදය - ගද්‍ය පාඨ කියවීමේ විවිධ ශෛලි පුහුණු කරවීම
  3 කාලච්ඡේදය - පද්‍ය පාඨ කියවීමේ විවිධ ශෛලි පුහුණු කරවීම
- විවිධ ශෛලීන්ට අනුව කියවන ලද විවිධ පාඨ ඇතුළත් හඬ පටයක් සකස් කර ගන්න.
  උදාහරණ : පිරිත් දේශනයක්, ජාතක පොත කියවීම, දේව කන්නලව්, කවි සහ ගීත ගායනා
- විවිධ ශෛලීන්ට අනුව තෝරා ගත් ගද්‍ය, පද්‍ය පාඨ, පන්ති කාමරයේ ශබ්ද නගා කියවීමට හුරුව ඇති කර ගන්න.
- විවිධ ශෛලීන්ට අනුව ගායනා කළ හැකි සිසුන් කිහිපදෙනකුට තෝරා ගත් ගද්‍ය පද්‍ය පාඨ ලබා දී පුහුණු කර ඔවුන් සූදානම් කරවන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  * පිළියෙල කර ගත් හඬ පටය ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීමට සැලැස්වීම.
  * ඔබ විසින් සූදානම් කරන ලද ශිෂ්‍යයන් ලවා පෙළ පොතේ අන්තර්ගත ගද්‍ය, පද්‍ය කොටස් නියමිත ශෛලීන්ට අනුව ම ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.

**පාඩම සංවර්ධනය**

- කියවීමේ හා ගායනයේ විවිධ ශෛලි පවතින බව ශිෂ්‍යයන්ට පෙන්වා දෙන්න.
- එම එක් එක් ශෛලිය ශ්‍රවණය කර අවබෝධ කර ගැනීමට අවස්ථාව දෙන්න.
- විවිධ ශෛලි භාවිත කිරීමේ අවශ්‍යතාව හා එකී අවස්ථා උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- එම ශෛලි හුරුවීමේ වැදගත්කම හා එහි ප්‍රයෝජන පෙන්වා දෙන්න.
- එක් එක් ශෛලියේ අනන්‍යතා ලක්ෂණ හඳුනා ගෙන එම ශෛලියෙන් ගද්‍ය පද්‍ය පාඨ කියවීමට/ගායනයට ශිෂ්‍යයන් හුරු කරවන්න.

  උදාහරණ : ශ්‍රැති ගෝචර ශෛලිය
  කතන්දර ශෛලිය
  නාට්‍ය ශෛලිය
  පිරිත් දේශනා ශෛලිය
  ගීත ගායනා ශෛලිය

- තනි තනි ව හා කණ්ඩායම් වශයෙන් ගද්‍ය පද්‍ය පාඨ විවිධ ශෛලියෙන් ප්‍රකාශ කිරීමට පැවරුමක් ලබා දෙන්න.
- ශිෂ්‍යයන්ගේ ඉදිරිපත් කිරීම් අධීක්ෂණය කර අඩුපාඩු සකස් කරන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.
- ශිෂ්‍ය සමිතිය සඳහා විවිධ ශෛලියෙන් ගද්‍ය හා පද්‍ය කියවීමට/ගායනා ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පැවිදි ජීවිතයේ විවිධ අවස්ථා සඳහා මෙම කියවීමේ ශෛලි යොදා ගැනීමට ශිෂ්‍යයන් දිරිමත් කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- **සතතාභ්‍යාසය**

  නිරන්තරයෙන් අදාළ කාර්යයෙහි යෙදීමෙන් පුහුණු වීම, ප්‍රගුණ කිරීම
  සාහිත්‍ය කලා නිර්මාණ ක්ෂේත්‍රයෙහි අඛණ්ඩ ව ඒ කටයුතුවල නිරත වීම අපේක්ෂිත ය.
  සාහිත්‍ය විචාර ප්‍රදීපිකා, සුරවීර, ඒ. වී, -කොළඹ 2005, - 217 පි.

- **ශෛලිය**

  ශෛලිය නම් ප්‍රකාශන විලාසයයි. ශෛලිය කථනයට මෙන් ම ලේඛනයට ද අදාළ වේ. කථනයේ දී හෝ ලේඛනයේ දී කථකයා හෝ ලේඛකයා විසින් භාවිත කරනු ලබන වාංමාලාව, තානය, වාගාලංකරණ ආදිය ශෛලියට අයත් වේ. ශාස්ත්‍රීය ලේඛනයක දී විෂය කරුණුවලට මුල් තැන ලැබෙන බැවින් නිශ්චිතාර්ථවත් ශෛලියක් භාවිත කිරීම අපේක්ෂා කෙරේ.

නිර්මාණාත්මක කෘතියක දී අදහස් පසුබා වින්දන සන්නිවේදනය ඉස්මතු වන බැවින් එකී කාර්යයට උචිත ශෛලියක් භාවිත කළ මනා වෙයි. තව ද එක් එක් අවස්ථාව අනුව ශෛලිය වෙනස් කිරීමට ද සිදු වනු ඇත.

භාරතීය විචාරයෙහි සඳහන් වන ප්‍රාණ, ගුණ, රීති, අලංකාර ආදි සියල්ල ශෛලියට අයත් වේ.

සාහිත්‍ය විචාර ප්‍රදීපිකා, - සුරවීර, ඒ. වී, කොළඹ, 2005, 203 පි.

- **කන්නලව්**

  -බැගෑපත් ඉල්ලීම, ආයාචනය, අඳෝනාව, යාඥාව, යාතිකාව

  ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය, විජේතුංග, හරිස්චන්ද්‍ර, කොළඹ, 2012, 446 පි.
- **ශ්‍රෝතෘ ජනයා**

  යමක් ශ්‍රවණය කිරීම සඳහා පැමිණ සිටින පිරිස

  ඒ ශ්‍රවණය කරන්නේ දේශනයක්, සංගීත සන්දර්ශනයක්, සාහිත්‍ය ග්‍රන්ථ කියවීමක් වැනි දෙයක් විය හැකි ය. මුද්‍රණ තාක්ෂණය මගින් පොත් සුලබ වීමට පෙර ග්‍රන්ථ පරිශීලනය ද බොහෝ දුරට ශ්‍රවණ මාර්ගයෙන් සිද්ධ වූ බව කිව හැකි ය. ඉංග්‍රීසි Audience යන්න නාට්‍ය හෝ වෙන යම් දර්ශනයක් හෝ නැරඹීම සඳහා පැමිණි පිරිසට ද මේ වචනය යෙදේ.

  සාහිත්‍ය විචාර ප්‍රදිපිකා, සුරවීර, ඒ. වී, කොළඹ 2005, 205 පි.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ දේශන, දේව කන්නලව්, පිරිත් දේශනා ඇතුළත් හඬ පට

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විවිධ ශෛලියෙන් රචිත පොත පත හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- විවිධ ශෛලින්ට අනුව කියවීමේ හැකියාව ඇති බව පැහැදිලි කිරීම
- ආවේණික ශෛලින්ට අනුව කියවීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම
- විවිධ ශෛලින්ට අනුගතව ගද්‍ය පද්‍ය පාඨ කියවීම
- විවිධ ශෛලින්ට අනුව කියවීමේ සතතාභ්‍යාසයේ නිරත වීම
- උචිත ශෛලියකට අනුව කියවීමේ හැකියා ප්‍රදර්ශනය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- සාහිත්‍ය විචාර ප්‍රදීපිකා- - ඒ. වී. සුරවීර
- සකස්කඩය
- නම්පොත

# ක්‍රියාකාරකම 17
# විරාම ලක්ෂණ

**නිපුණතාව** : 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල** :
- විරාම ලක්ෂණ හඳුනා ගෙන නම් කරයි.
- විරාම ලක්ෂණවලින් පිළිබිඹු වන අර්ථ පැහැදිලි කරයි.
- විරාම ලක්ෂණ නිවැරදි ව යොදා ඡේද සම්පූර්ණ කරයි.
- නිවැරදි විරාම ලක්ෂණ යොදා වාක්‍ය 10ක් ලියයි.
- අදාළ විරාම ලක්ෂණ යෙදිය යුතු බව පිළිගෙන භාවිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- පෙළ පොතේ 13 වන පාඩමට අදාළ විෂය අන්තර්ගතය මැනවින් අධ්‍යයනය කරන්න.
- ඉගෙනුම් ආධාරක සකස් කර ගන්න.
  උදාහරණ : විරාම ලක්ෂණ ඇතුළත් ප්‍රදර්ශන පුවරු, විරාම ලක්ෂණ ඇතුළත් ප්‍රකාශන
- කථනයේ දී හා ලේඛනයේ දී අදහස් නිරවුල් ව ඉදිරිපත් කිරීමට විරාම ලක්ෂණ අත්‍යවශ්‍ය සාධකයක් බව ඔප්පු කිරීමට ප්‍රමාණවත් නිදසුන් සකස් කර ගන්න.
- විරාම ලක්ෂණ ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් සකස් කර ගන්න.

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.
  - * ගද්‍ය ඡේදයක් ඉදිරිපත් කර එහි ඇතුළත් විරාම ලක්ෂණ පිළිබඳ විමසීම.
  - * විරාම ලක්ෂණ ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් ඉදිරිපත් කර සාකච්ඡාවක් ගොඩනැගීම (ඇමුණුම 2)

**පාඩම සංවර්ධනය**

- කලින් සකස් කර ගත් විරාම ලක්ෂණ ඇතුළත් ප්‍රදර්ශන පුවරුව ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- අදහස් නිරවුල් ව ප්‍රකාශ කිරීමට හා සටහන් කිරීමට කථනයේ දී ද ලේඛනයේ දී ද විරාම ලක්ෂණ අත්‍යවශ්‍ය අංගයක් බව සාකච්ඡා කරන්න.
- විරාම ලක්ෂණ නම් කර එම සංකේතයෙන් අර්ථවත් වන දෑ පැහැදිලි කරන්න.
- පාඩමට අදාළ විරාම ලක්ෂණ වාක්‍යවල යොදා ඇති ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

- සතියක දී කියවන පොත පත ඇසුරින් හමු වන විරාම ලක්ෂණ අන්තර්ගත වැකි එකතුවක් සකස් කිරීමට කණ්ඩායම් පැවරුමක් ලබා දෙන්න. (එක් පොතකින් වැකි 5 බැගින්)
- විරාම ලක්ෂණ මතකයෙන් නම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතේ දී ඇති අභ්‍යාස නිම කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- විරාම ලක්ෂණ රහිත වාක්‍යවලට සුදුසු පරිදි විරාම ලක්ෂණ යොදා නැවත ලිවීමේ අභ්‍යාස ලබා දෙන්න.
- විරාම ලක්ෂණ ඇතුළත් කරමින් කතාන්දරයක් හෝ සංවාදයක් නිර්මාණය කිරීමට පැවරුමක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විරාම ලක්ෂණ සටහන් කරන ලද පුවරුවක්
- නිවැරදි ව විරාම ලක්ෂණ යොදා ලියන ලද ලේඛනයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- විරාම ලක්ෂණ හඳුනා ගෙන නම් කිරීම
- විරාම ලක්ෂණවල අර්ථ පැහැදිලි කිරීම
- දෙන ලද ඡේදයක නිවැරදි විරාම ලක්ෂණ යෙදීම
- නිවැරදි විරාම ලක්ෂණ යොදා වාක්‍ය සැකසීම
- අදාළ විරාම ලක්ෂණ යෙදිය යුතු බව පිළිගෙන භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

සිංහල ලේඛන රීතිය (ජාතික අධ්‍යාපන ආයතනය)

**ඇමුණුම 1**

'එහෙනං, පුතා සුදු අක්කා කියන හැටියට කියාපන්'

හොඳයි.

ඇයි පුතා කාලා ඉවර ද?

ඔව් අපි කෑවා. තවත් තියෙනවා.

**ඇමුණුම 2 :**

ව්‍යවහාරයේ යෙදෙන විරාම ලකුණු

- (.) තිත,
- (,) කොමාව
- (;) තිත් කොමාව
- (:) දෙතිත
- ( -)කෙටි ඉර

- (_) දිග ඉර
- (" ") යුගල උඩු කොමා, උද්ධෘතය
- (' ') තනි උඩු කොමා
- (...) තිත් පෙළ
- (?) ප්‍රශ්න ලකුණ
- (/) ඇල ඉර
- (( )) සරල වරහන්
- (^) කාක පාදය
- (⁀) කුණ්ඩලීය
- (*) තරුව
- (!) විස්මයාදි ලකුණ (හර්ෂාදී ලක්ෂණය)

1. (.) තිත (සමාප්තිය)

   1.1 වාක්‍යයක අඛ්‍යාතය දක්වීම සඳහා යෙදේ

   උදාහරණ : ගුණපාල සින්දු කියමින් නැටුවේ ය.

   1.2 නාම, උපාධි, දින ආදිය කෙටි කිරීමෙහි යෙදේ.

   උදාහරණ : තිස්ස විජයවර්ධන, - ති. විජයවර්ධන
   රත්නායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා - ර. මු. කිරිබණ්ඩා
   ගෞරවාර්හ පණ්ඩිත වැලිවිටියේ සෝරත හිමි -- ගෞ.පණ්ඩිත වැ.සෝරත හිමි
   ක්‍රිස්තු වර්ෂ - ක්‍රි. ව.
   පෙරවරු - පෙ. ව.
   රුපියල් ශත - රු. ශ.

2. කොමාව (,)

   මෙයින් හඟවනුයේ ඉතා සුළු විරාමයකි. වාක්‍යයක් කියවීමේ දී කොමාව ඇති තැන්වල කතා ශබ්දය ඉතා ස්වල්ප වේලාවක් නැවැත්විය යුතු ය. කොමාව යෙදෙන ස්ථාන ;

   2.1 දීර්ඝ වාක්‍යයක් සුඛාවබෝධය පිණිස කොටස්වලට බෙදීමෙහි දී කොමාව යෙදේ.

   උදාහරණ : සූර්යෝදයෙහි නෙළුම් පිපෙයි, කුමුදු හැකිළෙයි, සිසිල් මඳ පවන් හමයි.

   2.2 එක ම වර්ගයක වස්තූන් වෙන් කිරීමේ දී කොමාව යෙදෙයි.

   උදාහරණ : තේ, රබර්, පොල්, වී, කොකෝවා, කෙසෙල් ආදිය ලංකාවේ ප්‍රධාන වැවිලි වර්ගයි.

   2.3 එක ම සම්බන්ධයක වන පදයක් හෝ වාක්‍යාංශයක් වෙන් කිරීමේ දී කොමාව යෙදේ.

   උදාහරණ : අපේ ළදරු වීරයා, ඇහැලේපොළ කුමාරයා, දක් වූයේ ලෝකයේ අන් කිසිම

රටෙක ළමා වීරයකු නො දක් වූ අභීත වික්‍රමයෙකි.

2.4 ප්‍රකෘති කථනයක් වාක්‍යයකින් වෙන් කිරීමේ දී කොමාව යෙදේ.

උදාහරණ : ''මහණෙනි, මා එන්නට පළමු කිනම් කතාවෙකින් යුතු ව උන්හු ද''යි බුදුහු විචාළ සේක.

2.5 සම නිර්මාණයකින් යුත් වාක්‍යාංශයක් වෙන් කිරීමේ දී කොමාව යෙදේ.

උදාහරණ : ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ, ප්‍රසිද්ධ වූ, සුබ දායක වායු ගුණයෙන් පෝෂිත වූ, රමණීය දේශ දර්ශනයෙන් විභූසිත වූ සිංහලය, එකල අන් කිසි රටකට දෙවෙනි නොවී ය.

2.6 ආමන්ත්‍රණයෙහි යෙදෙන පද අන්‍ය පදවලින් වෙන් කිරීමේ දී කොමාව යෙදේ.

උදාහරණ : පුත්‍රය, හෙට ගොයම් කැපීමට කටයුතු පිළියෙල කරන්න.

2.7 සංහත, සංකීර්ණ, සංකුල යන වාක්‍යයන්හි කුඩා අන්තර් වාක්‍ය වෙන් කිරීමෙහි ද කොමාව යෙදේ.

උදාහරණ : නළඟන ගී ගැයුවා ය, වැයුවා ය, නැටුවා ය.

2.8 පදයක් හෝ වැකියක් නැවත නැවත කීමේ දී කොමාව යෙදේ.

උදාහරණ : දිය ගෙනෙන්න, දිය ගෙනෙන්න, වහා ම දිය ගෙනෙන්න!

3. තිත් කොමාව (;)

කොමාවෙන් හැඟවෙන විරාමයට වඩා දීර්ඝ විරාමයක් මෙයින් හඟවනු ලැබේ. මේ ලකුණු යෙදෙන තැන් කිහිපයකි.

3.1 ළදරුව, තෝ ඉතා ම නුවණ නැත්තෙහි ය; පැතුව මනා දෙය තබා පොල් ගසින් තල් පක් පතන්නා සේ, ගින්නෙන් සිහිල පතන්නා සේ, නො පැතුව මනා දෙය පතහි; තා හඬා මියතත් ඒ දෙක ලබන්ට බැරි ය

3.2 අලංකාර වාක්‍යයන්හි මෙබඳු තැන යෙදේ.

කවිත්වය කොයින් ලැබේ ද? වනයේ තුරු ලියෙන්; අහසේ සඳ තුරු වලායෙන්; පොළොවේ ගංහෝ කඳුරුයෙන්; නගරයේ පවුරු සහ මැදුරුයෙන්; ගුරු මුවින් හෝ හසලින්;,

3.3 කුමක් නිසා ද -එසේ නම් ආදියෙන් සම්බන්ධ වන අන්තර් වාක්‍යයන්හි ද තිත් කොමාව තබනු ලැබේ.

උදාහරණ : මම වහ වහා වැඩ කෙළෙමි; කුමක් නිසා ද? සවස් වන්නට පළමු ගෙදර යාමට වුවමනා වූ නිසා ඔවුන් අද මෙහි එනවා; එසේ නම් අප වහා ම මෙතනින් පිට විය යුතු ය.

4. වරහන් ( )

4.1 යම් කිසි පාඨයක හෝ වචනයක අදහස පැහැදිලි කිරීමෙහි දී වරහන් ලකුණු යෙදේ.

උදාහරණ : යාපා පටුන (යාපනය) සිරිලක පැරණි නැව් තොටකි.

සත්පුරුෂයන්ගේ ජීවනය පරෝපකාරය (අනුන්ට උපකාර කිරීම) පිණිස ම වෙයි.

5. උද්ධෘත පාඨ ලක්ෂණය

යමකු කියුවක් ඔහු කී වචනයෙන් ම ප්‍රකෘති කථනය වශයෙන් දක්වන තැන්හි යෙදේ.

5.1 උදාහරණ : ''මම කිසි කලෙක බොරු නො කියමි''යි මිත්‍රයා කීයේ ය.

''මහරජ, අපි ධර්මරාජයන්ගේ ශ්‍රාවකයම්හ; තොපට වැඩ සඳහා දඹදිවින් මෙහි පැමිණියම්හ''යි ස්ථරයෙන් වදාළ සේක.

5.2 උපුටාගත් පාඨයන් දැක්වීමෙහි දී ද උධෘත පාඨ ලක්ෂණය යෙදේ.

උදාහරණ : ''කොපමණ ගුණ කළත් .. අඟුරු සුදුවන කලෙක් නම් නැත්''

5.3 ප්‍රකෘති කථනයක, තවත් ප්‍රකෘති කථනයක් වේ නම්, ඒ කොටස දැක්වීමේ දී උඩු කොමා ලකුණු එක බැගින් යොදනු ලැබේ.

ඒ අසා රජ තෙමේ, ''අසුවල් ගෙයි මහලු ස්ත්‍රිය, 'අහෝ! මා පුත් දෙදෙනා ම නැතැ'යි කියමින් හැඬුවා ය. ඈ කැඳවා ගෙන එව''යි රාජ පුරුෂයෙක් යැවී ය.

5.4 යම් කිසි වචනයක් හෝ වාක්‍යාංශයක් වෙසෙසා දැක්වීමෙහි දී ද, ඒ දෙපස කොමා ලකුණු එක බැගින් යොදනු ලැබේ.

උදාහරණ : 'පරාර්ථචර්යා' යන්නෙහි අර්ථය නම් අනුන්ගේ දියුණුව පිණිස ක්‍රියා කිරීමෙහි නියුක්ත වීමයි.

## ක්‍රියාකාරකම 18
## කාරක

**නිපුණතාව** : 2.0 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.6 මූලික රීතිවලට අනුව උක්තාඛ්‍යාත ගළපා වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල** :
- කර්තෘකාරක වාක්‍ය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- කර්මකාරක වාක්‍ය හඳුනා ගනිමින් පැහැදිලි කරයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යවල වෙනස විස්තර කරයි.
- කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරක වාක්‍යයක් බවට පත් කිරීමේ දී සිදු වන වෙනස්කම් හඳුනා ගෙන පැහැදිලි කරයි.
- වාක්‍ය රීතිවලට අනුගත ව උක්තාඛ්‍යාත සම්බන්ධතා ඇති සරල හා සංකීර්ණ වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**
- පෙළ පොතේ අංක 14, 'කාරක' පාඩමේ අන්තර්ගතය අධ්‍යයනය කරන්න.
- පාඩම කාලච්ඡේද 4කට සැලසුම් කර ගන්න.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරක බවට හැරවීමේ දී සිදු වන වෙනස්කම් සහිත ප්‍රදර්ශනාත්මක පුවරුවක් සකස් කර ගන්න.
- කර්තෘකාරක සහ කර්මකාරක වාක්‍ය ලියන ලද පත්‍රිකා කිහිපයක් සූදානම් කර ගන්න.
- පෙළ පොතේ දක්වා ඇති පරිදි මග තොටේ නිතර ම දක්නට ලැබෙන කර්මකාරක වාක්‍ය ඇතුළත් කර පුවරු කිහිපයක් සකස් කර ගන්න.

**ප්‍රවේශය :**
- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් අනුගමනය කරන්න.
  - * කර්තෘකාරක සහ කර්මකාරක වාක්‍ය වෙන වෙන ම ලියන ලද පත්‍රිකා ශිෂ්‍යයන් අතර බෙදා දී එම වාක්‍ය දෙවර්ගයේ ඇති වෙනස විමසීම.
  - * ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසීම.

**පාඩම සංවර්ධනය :**
- කර්මකාරක වාක්‍ය යනු කුමක් ද? යන්න නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.
- මෙහි දී 8 පාඩමේ උගත් කරුණු ද නැවත ආවර්ජනය කරන්න.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරක බවට හැරවීමේ දී සිදු වන වෙනස්කම් සාකච්ඡා කරන්න.
- අවට පරිසරයේ දක්නට ඇති එවැනි වැකි පිළිබඳ ව ශිෂ්‍යයන්ගෙන් විමසන්න.

- කර්තෘකාරක වාක්‍ය පහක් ලබා දී ඒවා කර්මකාරකයට හරවා ලිවීමට අවස්ථාව දෙන්න.
- පෙළ පොතේ සඳහන් ක්‍රියාකාරකම නිම කිරීමට උපදෙස් දෙන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- නිර්ණායක ඉවහල් කර ගෙන ශිෂ්‍යයන්ගේ ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

**මූලික වදන් සංකල්ප :**

''කර්තෘකාරක ආඛ්‍යාතයෙන් යුක්ත වූයේ කර්තෘකාරක වාක්‍යයයි.''

''කර්මකාරක ආඛ්‍යාතයෙන් යුක්ත වූයේ කර්මකාරක වාක්‍යයයි.''

සිංහල වියරණ විදි, තිලකසිරි, සිරි, කොළඹ, 2007, 281 පි.

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- කර්තෘකාරක වාක්‍ය හඳුනා ගෙන විස්තර කිරීම
- කර්මකාරක වාක්‍ය හඳුනා ගෙන විස්තර කිරීම
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යවල වෙනස විස්තර කිරීම
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට පත් කර ලිවීම
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට පත් කිරීමේ දී සිදු වන වෙනස්කම් හඳුනා ගෙන පැහැදිලි කිරීම
- වාක්‍ය රීතිවලට අනුගත උක්තාඛ්‍යාත සම්බන්ධය ඇති සරල හා සංකීර්ණ වාක්‍ය නිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල වියරණ විදි - සිරි තිලකසිරි
- සිංහල රචනය සහ සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබන්දු

ඇමුණුම 1

කර්තෘකාරක වාක්‍ය කර්මකාරක වාක්‍යයක් බවට හැරවීමේ දී සිදු වන වෙනස්කම්

- වාක්‍යයේ කර්තෘ අනුක්ත වේ.
- අනුක්ත කර්තෘට පර ව 'විසින්' යන නිපාතය යෙදේ.
- කර්මය උක්ත වේ. එනම් ප්‍රථමා විභක්ති ගනියි.
- ඒ උක්ත කර්මයට අනුව ක්‍රියාව සෑදේ.
- එම ක්‍රියාව සෑදීම සඳහා ලබ/ලද ධාතු යෙදිය හැකිය.
- අතීත කාල ක්‍රියා පදවල ඒකවචනය සඳහා 'ඉණි' ප්‍රත්‍යය ද, බහුවචනය සඳහා 'උණු' ප්‍රත්‍යය ද යොදා ගත හැකිය.

- වර්තමාන කාල ක්‍රියාවල ධාතු ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය අතරට 'එ' ප්‍රත්‍යය යෙදේ.

- 'බල' ධාතුව අතීත කාලය සඳහා යෙදීම ;

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | බල + ඉණි - බැලිණි<br>බලනු ලැබීය/බලන ලදි | බල + උණු - බැලුණු<br>බලනු ලැබූහ/බලන ලදහ |
| මධ්‍යම පුරුෂ | බල + ඉණිහි- - බැලිණිහි<br>බලනු ලැබීහි/බලන ලදහි | බල + උණුහු - බැලුණුහු<br>බලනු ලැබූහු/බලන ලදහු |
| උත්තම පුරුෂ | බල + ඉණිමි - බැලිණිමි<br>බලනු ලැබීමි/බලන ලදිමි | බල + උණුමු- - බැලුණුමු<br>බලනු ලැබූමු/බලන ලදිමු |

- 'බල' ධාතුව වර්තමාන කාලය සඳහා යෙදීම ;

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | බල + එ + යි - බැලෙයි<br>බලනු ලබයි | බල + එ + ති - බැලෙති<br>බලනු ලබති |
| මධ්‍යම පුරුෂ | බල + එ + හි - බැලෙහි<br>බලනු ලබහි | බල + එ + හු - බැලෙහු<br>බලනු ලබහු |
| උත්තම පුරුෂ | බල + එ + මි - බැලෙමි<br>බලනු ලබමි | බල + එ + මු - බැලෙමු<br>බලනු ලබමු |

## ක්‍රියාකාරකම 19
## ශබ්ද නගා කියවීම (සුභාෂිතය)

**නිපුණතාව** : 6.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

10.3 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

10.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 09 යි

**ඉගෙනුම් පල** :
- ශබ්ද නගා කියවීමේ අවස්ථා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- පැහැදිලි හා නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි.
- විරාම ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව කියවයි.
- නිසි හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.
- අවස්ථාවට ගැළපෙන අයුරින් පාඨ තෝරා ගෙන ශබ්ද නගා කියවයි.
- ශ්‍රාවක අවධානය දිනා ගනිමින් ශබ්ද නගා කියවයි.
- අවධානයෙන් යුතු ව සවන් දීමෙන් රසවින්දන හැකියා වර්ධනය කර ගනියි.
- සංයමයෙන් සවන් දී අර්ථ වටහා ගනිමින් පද්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- මෙම ක්‍රියාකාරකමට නියමිත විෂය අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කරන්න. (මේ සඳහා සුභාෂිතයෙන් මුල් පද්‍ය 40 යොදා ගත යුතු ය.)
- සුභාෂිතයේ අන්තර්ගත පද්‍ය 40 පිළිබඳ අධ්‍යයනය කරන්න.
- එක් කාලච්ඡේදයකට පිළිවෙළින් පද්‍ය 5 බැගින් වන සේ පාඩම සැලසුම් කර ගන්න
- උපදේශාත්මක පද්‍ය කෘති පිළිබඳ අවබෝධයක් ලබා ගන්න. (උදා : ලෝකෝපකාරය, ලෝවැඩ සඟරාව, ජනකවි වැනි)
- පද්‍යාර්ථ මැනවින් අධ්‍යයනය කරන්න.
- දුරවබෝධ වචනවලට ලිහිල් අර්ථ සපයා ගන්න.
- සුභාෂිතය පිළිබඳ කෙටි හැඳින්වීමක් සකස් කර ගන්න. (ඇමුණුම 1)

**ප්‍රවේශය**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.

- * සුභාෂිතයේ පද්‍ය ඇතුළත් හඬ පටයක් ශ්‍රවණය කිරීමට සැලැස් වීම.
- * මානෙල් සුවඳමය

  කුඩමසු පිළී ගඳමය

  දෙකට එක දියමය

  හොඳට නරකට දෙකට කටමය

වැනි උපදේශාත්මක පද්‍යයක් පුවරුවේ ප්‍රදර්ශනය කර එය තාලයට ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම.

**පාඩම සංවර්ධනය**

- සිංහලෙන් රචනා වී ඇති උපදේශ කාව්‍ය නම් කර, සුභාෂිතය ගැඹුරු ජීවන දර්ශනයක් සරල බසින් ප්‍රකාශ කරන උපදේශාත්මක කාව්‍යයක් බව සාකච්ඡා කරන්න.
- සුභාෂිතය පද්‍ය ග්‍රන්ථය පිළිබඳ කෙටි හැඳින්වීමක් ඉදිරිපත් කරන්න. (ඇමුණුම 1)
- කවිය මාධ්‍යය කොට ගෙන උපදෙස් රසවත් ලෙස ඉදිරිපත් කළ හැකි බව සුභාෂිතයේ ත්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.
- මිනිස් සමාජයෙහි සාරධර්ම පෝෂණය කිරීමට තරම් උසස් දාර්ශනික අදහස් හා උචිත උපමා උපමේයයන්ගෙන් පෝෂණය වූ අකාලික ගුණයෙන් පිරි කාව්‍ය සංග්‍රහයක් වශයෙන් සුභාෂිතය අගය කළ හැකි බව සාකච්ඡා කරන්න.
- සෑම කවියක ම අර්ථය විවරණය කරමින් එහි ඇතුළත් උපදේශ, උපමා, උපමේය හා දෘෂ්ටාන්ත පැහැදිලි කරන්න.
- සුභාෂිතයේ මුල් පද්‍ය 40 තාලානුකූල ව ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ වචනවලට ගැටපද සකස් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලිවීම සඳහා අභ්‍යාස ලබා දෙන්න.
- ගායනා කොට පුහුණු වූ පද්‍ය ශිෂ්‍ය සමිතියේ දී හෝ සාමාජික හා ආගමික කටයුතුවල දී ස්ථානෝචිත ව උපයෝගී කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- සිංහල උපදේශ සාහිත්‍යය ග්‍රන්ථ පිළිබඳ බිත්ති පුවත් පතට ලිපියක් සකස් කිරීමට යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- **උපදේශාත්මක සාහිත්‍යය**

සාහිත්‍යයේ මූලික අරමුණ උපදේශ දීම නො වෙතත්, හැම උසස් සාහිත්‍ය කෘතියකින් ම යම් ආකාරයක උපදේශයක් හෝ ආදර්ශයක් හෝ ලැබිය හැකි බව පිළිගත හැකි ය. අද්‍යතන නව සාහිත්‍යයට වඩා චිරන්තන සාහිත්‍යයෙහි උපදේශාත්මක අගයක් තුබු බව නො රහසකි. ඒ අතර, හුදෙක් උපදේශය ම අරමුණු කර ගත් කෘති රාශියක් පෙර'පර දෙදිග ම සාහිත්‍යයන්හි දක්නට ලැබේ. බොහෝ විට මේ ග්‍රන්ථ දක්නට ලැබෙන්නේ පද්‍ය කෘති වශයෙනි. උපදේශ, නීති, ලෝක නීති, සදුක්ති, සුභාෂිත යන නම් මේ කෘති සඳහා සංස්කෘතයෙහි යෙදේ. චාණක්‍ය නීතිසාර, නීතිශතක, සදුක්තිකර්ණාමෘත, සුභාෂිතාවලී ආදිය පුරාතන උපදේශ පද්‍යාවලි කීපයකි. හිසොයිඩ් (Hesoid), ෆිනෝමිනා (Phenomena), ද රේරුම් නැචුරා (De Rerum Natura) ආදිය බටහිර සාහිත්‍යයේ උපදේශ කෘති කීපයකි. තිරුක්කුරල්, නාළඩියාර්, තාණ්මණික්කෝවෙ දෙමළ උපදේශ කෘති වේ. සිංහල උපදේශ පද්‍ය අතර ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, සුභාෂිතය යන කෘති විශේෂ වේ.

සුරවීර, ඒ. වී, සාහිත්‍ය විචාර ප්‍රදීපිකා, කොළඹ, 2005, 48 පි.

**ගුණාත්මක යෙදවුම් :**

- සුභාෂිතයේ විෂය අන්තර්ගතයට අදාළ පද්‍ය ඇතුළත් හඬ පටය
- සුභාෂිතය ග්‍රන්ථය
- උපදේශාත්මක පද්‍ය කෘති කිහිපයක් (ලෝකෝපකාරය, ලෝවැඩ සඟරාව, තිරුක්කුරල් වැනි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ශබ්ද නගා කියවීමේ විවිධ අවස්ථා හඳුනා ගෙන කියවීම
- නිසි හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවීම
- පැහැදිලි හා නිවැරදි හඬ පාලනයෙන් යුතු ව කියවීම
- විරාම ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව කියවීම
- අවස්ථාවට ගැළපෙන අයුරින් පාඨ තෝරා ගෙන ශබ්ද නගා කියවීම
- ශ්‍රාවක අවධානය දිනා ගනිමින් ශබ්ද නගා කියවීම
- අවධානයෙන් සවන් දී රසවින්දනය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- සුභාෂිතය
- දහම් ගැට මාලාව
- ලෝවැඩ සඟරාව
- ලෝකෝපකාරය

ඇමුණුම 1 : **සුභාෂිතය පිළිබඳ කෙටි හැඳින්වීමක්**

පොදු ජනයා අතර ගුණ දහම් වර්ධනයට බෙහෙවින් ඉවහල් වන අගනා උපදෙස්වලින් පරිපූර්ණ වූ ග්‍රන්ථයකි සුභාෂිතය. මේ කෘතිය රචනා කිරීමෙන් අලගියවන්න මුකවෙටි කිවිඳුන් බලාපොරොත්තු වී ඇත්තේ, සංස්කෘත, පාලි, දෙමළ භාෂා නො දත් පොදු ජනයාට පුරාණ ඍෂිවරුන්ගේ ශ්‍රේෂ්ඨ අදහස් ඉගෙනීමට මඟක් සලසා දීම ය.

මෙහි ඉගැන්වෙන උපදෙස් ඉතා කල්පනාවෙන් අධ්‍යයනය කර ජීවිතය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලෙස ඉල්ලා සිටී. අලගියවන්න කිවිඳුන් ජීවත් වූ යුගය ගැන සලකා බලන විට මෙබඳු ශ්‍රේෂ්ඨ අදහස්වලින් ජනයාගේ චරිත හැඩ ගැස්වීමට ගත් ආභාසය ද අතිශයින් අගය කළ යුතු වේ. 1 වෙනි රාජසිංහගේ කාලය මෙරට බුදු සසුනටත්, භාෂා සාහිත්‍යයටත් අතිශයින් අනර්ථකාරී යුගයක් විය. එබඳු යුගයක මෙවැනි පද්‍ය උපදේශ අත්‍යවශ්‍ය ව තිබිණ.
එක ම විරිතකින් බඳනා ලද කවි සියයකින් යුත් සුභාෂිත කාව්‍යය පඤ්ච තන්ත්‍රය, හිතෝපදේශය වැනි සංස්කෘත උපදේශ ග්‍රන්ථයන්ගෙන් ආභාසය ලබා ඇත. ඒ අනුව සුභාෂිතය සිංහල සාහිත්‍යයෙහි දක්වෙන ප්‍රධාන උපදේශ කාව්‍යයක් ලෙස සැලකිය හැකි ය.

මෙම කාව්‍යයෙහි මුල් පද්‍ය 14ක් පමණ යොදා ගෙන ඇත්තේ බුදුරජාණන් වහන්සේත් උන්වහන්සේගේ ධර්මයේත් උසස් බව විවිධාකාරයෙන් පෙන්වා දීමට ය. ඇතැම් පද්‍යවලින් බුදුරදුන් සහ උන්වහන්සේගේ ධර්මය පසෙක දමා දෙවියන් පසු පස යන ජනයා අඥානයන් ලෙස හඳුන්වා දී ඇත.

ඉදිරිපත් කරන උපදේශ සිත් ගන්නා උපමාවන් මඟින් පැහැදිලි කරදීමට ගෙන ඇති උත්සාහය මෙම ග්‍රන්ථය පොදු ජනයාගේ ජනාදරයට පත් වීමට හේතු වී ඇත.

# ක්‍රියාකාරකම 20
# වණපොත් කිරීම

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 7.0 | ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය කර ගනිමින් ආගමික සාමාජීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම සඳහා වණපොත්කරණයේ යෙදෙයි. |
| **නිපුණතා මට්ටම** | : | 7.1 | නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් ගද්‍ය කොටස් හා පද්‍ය වණපොත් කරයි. |
| **කාලච්ඡේද** | : | 18යි | |
| **ඉගෙනුම් පල** | : | • වණපොත් කිරීමේ අවශ්‍යතාව හා ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට පද්‍ය වණපොත් කර ප්‍රකාශ කරයි.<br>• වණපොත් කර ගත් පද්‍ය එදිනෙදා අවශ්‍යතාවල දී භාවිතයට ගනියි. | |

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- සුභාෂිතය (මුල් පද්‍ය 40,) ගණදෙවි හැල්ල සහ වදන් කවිපොත යන ග්‍රන්ථවල ඇතුළත් විෂය අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කරන්න.
- පහත සඳහන් පරිදි කාලච්ඡේද වෙන් කර ගන්න.
  සුභාෂිතය - (මුල් පද්‍ය 40) - කාලච්ඡේද 6
  ගණදෙවි හැල්ල - කාලච්ඡේද 6
  වදන් කවිපොත - කාලච්ඡේද 6
- සුභාෂිතය, ගණදෙවි හැල්ල හා වදන් කවිපොත යන කෘති පිළිබඳ කෙටි හැඳින්වීම් සකස් කර ගන්න.
- පන්තියට පැමිණීමට පෙර අදාළ පද්‍ය කොටස් වණපොත් කර පැමිණෙන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

**ප්‍රවේශය**

- පහත සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.
  - - අදාළ පද්‍ය ග්‍රන්ථයක ඇතුළත් කවියක් තාලානුකූල ව ගායනා කිරීම.
  - - අදාළ පද්‍ය පටිගත කරන ලද හඬපටයක් හෝ වෙනත් සුදුසු විද්‍යුත් උපකරණයක් භාවිත කර වාදනය කිරීම.

**පාඩම සංවර්ධනය**

- වණපොත් කිරීම යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
- අතීතයේ දී වණපොත් කිරීම සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් ලෙස භාවිත වූ ආකාරය සහ එසේ කිරීමට බලපෑ හේතු සාකච්ඡා කරන්න.
- වර්තමානයේ දී වණපොත් කිරීම ප්‍රයෝජවත් වන අවස්ථා සාකච්ඡා කරන්න.
  (උදාහරණ : ධර්ම දේශනාවල දී)

- එක් එක් නිර්දිෂ්ට කෘති පිළිබඳ වෙන වෙන ම හැඳින්වීම් සිදු කරන්න (අදාළ පාඩමට පෙර)
- පන්ති කාමරයේ දී සිසුන් වණපොත් කළ පද්‍ය කටපාඩමින්, තාලයට ගායනා කිරීමට එක් එක් සිසුවාට අවස්ථාව ලබා දෙන්න.
- වණපොත් කළ පද්‍යය මතකයෙන් අභ්‍යාස පොතෙහි ලිවීමට උපදෙස් දෙන්න.
- එම පද්‍යවල අර්ථ පැහැදිලි කර ඒවා අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- වණපොත් කිරීමේ අවශ්‍යතාව හා ප්‍රයෝජන පිළිබඳ වාචික ප්‍රශ්න විමසන්න.
- වණපොත් කරන ලද පද්‍යය සාමූහික ව ගායනා කිරීමට අවස්ථාව ලබා දී ඇගයීමක් සිදු කරන්න.
- වණපොත් කරන ලද පද්‍යවල අර්ථය මතකයෙන් අභ්‍යාස පොතේ ලිවීමට අභ්‍යාස ලබා දෙන්න.
- එම පද්‍ය ශිෂ්‍ය සමිතියේ දී ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දී අගයන්න.
- වණපොත් කරන ලද පද්‍ය එදිනෙදා ජීවිතයේ දී ප්‍රයෝජනයට ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- **වණපොත්**

  කටපාඩම, වාචෝද්ගත වීම,

  සෝරත හිමි, වාලිවිටියේ, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, කොළඹ, 1970, 891 පි.

**ගුණාත්මක යෙදවුම් :**

- අදාළ නිර්දිෂ්ට ග්‍රන්ථ
- පටිගත කරන ලද කවි ඇතුළත් හඬ පටයක්

**ඇගයිම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- වණපොත් කිරීමේ අවශ්‍යතාව හා ප්‍රයෝජන විස්තර කිරීම
- පද්‍ය වණපොත් කර ගායනා කිරීම
- වණපොත් කරන ලද පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලිවීම
- එදිනෙදා අවශ්‍යතාවල දී වණපොත් කරන ලද පද්‍ය භාවිතයට ගැනීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ගණදෙවි හැල්ල සහ වදන් කවිපොත, - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- සුභාෂිතය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## ක්‍රියාකාරකම 21
## රසවින්දනය (අඹ යහළුවෝ)

**නිපුණතාව** : 8.0 රසඥතාව වර්ධනය කර ගැනීම හා ජීවිතාදර්ශ ලබා ගැනීම සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 ගද්‍ය හා පද්‍ය නිර්මාණ රස විඳිමින් කියවයි.

**කාලච්ඡේද** : 12යි

**ඉගෙනුම් පල** :
- අඹ යහළුවෝ නවකතාව කියවා සිත් ගත් අවස්ථා විස්තර කරයි.
- අඹ යහළුවෝ නවකතාවේ චරිත නිරූපණය අධ්‍යයනය කරමින් විස්තර කරයි.
- අඹ යහළුවෝ නවකතාවේ කලාත්මක ලක්ෂණ හඳුනා ගනිමින් රස විඳියි.
- අඹ යහළුවෝ නවකතාවේ භාෂා භාවිතය අගය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- අඹ යහළුවෝ නවකතාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීමට අවශ්‍ය තොරතුරු සපයා ගන්න.
- අඹ යහළුවෝ නවකතාවේ කතුවරයාගේ ඡායාරූපය ප්‍රදර්ශනය කිරීමට සූදානම් කර ගන්න.
- කතුවරයා විසින් රචිත වෙනත් නවකතා පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගන්න.
- අඹ යහළුවෝ නවකතාව සම්පූර්ණයෙන් කියවා මැනවින් අවබෝධ කර ගන්න.
- නවකතාවේ පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට සිද්ධි, අවස්ථා හා චරිත නිරූපණය කර ඇති ආකාරය හා භාෂා භාවිතය අධ්‍යයනය කරන්න.
- අඹ යහළුවෝ නවකතාවේ චරිත පිළිබඳ කෙටි හැඳින්වීමක් සකස් කර ගන්න. (ඇමුණුම 1)

**ප්‍රවේශය** :

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  - \- කතුවරයාගේ (ටී.බී.ඉලංගරත්න) ඡායාරූපයක් ප්‍රදර්ශනය කිරීමෙන්
  - \- නවකතාව නම් සාහිත්‍යාංගය පිළිබඳ පෙර දැනුම විමසීමෙන්
  - \- නවකතා කිහිපයක් කතුවරුන්ගේ ඡායාරූප සමග ඉදිරිපත් කර ඒ පිළිබඳ සංවාදයක නිරතවීමෙන්.
  - \- ගද්‍ය-පද්‍ය සාහිත්‍යාංගයන් අතර සුවිශේෂ වූ සාහිත්‍යාංගයක් වශයෙන් නවකතාව හඳුනා ගත යුතු බව පැහැදිලි කිරීමෙන්

**පාඩම් සංවර්ධනය**

- නූතන ගද්‍ය සාහිත්‍යයේ එක් අංගයක් වන 'නවකතා' යටතේ අඹ යහළුවෝ නවකතාව රචනා වී ඇති බව සාකච්ඡා කරන්න.

- සමාජ විද්‍යාත්මක, ඓතිහාසික, මනෝවිද්‍යාත්මක, නවකතා අතර අඹ යහළුවෝ නවකතාව සමාජ විද්‍යාත්මක කොටසට අයත් ළමා නවකතාවක් බව සාකච්ඡා කරන්න.
- වැඩවසම් රදළවාදි සමාජ ක්‍රමය මත දැඩි මතධාරී වැඩිහිටියන්ගේ ක්‍රියාකාරකම්වලට ළමා සමාජය බිලි වන ආකාරය පැහැදිලි කරන්න.
- අවස්ථාවෝචිත ව අභියෝගවලට මුහුණ දීම, ගැටලු විසඳීම ධෛර්යයෙන් යුක්ත වීම, මානව දයාව දැක්වීම වැනි ආකල්ප වර්ධනයට උචිත උදාහරණ චරිත ලක්ෂණවලින් අගයන්න.
- අවස්ථා සම්බන්ධය, සිද්ධි ගැළපීම, සිද්ධි තෝරා ගැනීම චරිත හැසිරවීම පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- රාජ්‍ය නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියාකාරකම් හා සමාජ හිතකාමී ක්‍රියාකාරකම් මත සමාජයට අසාධාරණය හා සාධාරණය සිදු වන ආකාරය පිළිබඳ පැහැදිලි කරන්න.
- සුනිල්ගේ හා නිමල්ගේ පවුල අතර පරතරය ආර්ථික පදනම මත දුරස්ථ වූ බව පැහැදිලි කරන්න.
- පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට කතා රසයට බාධාවක් නො වන අයුරින් සංසිද්ධි ගැළපීම සඳහා කතුවරයා භාෂාව හැසිරවීමට දැක් වූ කුසලතාව සාකච්ඡා කරන්න.
- මිතුරු- සමාජයේ අගය අඹ යාළුවෝ නවකතාවෙන් වඩාත් ඉහළින් අගය කිරීමට කතුවරයා දැක් වූ කුසලතාව පැහැදිලි කරන්න.

  උදාහරණ : සුනිල් සිය මිතුරු නිමල්ට පමණක් නොව
  නිමල් ද සුනිල් වෙනුවෙන් ලැබුණු නේවාසික විද්‍යාලයට ලැබුණු
  ශිෂ්‍යත්වය ද අමතක කර ගමට ඒමට සිතීම

- අඹ යහළුවෝ නවකතාවේ පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට නිහඬ ව කියවා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පරිච්ඡේදය අවසානයේ එහි අන්තර්ගතය චරිත, සිද්ධි හා අවස්ථා සටහන් කර ගන්න.
- විරාම ලක්ෂණ අන්තර්ගත වාක්‍ය, ඡේද ඛණ්ඩ අභ්‍යාස කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සමස්ත කතාව තමාගේ වචනයෙන් පිටපත් කරවීමට අවස්ථාව ලබා දෙන්න.
- කතාවේ අන්තර්ගත චරිත නාමාවලිය පෙළ ගැස්වීමට යොමු කරවන්න.
- අඹ යහළුවෝ නවකතාවෙන් ගත හැකි ජීවිතාදර්ශය සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- සෝලියන්
- මුත්තෙට්ටුවන්
- වනමත්

**ගුණාත්මක යෙදවුම් :**

- චරිත නාමාවලිය ලියා දැක් වූ ප්‍රදර්ශන පුවරු
- කතුවරයාගේ ඡායාරූපයක්
- කතුවරයා විසින් රචිත සෙසු නවකතා පොත්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නවකතාව නම් සාහිත්‍යාංගය හඳුනා ගෙන විස්තර කිරීම
- නවකතාව ගද්‍ය සාහිත්‍යයේ සුවිශේෂ අංගයක් බව අවබෝධ කර ගෙන ප්‍රකාශ කිරීම
- අඹ යහළුවෝ නවකතාව සමාජ විද්‍යාත්මක නවකතා ගණයට අයත් වන බව හඳුනා ගනිමින් සාකච්ඡා කිරීම
- අඹ යහළුවෝ නවකතාවේ චරිත නිරූපණය අධ්‍යයනය කර අභියෝගවලට මුහුණ දීමේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විස්තර කිරීම
- අඹ යහළුවෝ නවකතාවේ මූලික ලක්ෂණ හඳුනා ගනිමින් විචාරය කිරීම
- නවකතාවේ භාෂා භාවිතය අගයමින් විචාරයට ලක් කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- කල්පනා ලෝකය - එදිරිවීර සරච්චන්ද්‍ර
- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර

ඇමුණුම 1

| | | |
|---|---|---|
| තිමල් | පියා: | මුතුමාලේ වලව්වේ මුතුබණ්ඩා (ගල්බණ්ඩා) |
| | මව: | රණ්මැණිකා |
| | අක්කා: | අමිතා |
| | නංගී: | ලීලා ඇතුළු සහෝදර සහෝදරියන් හය දෙනෙක් |
| සුනිල් (සුදූඅප්පො) | පියා: | නෙළුම්ගම නෙළුම් බණ්ඩාර |
| | මව: | නෙළුම් කුමාරිහාමි |
| | සහෝදරිය : | මෛත්‍රී |
| | අත්තම්මා : | මහ කුමාරිහාමි |
| | සේවිකාවන්: | I පළිගුමැණිකා |
| | | II සිසිලියා |
| | සේවකයා : | මුදලිහාමි |

කැන්දලන්දේ, ආරියදාස, ජේම්ස්, වී.ඇම්. වීරවික්‍රම පෙරකදෝරු, ආදිය සෙසු චරිත වේ

සුනිල්

දස හැවිරිදි සුනිල් බොකුටු කොණ්ඩයක් ඇති අයෙකි. එය වමට බෙදා පීරයි. තලඑළලු ඔහුගේ නළල් තලය පළල් ය. පිරිසිදුව අඳින පළඳින ඔහු කාරුණික ය. තර්කානුකූල ව ප්‍රශ්න තේරුම් ගනියි. ජීවිතය පිළිබඳ පැන නගින ඕනෑ ම ප්‍රශ්නයක් ඔහු තර්කානුකූල ව තේරුම් ගැනීමටත් අනිත් අයට පැහැදිලි කිරීමටත් සමත් අයෙකි. සුනිල්ගේ මව 30 හැවිරිදි ය. ඇය ද තලඑළලු ය. හීන්දැරි ය, උස ය, ඔසරිය සහ හැට්ටය අඳියි. පියා උසාවි කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු ය. කාරයෙන් කන්තෝරුවට යන ඔහු 40 හැවිරිදි තරබාරු පුරුෂයෙකි. මුහුණ රවුම් ය. බර බැල්මකින් යුතු ය. ඇස් තරමක්

මහත් ය. පළල් නළල් තලයක් ඇති ඔහු ද කෙස් වමින් බෙදා පීරයි. හිස් මුදුණේ කෙස් අඩු ය. සේවයට යාමේ දී සුදු කමිසයත් දුඹුරු කලිසමත් අඳියි. මෛත්‍රී ඇය ද තරබාරු ය. අත්තම්මා මහකුමාරිහාමි ය. ඇය ද හැඩවැඩ ඇත්තී ය. තරබාරු ය. මුහුණ රවුම් ය. හිසකෙස් සුදු ය. මුහුණේ සැරපරුෂ ය මාන්නක්කාරය කර්ණ කටුක කටෝර භාෂා විලාසයක් ඇත්තී ය.

සුනිල්

නෙළුම්පුර ගැමුණු විද්‍යාලයේ 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. නුවර පදිංචියට යාමෙන් අනතුරුව නුවර වසන්ත පාසලේ ඉගෙනුම ලබයි. අනතුරුව පියාට එල්ල වන බරපතල චෝදනාවත් සමග ආපසු ගමට එන සුනිල් නෙළුම් පුර ගැමුණු විද්‍යාලයට ඇතුළු වෙයි.

නිමල්ගේ හොඳ ම මිතුරා වන සුනිල් තම පවුලේ මව්පියන්ගේ සහ විශේෂයෙන් අත්තම්මාගේ අඩත්තේට්ටම්වලට අසු වන නිමල් බේරා ගැනීමට සහ ඔහුට උදවු උපකාර කිරීමට උත්සුක වෙයි. තමාගේ දියුණුවට වඩා නිමල්ගේ දියුණුව අපේක්ෂා කළ කලණ මිතුරකු වශයෙන් සුනිල් හැඳින්විය හැකි ය.

## ක්‍රියාකාරකම 22
## පද්‍ය නිර්මාණය

**නිපුණතාව** : 9.0 අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල** :
- අත්දැකීම් ප්‍රකාශනයට පද්‍ය නිර්මාණ යොදා ගත හැකි බව විස්තර කරයි.
- පද්‍ය නිර්මාණයට යොදා ගත හැකි අත්දැකීම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අත්දැකීම් පාදක කරගෙන පද්‍ය නිර්මාණයේ යෙදෙයි.
- පද්‍ය රචනයේ දී භාෂාව නිර්මාණාත්මක ව යොදා ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- ක්‍රියාකාරකමට අදාළ විෂය අන්තර්ගතය අධ්‍යයනය කර නියමිත කාලච්ඡේදවලට බෙදා සැලසුම් කර ගන්න.

  1, 2 කාලච්ඡේද - පද්‍යයක් යනු කුමක් දැයි නිදසුන් අධ්‍යයනය කරමින් සරල ව හඳුනා ගැනීම

  3, 4 කාලච්ඡේද - පද්‍ය නිර්මාණයකට අත්දැකීමක් පාදක වන ආකාරය සහ ඒවා ප්‍රතිනිර්මාණය කරන්නේ කෙසේ දැයි නිදසුන් සහිත ව පැහැදිලි කිරීම

  5, 6 කාලච්ඡේද - පද්‍ය නිර්මාණකරණයේ යෙදීම
- අවශ්‍ය ඉගෙනුම් ආධාරක සකස් කර ගන්න.
- විවිධ තේමා හා විරිත් අනුව රචනා කළ පද්‍ය නිර්මාණ කීපයක් එක් රැස් කර ගන්න.
- එම පද්‍ය නිර්මාණවල විශේෂතා අධ්‍යයනය කරන්න.

**ප්‍රවේශය**

- **පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.**
  * ප්‍රතිභාපූර්ණ කවියකුගේ නිර්මාණකරණයේ ආධුනික අවධිය පිළිබඳව කියවෙන චරිතාපදාන කොටසක් ඉදිරිපත් කිරීම
  * පද්‍ය නිර්මාණයක් රසවත් ව ගායනා කිරීම

**පාඩම සංවර්ධනය**

- පද්‍ය නිර්මාණ කිහිපයක් තාලානුරූප ව ගායනා කරන්න. මේ සඳහා ගායන හැකියා ඇති ශිෂ්‍යයන් යොදා ගන්න.
- ඇමුණුම 1, 2හි අභ්‍යාස සහ ඊට සමාන ව නිර්මාණය කර ගත් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- පද්‍යකරණය සඳහා යොදා ගැනෙන සරල සුලබ විරිත් කිහිපයක් හඳුන්වා දෙන්න.
- තෝරා ගත් පද්‍ය නිර්මාණ කිහිපයක තේමා පිළිබඳ සාකච්ඡා කරන්න.
- පද්‍ය නිර්මාණකරණය සඳහා සුදුසු තේමා තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- තෝරා ගත් තේමා පදනම් කරගෙන පද්‍යකරණයේ යෙදීමට අවස්ථාව සලසා දෙන්න.
- පද්‍යයක් යනු කුමක් දැයි ඉතා සරල ව පැහැදිලි කිරීමේ අවස්ථාව ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- සිසුන්ගේ නිර්මාණ ඇතුළත් නිර්මාණ සංග්‍රහයක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- තෝරාගත් නිර්මාණ කිහිපයක් බිත්ති පුවත් පතේ ප්‍රදර්ශනය කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ විරිත් හා විවිධ අත්දැකීම් පාදක කරගත් පද්‍ය නිර්මාණ කිහිපයක්
- පටිගත කරගත් පද්‍ය ගායනා කිහිපයක්
- පැවරුම් පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- අත්දැකීම් ප්‍රකාශනයට පද්‍ය නිර්මාණ යොදා ගත හැකි ආකාරය විස්තර කිරීම
- පද්‍ය නිර්මාණය සඳහා උචිත අත්දැකීම් තෝරා ගැනීම
- අත්දැකීම් පාදක කර ගෙන පද්‍ය නිර්මාණය කිරීම
- පද්‍ය රචනයේ දී භාෂාව රසවත් ලෙස යොදා ගැනීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ප්‍රබන්ධෝපදේශය, - කුමාරතුංග මුනිදාස
- ප්‍රබන්ධ සංග්‍රහය, - කුමාරතුංග මුනිදාස
- නිර්මාණ අධ්‍යයනය, - සරත් විජේසූරිය

**ඇමුණුම 1 :**

පහත කවියේ අග පද දෙක සම්පූර්ණ කරන්න.

නෙළුම් පතක සිසිල　　අරා
පිනිබිඳු යයි විසිර　　පුරා
.........................................................
.........................................................

**ඇමුණුම 2 :**

පහත කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.

.........................................................................
.........................................................................
සෙනෙහස දයා පිරි ආදර යහ ගුණෙනි
දෙරණත සියලු සත්වග සුරකිමු නිතිනි

## ක්‍රියාකාරකම 23
## නිර්මාණාත්මක කතා රචනය

**නිපුණතාව** : 9.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.2 නිර්මාණාත්මක කතා රචනා කරයි.

**කාලච්ඡේද** : 06 යි

**ඉගෙනුම් පල** :
- නිර්මාණාත්මක කතා රචනය සඳහා සුදුසු තේමා තෝරා ගනියි.
- තෝරා ගත් තේමා ඇසුරෙන් නිර්මාණාත්මක කතා රචනා කරයි.
- භාෂාව නිර්මාණාත්මක ව භාවිත කරමින් ප්‍රබන්ධ රචනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම**

- නියමිත විෂය අන්තර්ගතය අධ්‍යයනය කරන්න.
- කාලච්ඡේද ප්‍රමාණය තීරණය කරන්න.

  1, 2 කාලච්ඡේද - * විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස නිර්මාණකරණයේ වැදගත්කම අවබෝධ කර ගැනීම.
  
  * අන්‍යෝන්‍ය සන්නිවේදන කාර්යය සඳහා නිර්මාණකරණයේ වැදගත්කම අවබෝධ කර ගැනීම.

  3, 4 කාලච්ඡේද- * නිර්මාණාත්මක කතා ගොඩනැංවීමේ දී සුදුසු වස්තු විෂය තෝරා ගැනීම පිළිබඳ අවබෝධ කර ගැනීම හා එකී වස්තු විෂය පාදක කර ගනිමින් නිර්මාණාත්මක කතා රචනයේ යෙදීමට උපදෙස් ලබා දීම.

  5, 6 කාලච්ඡේද - * නිර්මාණාත්මක කතා රචනයේ යෙදීම.
  
  * නියමිත ඇමුණුම්වල ඇති අභ්‍යාසවල යෙදීම.

- විවිධ ලේඛකයන්ගේ ප්‍රබන්ධ කිහිපයක් එක් රැස් කර ගන්න.
- එම ප්‍රබන්ධවල පවතින විශේෂ ලක්ෂණ අධ්‍යයනය කරන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් කර තෝරා ගත් මාතෘකා යටතේ නිර්මාණ කාර්යයෙහි යොදවන්න.
- සුදුසු ඉගෙනුම් ආධාරක සකස් කර ගන්න.

  උදා: - විවිධ ලේඛකයන්ගේ කෙටි ප්‍රබන්ධ කතා කිහිපයක්
  
  පැවරුම් පත්‍රිකා ආදිය

**ප්‍රවේශය**

- **පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.**
  * නිර්මාණාත්මක කතාවක් ශ්‍රවණය කිරීමට සැලැස්වීම
  * නිර්මාණාත්මක කතා රචනා කළ ලේඛකයන් ගැන විමසීම
  * නිර්මාණාත්මක කතාවක් යනු කුමක් දැයි විමසීම

**පාඩම සංවර්ධනය**

- කුමාරතුංග මුනිදාසයන්ගේ ප්‍රබන්ධ සංග්‍රහයේ එන ප්‍රබන්ධ කතාවක් ඉදිරිපත් කරන්න.
- නිර්මාණකරණයට අදාළ උපදෙස් කිහිපයක් ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කළ කතාවට අදාළ තේමාව පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන්ට ද ප්‍රබන්ධ නිර්මාණයෙහි ලා සුදුසු තේමා තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 1 හා 2 යොදා ගනිමින් නිර්මාණාත්මක කතා රචනා කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කරන නිර්මාණාත්මක කතා ඇගයුමට ලක් කර සංවර්ධනය විය යුතු අවස්ථා පෙන්වා දෙන්න.
- සුදුසු ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම අනෙකුත් විෂය අධ්‍යයනයට ද පහසුවක් වන බව පෙන්වා දෙන්න.
- විෂය සමගාමී ක්‍රියාකාරකම්වල දී නිර්මාණාත්මක ප්‍රබන්ධ වැදගත් වන බව පහදන්න.
- අදාළ ශිෂ්‍ය නිර්මාණ එකතු කර නිර්මාණ සංග්‍රහයක් සකස් කිරීමට යොමු කරන්න.
- තෝරාගත් නිර්මාණ පිරිවෙන් බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනයට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- තෝරාගත් ප්‍රබන්ධ කතා කිහිපයක්
- නිර්මාණකරණයේ දී අවධානය යොමු විය යුතු කරුණු ඇතුළත් කුඩා පත්‍රිකාවක්
- ඇමුණුම 1, 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නිර්මාණකරණයේ මූලික ලක්ෂණ අවබෝධ කර ගනිමින් භාවිත කිරීම
- නිර්මාණාත්මක කතා රචනය සඳහා සුදුසු තේමා හඳුනා ගනිමින් ඉදිරිපත් කිරීම
- නිර්මාණකරණයේ යෙදෙමින් නිර්මාණාත්මක හැකියා ප්‍රදර්ශනය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ප්‍රබන්ධ සංග්‍රහය - කුමාරතුංග මුනිදාස
- ප්‍රබන්ධෝපදේශය - කුමාරතුංග මුනිදාස

**ඇමුණුම 1**

පහත වාක්‍ය සුදුසු පරිදි පිළිවෙළකට ගළපා කතාවක් ගොඩනගන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

1. එක දවසක් හිවලෙක් පිපාසයෙන් වතුර සොයාගෙන කැලේ පුරාම ඇවිද්දා.
2. ඒ ළඟින් ගිය එළුවෙක් ළිඳට එබිල බලලා, තමන්ගෙ පිපාසයත් සංසිඳුවා ගන්න හිතුවා.
3. එළුවා ළිඳට පැන්නට පස්සෙ හිවලා කීව, මට ළිඳෙන් ගොඩ එන්න උදවු කරන්න කියලා.
4. ඇවිදින කොට පාලු ළිඳකට වැටිලා ඒකෙ තිබුණු වතුර බීලා පිපාසය සංසිඳුවා ගත්තා.
5. ඇතුළෙ හිටපු හිවලත් වතුර බොන්න ළිඳට පනින්න කියලා එළුවට කිව්වා.
6. එළුවත් පොරොන්දු වෙලා වතුර බීලා තමන්ගෙ පිටට නැගලා උඩට ගොඩවෙන්න හිවලට උදවු කළා.
7. ළිඳ ගැඹුරු නිසා එළුවට ගොඩට එන්න බැරුව ළිඳ ඇතුළේ ම මරණයට පත්වුණා.
8. ළිඳෙන් ගොඩට ආපු හිවලා 'එහෙනම් යාළුවෙ මම ගිහින් එන්නම්' කියලා යන්න ගියා.
9. ඊට පස්සෙ එළුවට ළිඳෙන් ගොඩ එන්න බැරුව කල්පනා කර කර හිටියා.

**ඇමුණුම 2**

සමනුයි අංජනයි ඔසඳයි නුවනුයි හොඳ ම යාළුවො. දවසක් මේ හතර දෙනා අම්මලාටත් කියලා ළඟ තිබුණු පුංචි වනරොදට ඇවිදින්න ගියා. ඔහොම ඇවිදගෙන යන විට නො දැනීම මහ වනය මැදට ගමන් කළා. ටික දුරක් යන කොට වනාන්තරය මැදින් නුහුරු ශබ්දයක් ඇහුණා. ඒ ශබ්දය ඇසුණු පැත්තට යද්දී අමුතුම ආකාරයේ යානයක් බිම තිබුණා ..................................................................
..................................................................................................................................................................

- ඉතිරි කොටස නිර්මාණාත්මක ව ගොඩනගා කතාව සම්පූර්ණ කරන්න.
- සුදුසු මාතෘකාවක් ද යොදන්න.

# ක්‍රියාකාරකම 24
# නිර්මාණවලට සවන්දීම

**නිපුණතාව** : 10.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.1 විවිධ නිර්මාණවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.

**කාලච්ඡේද** : 07 යි

**ඉගෙනුම් පල** :
- කරුණු මතකයේ රඳවා ගනිමින් ප්‍රකාශනයකට සවන් දෙයි.
- ප්‍රකාශනයේ අන්තර්ගතය නිවැරදි ව හඳුනා ගනිමින් ප්‍රකාශ කරයි.
- ප්‍රකාශනයකට අවධානයෙන් සවන් දී කරුණු නිවැරදි ව ප්‍රකාශ කරයි.
- සවන් දෙන ලද ප්‍රකාශනය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම :**

- ශිෂ්‍යයන්ට කියාදීමට සුදුසු සරල කතන්දර කිහිපයක් සූදානම් කර ගන්න. (ජනකතා, ජාතක කතා, ඓතිහාසික කතා, උපහාස කතා, විශේෂ කතා)

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  - * රසවත් කතන්දරයක ඡේදයක් ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීමට සැලැස්වීම.
  - * පන්තියේ ශිෂ්‍යයකුට තමා දන්නා කතාන්දරයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.

**පාඩම් සංවර්ධනය :**

- පන්තියේ ශිෂ්‍යයන් යුගල වශයෙන් කණ්ඩායම් වී එකිනෙකාට සරල කතන්දර පැවසීමටත් ඒ කතන්දර ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමටත් අවස්ථාව සලසන්න.
- අඹ යහළුවෝ හෝ වෙනත් සරල බසින් ලියවුණු පොතක කොටස් කියවා ප්‍රශ්න ඇසීමටත් පිළිතුරු ලබා දීමටත් ශිෂ්‍යයන්ට අවස්ථාව සලසන්න.
- විවිධ සාහිත්‍ය නිර්මාණවලට සවන් දී එහි තේමාව පැවසීමටත් අදහස් ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
- සාහිත්‍ය නිර්මාණවලට සවන් දී ලබා දෙන පිළිතුරු අනුව සහ පහත සඳහන් නිර්ණායක අනුව තක්සේරුව හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- තෝරා ගත් කතාන්දර කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ප්‍රකාශනයකට සවන් දීමේ දී සැලකිය යුතු කරුණු නිවැරදි ව ප්‍රකාශ කිරීම
- නියමිත ගුණාංග අනුගමනය කරමින් ප්‍රකාශනයකට සවන් දීම
- ප්‍රකාශනයේ අන්තර්ගතය මතකයෙන් නිවැරදි ව ප්‍රකාශ කිරීම
- සවන් දෙන ලද ප්‍රකාශනය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දීම

## ක්‍රියාකාරකම 25
## ආචාරශීලී සවන්දීම

**නිපුණතාව** : 10.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.2 විවිධ නිර්මාණ හා ප්‍රකාශනයන්ට සවන් දී ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** : 03 යි

**ඉගෙනුම් පල** :
- ආචාරශීලීව සවන් දීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු ප්‍රකාශ කරයි.
- සංයමයෙන් යුතු ව සවන් දෙයි.
- උචිත අවස්ථාවල ආචාරශීලී ව ප්‍රතිචාර දක්වයි.
- ආචාරශීලී ලෙස අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම :**

- සුභාෂිතයේ නිර්දිෂ්ට පද්‍ය කිහිපයක් පටිගත කර හෝ සම්පත් දායකයෙකු ලවා සජීවීව ගායනය කර ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීමට සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  - * පටිගත කරන ලද සුභාෂිතයේ කවියක් ශ්‍රවණය කිරීමකට සැලැස්වීම
  - * ශිෂ්‍යයෙකු හෝ සම්පත් දායකයෙකු ලවා සුභාෂිතයේ කවි ගායනා කරවීම

**පාඩම සංවර්ධනය :**

- ආචාරශීලී ව සවන් දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න. (ඇමුණුම 01)
- ආචාරශීලී බව යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර එක් එක් කණ්ඩායම් අතර සුභාෂිතයේ නිර්දිෂ්ට කවි බෙදා දෙන්න.
- එම කවි ගායනා කිරීමට එක් එක් කණ්ඩායමට අවස්ථාව ලබා දී සෙසු කණ්ඩායම්වලට සවන් දීමට සලස්වන්න.
- තමන් සවන් දුන් කවි ඇසුරෙන් ප්‍රශ්න නගමින් සාකච්ඡා කිරීමටත් කවිවල අර්ථය පැහැදිලි කර ගැනීමටත් අවස්ථාව ලබා දෙන්න.
- වෙනත් (නිර්දිෂ්ට නොවන) සාහිත්‍ය නිර්මාණ කිහිපයක් ද ශිෂ්‍යයන් අතර බෙදා දී ඒවා ද ශ්‍රවණයෙන් රසවිඳීමට අවස්ථාව ලබා දෙන්න.
- තමන් රසවිඳි නිර්මාණ පිළිබඳ කෙටි අදහස් දැක්වීමකට ඒ ඒ කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් ඇසුරෙන් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- නිර්දිෂ්ට කවිවලට සංයමයෙන් යුතු ව සවන් දෙයි.
- පද්‍ය ගායනා කරමින් රස විඳියි.
- සවන් දී ප්‍රශ්න නගයි.
- ශ්‍රවණය කරන ලද නිර්මාණ පිළිබඳ අදහස් දක්වයි.

**ඇමුණුම** 01

ආචාරශීලී ව සවන් දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු.

* අවධානයෙන් සවන් දීම
* සංයමයෙන් යුතු ව සවන් දීම
* අන් අයට බාධා නොකිරීම
* කාය සංවරය පවත්වා ගැනීම
* උචිත අවස්ථාවල ආචාරශීලී ලෙස ප්‍රතිචාර දැක්වීම

## ක්‍රියාකාරකම 26
## විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන්දීම

**නිපුණතාව** : 10.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.4 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි.

10.5 දේශන සාකච්ඡා ආදියට සවන් දීමේ පුරුද්ද මගින් විචාරශීලී ව භාෂාව හැසිරවීමේ කුසලතාව ලබා ගනියි.

10.6 විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 09 යි

**ඉගෙනුම් පල** :
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී රසමුසු තැන් ප්‍රකාශ කරයි.
- ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශනයකට සවන් දී ප්‍රධාන කරුණු ඉදිරිපත් කරයි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලින් උකහා ගත් කරුණු අන් අය සමග බෙදා ගනියි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී එහි ඇතුළත් කරුණු පිළිබඳ සාකච්ඡා කරයි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමෙන් ලත් පරිචය ඇසුරෙන් විවිධ භාෂා කාර්යයන් සිදු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම :**

- ශිෂ්‍යයන්ට පෙන්වීම සඳහා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් කිහිපයක් (නාට්‍ය, සංවාද, ප්‍රවෘත්ති, නිවේදන) සූදානම් කර ගන්න.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීම සඳහා අවශ්‍ය උපකරණ සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  - * කෙටි ගුවන් විදුලි නාට්‍යයක් ශ්‍රවණය කිරීමට සැලැස්වීම.
  - * පටිගත කරන ලද ගුවන් විදුලි ප්‍රවෘත්ති විකාශයකට සවන් දීමට සැලැස්වීම.

**පාඩම සංවර්ධනය :**

- සවන් දුන් වෙනත් ගුවන් විදුලි වැඩසටහන් මොනවාදැයි විමසන්න.
- විවිධ ගුවන් විදුලි වැඩසටහන් එක් එක් තේමා යටතේ පෙළ ගස්වන්න.
- සවන් දෙන ලද එක් එක් ගුවන් විදුලි වැඩසටහනෙන් උකහා ගත් කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.

- ඉගෙන ගත් කරුණු එකිනෙකා සමග බෙදා ගැනීමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් ප්‍රවෘත්ති හා නිවේදන කියවීම, සංවාද හා සාකච්ඡා පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් පුහුණු වීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ආදර්ශන ඇසුරෙන් එක් එක් ක්‍රියාකාරකම් වෙන වෙන ම පුහුණු කරවන්න.
- ප්‍රවෘත්ති හා නිවේදන කේවල ව ඉදිරිපත් කිරීමටත් සංවාද හා සාකච්ඡා කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක ඉවහල් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පටිගත කරන ලද ගුවන් විදුලි නාට්‍ය, ප්‍රවෘත්ති නිවේදන, සංවාද ඇතුළත් හඬ පට

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විවිධ තේමා යටතේ විකාශනය වන ගුවන් විදුලි වැඩසටහන්වලට සවන් දීම
- සවන් දෙන ලද වැඩසටහන්වල ප්‍රධාන කරුණු ඉදිරිපත් කිරීම
- තමා දනගත් හා රසවිඳි කරුණු අන් අය සමග සාකච්ඡා කිරීම
- ප්‍රවෘත්ති හා නිවේදන සවන් දීමෙන් ලත් පරිචය ඇසුරෙන් ප්‍රවෘත්ති/නිවේදන ඉදිරිපත් කිරීමට හුරු වීම.
- තමා සවන් දුන් සංවාද සාකච්ඡා ඇසුරෙන් සංවාද සාකච්ඡා පැවැත්වීමට ඉදිරිපත් වීම.

## ක්‍රියාකාරකම 27
## කථන පුහුණු අවස්ථා

**නිපුණතාව** : 11.0 තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.
11.2 කරුණු සංවිධානය කර ගනිමින් නිරවුල් ව හා පැහැදිලි ව කථනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 09 යි

**ඉගෙනුම් පල** :
- නිවැරදි උච්චාරණයෙන් යුතු ව කතා කරයි.
- සබකෝලයෙන් තොර ව තම අදහස් ඉදිරිපත් කරයි.
- මාතෘකානුකූල ව කතාව ඉදිරිපත් කරයි.
- විවිධ කථන අවස්ථා හඳුනා ගනිමින් පුහුණුව ලබයි.
- මනා පෞරුෂයකින් යුතු ව කථනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම :**
- කථන කුසලතා ඉස්මතු කළ හැකි අවස්ථා හඳුනා ගෙන පෙළගස්වන්න.
- ශිෂ්‍යයාට ගැළපෙන ආකාරයට මාතෘකා කිහිපයක් තෝරා ගෙන එයට අදාළ ව කරුණු රැස් කර ගන්න.
- මාතෘකාවකට අදාළ ව කතාවක් ඉදිරිපත් කිරීමේ දී අවශ්‍ය කරුණු ගොනු කර ගන්න.
- මාතෘකාවකට අදාළ ව ප්‍රමාණවත් කරුණු රැස්කර ගැනීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- කතාවක් සැලසුම් කරගන්නා ආකාරය කාල කළමනාකරණය, මාතෘකාවට අදාළ ව අදහස් ගොනු කිරීම ආදිය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

**ප්‍රවේශය :**
- පහත ආකාරයේ ප්‍රවේශයක් යොදා ගන්න.
  - * පටිගත කරන ලද කතාවක් ශ්‍රවණයට හෝ නැරඹීමට සැලැස්වීම
  - * කථන කුසලතා සහිත ශිෂ්‍යයෙකු ලවා කතාවක් ඉදිරිපත් කිරීම
  - * ආරාධිත දේශකයෙකුගේ දේශනයකට සවන් දීමට සැලැස්වීම

**පාඩම සංවර්ධනය :**
- පෙර සකසා ගත් කථන මාතෘකා ලබා දී කථාවක් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් සූදානම් කරන්න.
- කථන කුසලතා සංවර්ධනය කළ හැකි අවස්ථා පිළිබඳව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- එබඳු අවස්ථාවල දී ඉදිරිපත් කළ හැකි කථන අවස්ථා මොනවා දැයි පැහැදිලි කරන්න.

- ඒ ඒ මාතෘකාවට අදාළ ව සුවිශේෂ කරුණු ඇතුළත් පත්‍රිකා ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- කථනයේ දී සැලිකිලිමත් විය යුතු කරුණු කෙරේ අවධානය යොමු කරන්න. (ඇමුණුම 1)
- මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කිරීම. කාලය කළමනාකරණය කිරීම කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.
- හඳුනා ගත් විවිධ කථන අවස්ථා සඳහා ශිෂ්‍ය ක්‍රියාකාරකම් ප්‍රායෝගික ව ඉදිරිපත් කරන්න.
- උදය රැස්වීම් අවස්ථාවේ දී මාතෘකාවකට අදාළ ව කතාවක් පැවැත්වීමට අවස්ථා ලබා දෙන්න.
- සාහිත්‍ය රැස්වීම්වල දී කතා පැවැත්වීම කළ යුතු අයුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් කතා පැවැත්වීමට අවස්ථාව ලබා දෙන්න.
- මාතෘකාවකට අදාළ ව ක්ෂණික කතාවක් පැවැත්වීමට අවස්ථාව ලබා දෙන්න.
- ක්ෂණික කතාව අවසානයේ ශිෂ්‍ය තක්සේරුව සිදු කරමින් ඔවුන් ප්‍රතිපෝෂණය සිදු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ දේශකයන් කිහිප දෙනෙකුගේ හඬ පට
- දක්ෂ කථික ශිෂ්‍යයෙක්
- DVD/CD යන්ත්‍රයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- මාතෘකාවකට අදාළ ව උචිත අභිනය දක්වමින් කතාවක් කිරීම
- නියමිත අංග චලන භාවිත කරමින් හා ශ්‍රාවක අවධානය දිනා ගනිමින් කතා කිරීම
- තර්කානුකූල ව අදහස් ඉදිරිපත් කරමින් පැහැදිලි ව කතාව පැවැත්වීම
- අවස්ථාවෝචිත ව හඬ පාලනය කරමින් කතාව ඉදිරිපත් කිරීම

**ඇමුණුම 01**

කථනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- කතාවේ ආරම්භය, මධ්‍ය හා අවසානය මනාව සැලසුම් කිරීම
- ආකර්ෂණීය ප්‍රවේශය
- තර්කානුකූල ව කරුණු භාවිතය
- අවස්ථාවට ගැළපෙන ලෙස කතා කිරීම
- ශ්‍රාවක පිරිස පිළිබඳ අවබෝධයකින් යුතු ව කතා කිරීම
- කාලය පිළිබඳ සැලකිලිමත් වීම
- උචිත හා ගැළපෙන වචන, ආමන්ත්‍රණ හා යෙදුම් භාවිතය
- සංයමයෙන් යුතු ව කතාව පැවැත්වීම
- නිසි හඬ පාලනය හා උචිත අංග චලන භාවිතය

## ක්‍රියාකාරකම 28
## දේශාභිමානී කලා නිර්මාණ පරිශීලනය

**නිපුණතාව** : 12.0 භාෂා භාවිතය මගින් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම** : 12.1 සංස්කෘතික උරුමය හා හර පද්ධතීන්වල අගය හා වටිනාකම පිළිබඳව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

**කාලච්ඡේද** : 15 යි

**ඉගෙනුම් පල** :
- දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ශ්‍රවණය කරයි.
- අපේ ජාතික උරුමය අගය කරමින් අදහස් දක්වයි.
- දේශාභිමානී හැඟීම් චරිතායනය කර ගනියි.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පෙර සූදානම :**
- ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීමට සැලැස්වීම සඳහා දේශාභිමානී ගීත කිහිපයක් සූදානම් කර ගන්න.
- දේශාභිමානී හැඟීම් දනවන කතාන්දර ඓතිහාසික කතා සහ චරිත කතා කිහිපයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**
- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  - * දේශාභිමානී ගීයක් ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීමට සැලැස්වීම
  - * ජාතික වීරයකු පිළිබඳ චරිත කතාවක් කෙටියෙන් ඉදිරිපත් කිරීම
  - * දේශාභිමානී හැඟීම් දනවන කතාන්දරයක් ඉදිරිපත් කිරීම

**පාඩම සංවර්ධනය :**
- ප්‍රවේශයේ දී ශ්‍රවණය කරන ලද ගීතය, චරිත කතාව හෝ කතාන්දරය ඇසුරෙන් සාකච්ඡාවක් ගොඩනගන්න.
- අපගේ සංස්කෘතික උරුමය හා හර පද්ධති ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම හා අවශ්‍යතාව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ඒ වෙනුවෙන් ඇප කැප වී කටයුතු කළ අතීත විරුවන් හා ජන නායකයන් පිළිබඳ සිහිපත් කරන්න.
- එවන් අතීත විරුවන් ගැන තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- දේශාභිමානී ගීතයක්, කවියක් හෝ කතාවක් කියවා ඒ පිළිබඳ පන්තියේ දී අදහස් දැක්වීම සඳහා ශිෂ්‍යයන්ට පැවරුමක් ලබා දෙන්න.

- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් ඇගයීමට ලක් කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- දේශාභිමානී ගීත, කවි,
- ජාතික විරුවන් හා ජන නායකයන් පිළිබඳ කතාන්දර, චරිත කතා

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- දේශාභිමානී කවි, ගීතවලට සවන් දී අදහස් දැක්වීම.
- අතීත විරුවන් හා ජන නායකයන් පිළිබඳ කතන්දර කියවා අගය කිරීම.
- දේශාභිමානය දනවන කලා නිර්මාණ එක් රැස් කිරීමට පෙළඹීම.
- සංස්කෘතික උරුමය පිළිබඳ අවබෝධයෙන් යුතු ව එදිනෙදා කටයුතුවල නිරත වීම.